
# නිවනේ නිවීම

## තෙවන වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

<u>ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ</u>

# <u>පොදු පුණ්‍යානුමෝදනාව</u>

<u>"මහණෙනි, ආමිස දානයය, ධර්ම දානයය, යන මේ දන් දෙකෙකි. මේ දන් දෙක අතුරෙන් **මෙයම අග්‍රය - එනම්, ධර්ම දානය."**</u>

මේ අසිරිමත් බුදුවදන අගය කරන බොහෝ පාඨකයින් තම පරලෝ සැපත් මවුපියාදී ඥාතීන්ට කෘතගුණපූර්වකව පින් අනුමෝදන් කරවීමේ චිරාගත චාරිත්‍රයට අනුව ලොකු කුඩා පරිත්‍යාග පිරිනමන බැවින් දෙස් - විදෙස් වැසි ගිහි - පැවිදි දහම් පිපාසිත විශාල පිරිසකට අමිල දහම් අමාපැන් නොමිලයේ බෙදාදෙන <u>**ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය**</u> පුණ්‍යානුමෝදනා වශයෙන් එම ධර්ම දානමය කුශලය එකී පින්වතුන්ට හා ඥාතීන්ටත් මෙම 'අමාගඟ' නොසිඳී ගලායාමට නිරතුරුව කාලය, ධනය, ශ්‍රමය වැයකරන සැමටත් පරම ශාන්ත උතුම් අමාමහ නිවනින් සැනසීමට උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතන බව දන්වා සිටිමු.

මෙයට,

සසුන් ලැදි

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය.

# නිවනේ නිවීම
## (දෙසුම් පෙළකි)

තෙවන වෙළුම - තෙවන මුද්‍රණය

( 7-9 දෙසුම් )

කටුකුරුන්දේ ඤාණනන්ද හිමි

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර
දේවාලේගම

**ප්‍රකාශනය**
ධම් ග්‍රන්ථ මුද්‍රණ භාරය
මහාභාරකාර දෙපාර්තමේන්තුව

**2002**

ධර්මදානයකි

මුදලට විකිණීම සඳහා නොවේ.

ප්‍රථම මුද්‍රණය - 1997 ජූනි
දෙවන මුද්‍රණය - 1999 මාර්තු
තෙවන මුද්‍රණය - 2000 ජූනි
සිවුවන මුද්‍රණය - 2003 ඔක්තෝබර්
පස්වන මුද්‍රණය - 2007 ජනවාරි

## පොත ලබාගත හැකි ස්ථාන

. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

. රෝයල් ඉන්ස්ටිටියුට්,
191, හැව්ලොක් පාර,
කොළඹ 5.

. ඩී. ටී. වේරගල මහතා
422, වැලිපාර, තලවතුගොඩ.

. අනුර රූපසිංහ මහතා
අංක 27, කොළඹ වීදිය, මහනුවර.

i. මහා භාරකාර දෙපාර්තමේන්තුව
2, බුලර්ස් පටුමග,
කොළඹ 07.

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්‍යවත් කළ

මිතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

**මාතර ශ්‍රී ඥානාරාමාභිධාන**

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

**'නිවනේ නිවීම'**

පූජෝපහාරයක්ම වේවා!

එතං සන්තං

එතං පණීතං

යදිදං

සබ්බ සංඛාර සමථො

සබ්බූපධිපටිනිස්සග්ගො

තණ්හක්ඛයො

විරාගො

නිරොධො

නිබ්බානං

"මෙය ශාන්තය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අතහැර දැමීම

තණ්හාව ක්ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය"

# පටුන


| | පිටු |
|---|---|
| හැඳින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | x |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය | xi |
| අමා ගඟ | xii |
| ග්‍රන්ථ සංකේත නිරූපණය | xiv |
| 'නිවනේ නිවීම' - 7 | 1 |
| 'නිවනේ නිවීම' - 8 | 25 |
| 'නිවනේ නිවීම' - 9 | 51 |

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මඟ හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කම්සථානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයයි. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නෑ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12-1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනක වැඩ විසූ එක් අවස්ථාවක, මාහිමිපාණන් වහන්සේ මුල'සුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැනනැඟුනු

ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මග හැරුණි. ඒ බැව් සැළවූ විට, නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ. අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් 33 කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙකින්හුදු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොවිසිරෙන අයුරින් මුතු ඇට පෙළක් නූලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටළුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වෙතොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරැයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන්

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society, P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර

වන සේක්වා! ඒ දුර්ලභ ගුරු ඇසුර ලබාගැනීමට මහපැදූ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්යය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හඳුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සම්සුණ්‍ණ ශ්‍රද්ධා ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩවීරියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනෙත්ත යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩඩ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන ඩී. එච්. පී. මුණසිංහ සහ සමාගමේ කාර්යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්මය මිල කිරීමකින් තොරව ධර්මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වැටහුණෙන් දෙසුම් 3 බැගින් වෙළුම් 11 ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් කිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවසථාව සැලසෙන අතරම ධර්මදානමය පුණ්‍ය කර්මයට බොහෝදෙනාගේ සහභාගිත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය නවමත් ශ්‍රද්ධාසමු අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, "නිවනේ නිවීම" වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමග උපමා ඉඟිවැලක් හා ගාථා ඉඟිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර කැන්පත් වූ. මාපා මහතාට මෙම ධර්මදානමය කුශලය ස්වකීය ධර්ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ටී. බණ්ඩාර මහතාට එම

ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි! යි පතමු. මුද්‍රණ භාරයේ තීරණාත්මක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්ය මණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

**පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය**
**'පහන් කනුව'**
**කන්දෙගෙදර**
**දේවාලේගම**

**(25 41) 1997 ජූලි 1**

## නිවනේ නිවීම පළමු වෙළුම - පස්වන මුද්‍රණය

මෙම පස්වන මුද්‍රණයේ මුද්‍රණ කටයුතු මැනවින් නිමකළ "කොලිටි ප්‍රින්ටර්ස්" සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

සම්පාදක
(2550) 2006 දෙසැම්බර්

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කල "නිවනේ නිවීම" දේශනා මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ ශ්‍රී. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සලසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 6ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,<br>
සඳුන් ලැදි<br>
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම් සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට කෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් තත් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවූයේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සඳුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, කහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමඟ බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත්

මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

2000 ජූනි 05 (2544 පොසොන්)

# ග්‍රන්ථ සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| මහා. | - | මහා වග්ග පාළි |
| දී.නි. | - | දීඝ නිකාය |
| ම.නි. | - | මජ්ඣිම නිකාය |
| සං.නි. | - | සංයුත්ත නිකාය |
| අං.නි. | - | අංගුත්තර නිකාය |
| ඛු.නි. | - | ඛුද්දක නිකාය |
| ධ.ප. | - | ධම්මපද |
| උදා. | - | උදාන |
| ඉති. | - | ඉතිවුත්තක |
| සු.නි. | - | සුත්තනිපාත |
| ථෙර. | - | ථෙරගාථා |
| ථෙරී. | - | ථෙරීගාථා |
| මහානි. | - | මහා නිද්දෙස |
| චූ.නි. | - | චූලල නිද්දෙස |
| නෙත්ති | - | නෙත්තිප්පකරණ |
| සු.වි. | - | සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව) |
| ප.සූ. | - | පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව) |
| සා.ප. | - | සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව) |
| මනො. | - | මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව) |
| ධ.අ. | - | ධම්මපදට්ඨ කථා |
| ප.ජෝ. | - | පරමත්ථජෝතිකා |
| ජා.අ. | - | ජාතකට්ඨකථා |
| ප.දී. | - | පරමත්ථදීපනී |
| වි.ම. | - | විසුද්ධිමග්ග |
| බු.ජ. | - | බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා |
| හේ.මු. | - | සයිමන් හේවාවිතාරණ මුද්‍රණය |

# 7 වන
# දේශනය

# 7 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බ සංඛාර සමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"

මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය.

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ හත් වන දේශනයයි මේ.**

අනිදස්සන විඤ්ඤාණයක් ගැන කියැවෙන එක්තරා ගාථා ධර්මයක් අපි පසුගිය දේශනයේ අගහරියේදී උපුටා දැක්වූවා දීඝනිකායේ කේවඩ්ඪ සූත්‍රයෙන්. ඒ ගාථාව-

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතොපභං
එත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන - එත්ථෙතං උපරුජ්ඣති.

කියන මේ ගාථා ධර්මයයි. මේ ගාථාවෙ සාමාන්‍ය අදහස ඉතාම සැකෙවින් විතරයි අපිට එදා සඳහන් කරන්න පුළුවන් උනේ, කාලවේලා මදිවුන නිසා. අද සවිස්තරව ඒ ගැන විවරණයක් කිරීමටයි බලාපොරොත්තු වන්නේ. මේකෙ සාමාන්‍ය අදහස -අපි මුල් පදය පරිවර්තනය කළේ නැහැ. මුල් පදේ තිබෙන වචන කීපය තමයි ඉතාමත්ම ගැටළු සහිත බව පෙනෙන්නේ කාටත්. ඒක නිසා ඒ පදය එහෙමම අරගෙන, අනිදස්සන වූ, අනන්ත වූ, සබ්බතො පභ වූ විඤ්ඤාණයක පඨවි ආපො තෙජො වායො යන මහාභූත ධර්ම සතරත්, දිග - කොට, අණු - ස්ථූල - ඒ කියන්නේ කුඩා මහත් - සුභ අසුභ කියන ඒ ප්‍රඥප්තිත් ඒ වගේම නාමයත් සහ රූපයත් කියන මේ හැම එකක්ම 'උපරුද්ධ' වෙනවයි, නැතිවෙනවයි, විඤ්ඤාණයේ

නිරෝධයෙන් මේ සියල්ලම උපරුද්ධ වෙනවයි, වළක්වනු ලබනවයි කියන එකයි සාමාන්‍ය අදහස.

දැන් අපි ක්‍රමානුකූලව මුල් පදයේ තිබෙන ඒ වචනවල අර්ථය විමසන්න බලමු. පළමුවෙන්ම 'විඤ්ඤාණං අනිදස්සනං' කියන තැන අනිදස්සනං කියන වචනය. අනිදස්සනං කියන වචනයේ අර්ථය - 'නිදස්සන' කියන වචනයේ සාමාන්‍ය අර්ථය කාටත් ප්‍රකටයි. නිදර්ශනය කියල පාවිච්චි වෙනව. යමක් පෙන්නුම් කරන, යමක් විදහා දක්වන දෙයට නිදර්ශනය කියල කියනව. මේකයි මූලික අර්ථය. මේ මූලික අර්ථය පවා එක්තරා විධියකට යමකට විශේෂණ වශයෙන් යෙදුන අවස්ථාවක් අපට දකින්ට ලැබෙනව අංගුත්තර නිකායෙ දසකනිපාතයෙ පඨමකොසල සූත්‍රයෙ අභිභායතන පිළිබඳ සඳහන් වන, ඒ කියන්නේ කසිණ නිමිති වගේ දේ ගැන සඳහන් වන සූත්‍රයක. කසිණ නිමිත්තක් වශයෙන් පාවිච්චි කරන්න පුළුවන් සමහර විට දියබෙරලිය මල. ඒ දියබෙරලිය මල පිළිබඳව මෙන්න මෙහෙම පාඨයක් සඳහන් වෙනව. 'උම්මාපුප්ඵං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං'.[1] මේ දියබෙරලිය මල පිළිබඳව සඳහන් වෙනව 'නිල්වූ, නිල්වණ් වූ නිලක් පෙන්නුම් කරන, - 'නීලනිදස්සනං' කියල කියන්නේ නිලක් පෙන්නුම් කරන, එහෙම නැත්නම් නිලට නිදර්ශනයක් වන, - "නීල නිභාසං' කියන්නේ නිල් දිස්නයක් ඇති, නිල් දීප්තියක් ඇති. මෙතන නීල නිදස්සනං කියල යොදල තියෙනව. නිලට නිදර්ශනයක් වන, එහෙම නැත්නම් නිලක් විදහා දක්වන කියන එකයි. එතකොට මේ විදියට ගත්තහම 'අනිදස්සන' කියන එක අපට හිතාගන්න පුළුවන් යමක් විදහා නොදක්වන 'යමක් පෙන්නුම් නොකරන' කියන අර්ථයයි. අනිදස්සන කියන වචනයෙ මේ අර්ථය ඇති බවට ඉතාමත්ම හොඳ සාධකයක් අපට ලැබෙනව මජ්ඣිම නිකායෙ කකචූපම සූත්‍රයෙන්. ඒක නිකම් අහම්බෙන් වගෙයි ඒ උපමාව යෙදෙන්නෙ. බුදුපියාණන්වහන්සේ එක අවස්ථාවක සංඝයා වහන්සේලාට යම්කිසි උපමාවක් ඉදිරිපත් කිරීම සඳහා පළමුවෙන්ම ප්‍රශ්නයක් අසනවා ඒ භික්ෂූන් වහන්සේලාගෙන් "මහණෙනි, යම් සේ පුරුෂයෙක් එන්නේද? - "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ආගච්ඡෙය්‍ය ලාඛං වා හලිද්දිං වා නීලංවා මඤ්ජිට්ඨං වා ආදාය" ඒ කියන්නේ යම්කිසි සායම් වර්ගයක් අරගෙන යම්කිසි පුරුෂයෙක් එනව. රතු හෝ කහ හෝ නිල් හෝ මදටිය හෝ ඔය විදියේ පාටක් අරගෙන. ඇවිල්ල මෙන්න මෙහෙම කියනව. - "සො එවං වදෙය්‍ය - අහං ඉමස්මිං ආකාසෙ රූපානි ලිඛිස්සාමි රූපපාතුභාවං කරිස්සාමි"[2]

"මම මේ අහසෙහි රූප අඳිනව, රූප පහළ කරනව" කියල. යම්කිසි පුරුෂයෙක් එහෙම කිව්වොත් ඒක කරන්න පුළුවන් වැඩක්ද ? කියල බුදුරජාණන් වහන්සේ පළමුවෙන්ම සංඝයා වහන්සේලාගෙන් විමසනව. සංඝයා වහන්සේලා පිළිතුරු දෙනව "ඒක කරන්න බැරි දෙයක්, ස්වාමීනි".

මක්නිසාද? ඒකට හේතුව මෙන්න මෙහෙම ප්‍රකාශ කරනව "අයං හි භන්තෙ ආකාසො අරූපී අනිදස්සනො, තත්‍ථ න සුකරං රූපං ලිඛිතුං රූපපාතු භාවං කාතුං" මක්නිසාද, ස්වාමීනී මේ අහස අරූපී දෙයක් රූප ධර්මයක් නොවෙයි. රූප ස්වභාවයක් නැති දෙයක්. 'අනිදස්සනො' - ඔන්න අපිට ඕනැ කරන වචනෙ එතන තියෙනව. 'අරූපී අනිදස්සනො'. යමක් විදහා දක්වන්ට හැකියාවක් නැහැ අහසෙ. අන්න ඒක නිසා තමයි 'තත්‍ථ න සුකරං රූපං ලිඛිතුං' - ඒක නිසා රූපයක් ඇඳීම හෝ රූපයක් අහසෙහි පහළ කිරීම හෝ කළ හැක්කක් නොවේ. එහෙම නැත්නම් පහසු දෙයක් නොවේ. මෙන්න මෙතන යෙදිල තියෙනව අහසෙහි රූපයක් අඳින්න ගියාම සායමකින් ඇඟිල්ලකින් ඇන්දට ඒක හිටින්නේ නැහැ. ඒක පෙන්නුම් කරන්නේ නැහැ. විදහා දක්වන ස්වභාවයක් අහසෙහි නැහැ. අන්න ඒ වගේ එතන 'අනිදස්සනො' කියල යෙදිල තියෙනව. දැන් එතකොට අපි මේ අනිදස්සන කියන වචනය විඤ්ඤාණයට ගැලපෙනවද කියල බලමු. " විඤ්ඤාණං අනිදස්සනං" විඤ්ඤාණය 'අනිදස්සන' වෙන්නේ කොහොමද? අහස 'අනිදස්සන' බව අර උපමාවෙන් අපට තේරුම් ගන්න පුළුවන්. නමුත් විඤ්ඤාණයක් 'අනිදස්සන' වෙන්නෙ කොහොමද? මෙතැනදී පළමුවෙන්ම අපට මතක් කර ගන්න හොඳ කාරණයක් තමයි, සිත පිළිබඳව පොදුවේ, මේ සිතේ එක්තරා කෘත්‍යයක් තිබෙනව "ප්‍රත්‍යවේක්ෂාව" කියල 'ආපසු හැරී බැලීම'. ආපසු හැරී බැලීමේ හැකියාවක් තියෙනව අපේ සිත්වල. මේ 'පච්චවෙක්ඛණය' පිළිබඳව සමහර අවස්ථාවල බුදුරජාණන් වහන්සේ, ආපසු හැරී බැලීම ගැන යෙදෙන අවස්ථාවලදී එහෙම, කන්නාඩියක් ගැන සඳහන් කරල තියෙනව. 'අම්බලට්ඨිකා රාහුලොවාද' සූත්‍රයෙත් [3] යොදල තියෙනව. තව සංයුත් සඟියෙ ඛන්ධ සංයුත්තයෙත් [4] වෙන විදියකට යොදල තියෙනව. අපට එක නිදසුනක් වුනත් ප්‍රමාණවත් නිසා දැන් අර 'අම්බලට්ඨිකා රාහුලොවාද සූත්‍රයෙදී බුදුපියාණන් වහන්සේ රාහුල හාමුදුරුවන්ට "පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායෙන කම්මං කාතබ්බං" ආදී වශයෙන් ඒ විදියට ප්‍රත්‍යවේක්ෂාවේ අගය දක්වන තැන්වල කන්නාඩියකට උපමා කරල තියෙනව.

පසුගියවර දේශනයේදී සඳහන් කරන්ට යෙදුන ඒදණ්ඩ උඩ බල්ල ගැන. ඒදණ්ඩක් උඩින් යන බල්ලෙක්, අර වතුර දිහා බලල තමාගේ ඡායාව දිහා බලනව කියල. ඒකත් එක්තරා ප්‍රත්‍යවේක්ෂාවක් තමයි. මෙයින් අපට එක්තරා ධර්මතාවක් පේනව. මේ ප්‍රත්‍යවේක්ෂා කියන වචනයෙ තියෙනව මුලාව ඇතිවීමටත් මුලාවෙන් මිදීමටත් උපකාරවන යම්කිසි ක්‍රමයක්. මුලාව ඇතිවෙන්නේ අර බල්ල ඒ දණ්ඩ උඩ ඉඳගෙන බලන බලන වාරයට තමාගෙ රූපය දකින්න වාගෙ. ඒ ප්‍රත්‍යවේක්ෂාව "අයොනිසො" - ඒ කියන්නේ නුනුවණින්. එහෙම නැත්නම් නුවණ මදිකමින්. සත්කාය දෘෂ්ටියට යටවෙලා මුලාවෙන් බලන කොට ඒක දිගටම ඒ විදියට බල බලා නගුට සොලවමින්,

ගොරවමින් ඉන්න පුළුවනි. ඒ, ප්‍රත්‍යවේක්ෂාව 'අයෝනිසො' කරන නිසා. නමුත් 'යොනිසො'-"පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා" කියල දෙසැරයක්ම යොදල තියෙන්නෙ 'අම්බලට්ඨිකා රාහුලෝවාද' සූත්‍රයෙ. අන්න-යොනිසො-නුවණින් කරනව. එතකොට නුවණින් කරන්න පටන් ගත්තොත් ප්‍රත්‍යවේක්ෂාව, එතනදී ධර්ම පිළිබඳවයි අවබෝධය එන්නෙ. සම්‍යක් දෘෂ්ටියේ පිහිටල කරනව නම් විමුක්තිය හදාගන්න පුළුවන්. එතකොට, සිතේ තිබෙනව මේ විදියෙ කාරණා දෙකක්ම. ප්‍රත්‍යවේක්ෂාවෙ අංග දෙකක් තිබෙනව. මේක අපි අමතරවයි සඳහන් කළේ. නමුත් අපට ඕන කරන කාරණය, මේ විඤ්ඤාණයේ යම් කිසිවක් පිළිබිඹු කරන - අර කන්නාඩියක වගේ- යම්කිසි අමුතු ස්වභාවයක් තියෙනව. 'විඤ්ඤාණං අනිදස්සනං' කියල කියන්නේ, මෙතන මේ රහතන් වහන්සේගේ විමුක්ත සිත පිළිබඳ ලක්ෂණයක්. යමක් පිළිබිඹු කරන්නේ නැහැ. මොකක්ද පිළිබිඹු නොකරන්නේ? නාමරූපයක්. දැන් අර සාමාන්‍ය පුද්ගලයා ප්‍රත්‍යවේක්ෂා කරල බලනකොට නාමරූපයක් ඒ පුද්ගලයාට පෙනෙනව, 'මමය' 'මගේය' කියල කියන්න පුළුවන් විදියෙ. බල්ලට අර තමාගේ ඡායාව පෙනුනා වගේ. ප්‍රත්‍යවේක්ෂණයේදී නොරහත් කෙනෙකුට නාමරූපයක් දකින්නට ලැබෙනව. මේ නාමරූපය තමයි කෙනෙක් ආත්මත්වයෙන් ගන්නෙ. 'මමය' 'මගේය' කියන හැඟීමෙන් අරගෙන මුළාවෙ වැටෙන්නෙ. නමුත් රහතන් වහන්සේගේ විඤ්ඤාණය 'අප්පතිට්ඨිත විඤ්ඤාණයක්'. අපි කලින් දේශනාවලත් සඳහන් කළා පතිට්ඨිත විඤ්ඤාණයත්, අප්පතිට්ඨිත විඤ්ඤාණයත් ගැන. නාමරූපයක පිහිටි විඤ්ඤාණය තමයි නොරහත් විඤ්ඤාණය. නාමරූපයෙන් මිදුනු, නාමරූපයක නොපිහිටි විඤ්ඤාණය අප්පතිට්ඨිත විඤ්ඤාණයයි. එතකොට පතිට්ඨිත විඤ්ඤාණය එහි පිහිටියාවූ නාමරූපය පිළිබිඹු කරනව, ආපසු හැරී බැලීමේදී. අප්පතිට්ඨිත විඤ්ඤාණයට ඒ විධියට ප්‍රත්‍යවේක්ෂාවෙදී හමුවන්නේ නැහැ නාමරූපයක්. නාමරූපයක ඇලීම් බැඳීම් ආදී ඒ කිසිවක් නැහැ ඒ රහතන් වහන්සේට. මමය, මාගේය කියන හැඟීමක් නැහැ. කොටින්ම කිව්වොත් නාමරූපයේ බැඳෙන්නේ නැතිව ඒක විනිවිද යෑමක් වගේ දෙයක් වෙනව. 'අනිදස්සන විඤ්ඤාණය' කියන එකේ අර්ථය ගන්න තියෙන්නෙ අන්න ඒ විදියටයි. "විඤ්ඤාණං අනිදස්සනං"

අපිට තවත් මේකට එකතු කරන්න පුළුවන්, 'අනිදස්සන' කියල ප්‍රකාශ කළ අදහසට, මේක අනිදස්සන වෙන්නේ මක්නිසාද? අර රූප ධර්මයන් අවශ්‍ය බව පෙන්නුව. අර කලින් කියාපු අහම්බෙන් ගත්තු උපමාවෙ පවා රූප ධර්මයන් අවශ්‍යයි යමක් පිළිබිඹු කිරීමට, රහතන් වහන්සේගේ විඤ්ඤාණය පිළිබඳව මේ ගාථාවෙම සඳහන් වෙනව - "එත්ථ ආපොච පඨවී තෙජො වායො න ගාධති". පඨවි, ආපො, තෙජො, වායො කියන ඒ සතර මහාභූත ධර්මයන් නිසා තමයි කෙනෙකුට රූප සංඥාව ඇතිවෙන්නෙ. රූපයට හේතු

වශයෙන් දැක්වෙන්නේ ඒවායි- "චත්තාරො ඛො භික්ඛු මහාභූතා හෙතු චත්තාරො මහාභූතා පච්චයො රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය"[5]කියල ඔය විදියට දක්වල තියෙනව. එතකොට රහතන් වහන්සේ මේ සතර මහා භූතයින් ගෙන් සිත මුදා ගෙනයි සිටින්නේ "පඨවි ධාතුයා චිත්තං විරාජෙති ආපො ධාතුයා චිත්තං විරාජෙති"[6] ආදි වශයෙන් 'ධාතු විභංග' සූත්‍රයේ එහෙම සඳහන් වෙනව. රහතන් වහන්සේ සතර මහා භූතයින්ගෙන් සිත මුදාගෙන සිටින නිසා ප්‍රත්‍යවේක්ෂාවේදී රූප සංඥාවක් අහුවෙන්නේ නැහැ. "එත්ථ ආපො ච පඨවී, තෙජො වායො න ගාධති' මෙතන 'ගාධති' කියන වචනයත් ඉතාමත්ම වැදගත්. දැන් අපි ගැඹුරු වතුරකට - මේ වතුර කොච්චර ගැඹුරුද එහෙම නැත්නම් මේකෙ පතුල කොතැනද කියල දැනගන්න - ලඹයක් වගේ දෙයක් දානව. මොකක් හරි ඒකේ පටලවල දානව. ඒක ගිය දුර අනුව අපි ගැඹුර මනිනව. එහෙම නැතිනම් ඒක ගිහිල්ල නැවතුනු තැන අන්න අහවල් තැන පතුලයි කියල හිතාගන්නව. මේකට උපකාර වෙන්නේ යම්කිසි රූප ධර්මයක්. රහතන් වහන්සේගේ ඒ විඤ්ඤාණය ඒ විදියේ රූප ධර්මවල බැඳෙන්නේ නැහැ. රැඳෙන්නේ නැහැ. ඇලෙන්නේ නැහැ. අන්න ඒක නිසා තමයි මේක අනිදස්සන වෙන්නෙ.

"විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතො පභං
එත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති"

ඒ රූප ධර්මවල ගැටීමක් නැති නිසාම තමයි මේක අනිදස්සන වෙන්නේ. ඊළඟට ඒකටම අයිතියි, මෙතනදීම අපට සඳහන් කරන්න පුළුවන්, අර රූප ධර්මයන් පිළිබඳවම වූ මිම් විශේෂ, මිනුම් විශේෂ තමයි - දීඝං රස්සං, දිග, කොට - අණුං ථූලං, කුඩා මහත් - සුභං අසුභං, ලක්ඛණං අවලක්ඛණං ආදී වශයෙන්. මේ සියල්ලම අර විඤ්ඤාණයේ සටහන් නොවන්නෙ පෙන්නුම් නොකරන්නෙ විදහා නොදක්වන්නෙ මක් නිසාද? අර සතර මහා භූතයින්ගෙන්, තථාගතයන් වහන්සේත් අනෙකුත් රහතන් වහන්සේලාත් සිත මුදාගත් නිසයි.

ඊළඟට අපි 'අනන්තං' කියන වචනය ගැනත් හිතා බලමු. අර ගැඹුරු දිය ගැන අපි ප්‍රකාශ කරන කොට, එතන කිව්ව ලඹයක් වැනි දෙයක් දමල තමයි මේකෙ ගැඹුර මනින්නේ කියල. රහතන් වහන්සේලාගේ විඤ්ඤාණය පිළිබඳව අර රූප ධර්මයන් නැති නිසා - ඒකට සූචකයක් වශයෙන් පෙන්නුම් කරන රූප ධර්මයන් නැති නිසාම - ඒ විඤ්ඤාණය අනන්තයි. තවත් අර්ථයකින් එය අනන්තයි. අපි දන්නව දිග - කොට ආදී භේද ගැන අපි කලින් සඳහන් කළා සාපේක්ෂක කියල වචනයක්. සාපේක්ෂක ප්‍රඥප්ති කියල. තේරුම් ගැනීම පහසු වීමට අපි මේවාට ඇඳුතුපද කියල කිව්ව. 'ඇඳුතු' කියන පදයෙ වෙන නොයෙකුත් අර්ථ තියෙන්න පුළුවනි. නමුත් මේ දේශනා මාලාවට උපකාර කර ගැනීම සඳහා ඒ වචනය යොදාගත්ත. මේවා ලෝක ව්‍යවහාරයේ සාමාන්‍යයෙන් පවතින්නේ

ඇඳුනු හැටියට නිසා. දිග, කොට සුභ, අසුභ, කුඩා, මහත් ආදී මේ ප්‍රඥප්ති තියෙනව ලෝකෙ. මේ ප්‍රඥප්ති වල අධ්‍යනිශ්‍රිත ස්වභාවයක් තියෙනව. දෙකක් අතරෙයි පවතින්නෙ. හරියට යම්කිසි රාමුවක් ඇතුළේ දාපුව වගෙයි. දැන් අපි යම්කිසි වැඩකට ලී කැල්ලක් ඕනෑ වෙලා සොයන කොට මේ ලී කැල්ල දිග වැඩියි කියල කියන්නේ මක් නිසාද ? අපිට ඕනෑ කරන්නේ ඊට වඩා කොට එකක්. කොට මදියි කියන්න ඕන එකට අපි දිග වැඩියි කියල කියනව. මේක 'කොට වැඩිය' කියල කීවොත් ? ඒකේ අදහස 'දිග මදි' කියන එකයි. ඔන්න එතකොට දිග කොට කියන එක එක්තරා රාමුවක් ඇතුළෙ. ඇත්ත වශයෙන්ම කියනවනම් හැම මානයක්ම-හැම මිනුමක්ම- යම්කිසි පරිමානයක් තුළයි කෙරෙන්නෙ. එක රාමුවක් තුළයි කෙරෙන්නේ. අන්න ඒ අර්ථයෙනුත් එතකොට සාමාන්‍ය ලෝකයාගේ සිතුම් පැතුම් වල කොන් තිබෙනව. අන්තවාදියි. ඒ කොනයි මේ කොනයි. අපි අර මුල ඉඳලම අස්ති-නාස්ති, ඇත-නැත ආදි වශයෙන් ලෝකයා අන්ත දෙකක් ඇසුරු කරනව කියල ප්‍රකාශ කළේ ඉතාමත්ම පුළුල් අර්ථයකින්. ලෝකයා හැම තිස්සේම යම්කිසි රාමුවක් ඇතුළෙයි කල්පනා කරන්නේ. අර දිග කොට ආදි ප්‍රඥප්ති වල රැඳිල බැඳිලයි ඉන්නෙ. ඔන්න එතකොට 'අනන්තං' කියන වචනයේ අර්ථය අපට ඒ අතින් ගන්න පුළුවන්. රහතන් වහන්සේ ගේ ඒ විඤ්ඤාණය පුදුම අන්දමට අර විදියේ සීමාවක් නැතිව- ගිහිල්ල බැඳෙන්නෙ නැතිව, රැඳෙන්නෙ නැතිව - අනන්ත ස්වභාවයක් දරනව. මේ කාරණය පැහැදිලි වන ඉතාමත්ම වටිනා ගාථා ධර්මයක් තියෙනව උදාන පාළියේ පාටලිගාමිය වග්ගයෙ. ඒ වග්ගයෙ තියෙන සූත්‍ර බොහොමයක් "නිබ්බාන පටිසංයුත්ත" සූත්‍රයි. ඒ එක් නිබ්බාන පටිසංයුත්ත සූත්‍රයක සඳහන් වෙනව ගැඹුරු ගාථා ධර්මයක්.

**දුද්දසං අනත්තං නාම - න හි සච්චං සුදස්සනං**
**පටිවිද්ධා තණ්හා ජානතො - පස්සතො නත්ථි කිඤ්චනං**[7]

මේ ගාථාව - අනික් බොහෝ ගැඹුරු ගාථා වගේම - අටුවාචාරීන් වහන්සේලාට ප්‍රශ්නයක් වූ එකක්. වෙන එකක් තබා පාඨාන්තර පිළිබඳවත් ගැටලුවක් ඉදිරිපත් කරන්න බැරිව 'මෙන්න මේකත් වෙන්න පුළුවන්' කියල අන්න එහෙම දක්වන අවස්ථාවක් මෙතැනත්. 'දුද්දසං අනත්තං නාම - නහි සච්චං සුදස්සනං' මෙහි සාමාන්‍ය අර්ථය ඉස්සෙල්ල ගනිමු. 'අනන්තය' - අනන්තය කුමක් හෝ වේවා - මේ අනන්තය 'දුද්දසං' මේ කියන අනන්තය දැකීමට පහසු දෙයක් නොවේ. "දුද්දසං අනත්තං නාම" අනන්තය නම් තේරුම් ගැනීම, දැකීම පහසු වැඩක් නොවේ. "නහි සච්චං සුදස්සනං" - ඒකම අවධාරණයෙන් තවත් වරක් කියනව. 'සත්‍යය පහසුවෙන් දැකිය හැක්කක් නොවේ'. මේ අනන්තය කියන එක සත්‍යය බව, නිර්වාණය බව, එතනින් හැඟෙනව.

මෙතන 'ජානතො පස්සතො' කියන්නෙ ඥානදර්ශනය ඇති රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ එහෙම. එබඳු උත්තමයින් විසින් පටිවිද්ධා තණ්හා- තණ්හාව විනිවිද දැකල තියෙනව - පටිවිද්ධා තණ්හා. ජානතො පස්සතො - අන්න ඒ අවස්ථාවෙ මොකක්ද වැටහෙන්නේ 'නත්ථි කිඤ්චනං'- ලෝකේ කිසිවක් නැත, අනිමිත්ත වශයෙන් ලෝකය අරමුණු වෙනව කියන එකයි. මෙතන මේ නිර්වාණය ගැනයි මේ ගාථාවෙ කියවෙන්නෙ.

මේ 'අනන්තං' කියන වචනය පිළිබඳව පරමත්ථදීපනී අටුවාවෙදී [8] අටුවාචාරීන් වහන්සේ මේක ඇත්ත වශයෙන් අනතංද, අනන්තංද, කියලත් තේරුම් ගන්න බැරිව ඒ මත දෙකටම ඉඩ සළසල තියෙනව. 'අනතං' කියල එක අර්ථයක් දෙනව. ඒක සහේතුක බව පෙන්නුම් කරන්න නිරුක්තියක් දක්වනව. 'නතා' කියල කියන්නෙ තණ්හාවට නමක්ය කියල කියනව. සාමාන්‍යයෙන් තණ්හාවට යොදන්නෙ 'නති' කියන වචනය. 'නතා' කියල නම් යොදන්නෙ නැහැ. කොයි හැටි හෝ වේවා!'නතා' කියන්නේ තණ්හාවය. 'අනතං' කියන්නේ ඒ තණ්හාව නැති නිසා නිර්වාණය කියල. ඔය "අනතං" කියන පාඨයත් සනාථ කරනව. මේකත් හේතු සහිතයි කියල ඉස්සෙල්ල අටුවාචාරීන් වහන්සේ ප්‍රකාශ කරල, ඊළඟට ප්‍රකාශ කරනව 'අනන්තන්තිපි පඨන්ති' සමහරු මේක "අනන්තං" කියලත් දක්වනවාය. ඊළඟට ඒකටත් අර්ථ දෙනව. එක අර්ථයක් දෙනව, නිර්වාණය නිත්‍ය නිසා - අර සදාකාලික අර්ථය අරගෙන - ඒකේ කෙළවරක් නැහැ කියල. කෙළවරක් නැතෙයි කියන අර්ථයෙන් එතන 'අනන්තං' කියල කියනවය. තවත් අර්ථයක් දෙනව, සමහර කෙනෙක් කියනවය 'අප්පමාණන්ති' මේක ප්‍රමාණ කරන්න බැරි නිසා අප්‍රමාණ නිසා නිවනට 'අනන්තං' කියනවය කියල. අපි මේ දැක්වූ විවරණය අනුව, තරමක් දුරට ඊට කිට්ටු වෙන්නෙ "අප්පමාණ" කියන එකයි. මේ 'අප්පමාණ' කියන වචනයෙත් නොයෙකුත් අර්ථ භේද තියෙනව. ඒක පිළිබඳවත්, ප්‍රශ්න කීපයක් ඉදිරියට එන්න පුළුවනි. 'අප්පමාණ' කියන අර්ථයට ළංවයි, අපි මේ 'අනන්තං' කියන පදය මෙතෙන්දී තේරුවේ. අර 'සදාකාලික' අර්ථයක්වත්, නිත්‍ය අර්ථයක්වත් නොවෙයි. ඔය නිශ්‍රිත පද අතර - සාපේක්ෂක, ඇඳුතු පද අතර - බැඳිල රැඳිල නැති නිසාත්, ඊළඟට අර සතර මහා භූතයින් වැනි ලඹයකින් මනින්න බැරි තරම් කෙළවරක් නොපෙනෙන මහා ගැඹුරක් මේ විඤ්ඤාණයේ තිබෙන නිසාත් අනන්තයි. මේ 'අනන්ත' කියන පදයේ ඉතාමත්ම වටිනා වැදගත් සංකල්පයක් ගැබ්වෙල තියෙන්නෙ. මේකට තවදුරටත් අපිට අවබෝධයක් ලබා දෙන වටිනා ගාථා ධර්මයක් අපට හමුවෙනව ධම්මපදයේ බුද්ධවග්ගයෙ

'යස්ස ජාලිනී විසත්තිකා -තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ
තං බුද්ධමනන්තගොචරං - අපදං කෙන පදෙන නෙස්සථ'

මේ ගාථාව පරිවර්තනය කරන්න කලින් මේකෙ තියෙන වචන කීපයක් ගැන පළමුවෙන්ම සඳහන් කරන්න වෙනව.

"යස්ස ජාලිනී විසත්තිකා" - 'ජාලිනී' කියල වචනයක් යොදනව තණ්හාවට නමක් හැටියට. තණ්හාවට හුඟක් නම් යොදල තියෙනව. 'ජාලිනී' කියල කියන්නේ දැලක් ඇති තැනැත්තිය. අපට කියන්න පුළුවන් 'දැල්කාරී' කියල. 'විසත්තිකා' කියල කියන්නේ 'අලවනසුලු' කියන එක. තණ්හාවේ තවත් කෘත්‍යයක් තමයි ලෝක සත්ත්වයා ඒ ඒ කාමවස්තූන්හි අලවන එක. එතකොට තණ්හාවට පද දෙකක් මෙතන යොදල තියෙනව 'ජාලිනී', 'විසත්තිකා'. "යස්ස ජාලිනි විසත්තිකා තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ", තං බුද්ධං අනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ', යම් කිසිවෙක් යම්කිසි තැනක් කරා ගෙනයාමට සමත්, අලවන සුළු ස්වභාවය ඇති, තණ්හා නමැති දැල්කාරිය යමෙකුට නොවන්නේද, යම් විමුක්ත පුද්ගලයෙකුට නොවන්නේද? ඒකයි දැන් සාමාන්‍ය අදහස ගලපල ගත්තොත් "යස්ස ජාලිනී විසත්තිකා - තණ්හා නත්ථි කුහිංචි නෙතවෙ' මෙතන බුදුරජාණන් වහන්සේ පිළිබඳවයි තියෙන්නෙ. බුදුරජාණන් වහන්සේගේ සිත කොහේවත් ඇදගෙන යන්න සමත් අර අලවන සුළු ස්වභාවය ඇති තණ්හා නමැති දැල්කාරිය - තණ්හාවට තියෙන දැල තමයි නාම රූප දැල. ඒ නාමරූප දැලත් අරගෙනයි ගොදුරු සොයන්නෙ, මේ ගොදුරු අල්ලන්න යන්නෙ තණ්හාව - මේ දැල්කාරිය නැත්තේද? 'තං බුද්ධං අනන්ත ගොචරං - අපදං කෙන පදෙන නෙස්සථ' අනන්තගෝචරවූ ඒ බුදුරජාණන්වහන්සේට, 'අපදං' - මාර්ගයක් නැහැ. ඒ කියන්නෙ, ගිය මාර්ගයක් සොයා ගන්න බැහැ. පස්සෙන් ගිහිල්ල එපායැ දැලක් දාල අල්ලගන්න. එහෙම මාර්ගයක් පේන්න නැහැ - 'අපදං කෙන පදෙන නෙස්සථ' කවර නම් මාර්ගයකින් අරගෙන යන්නේද? තණ්හාවට කරගන්න දෙයක් නැතිවෙනවයි කියන එකයි එතන කියන්නේ. පසුපසින් එලවගෙන යන්න මාර්ගයකුත් නැහැ. අල්ලගන්න ක්‍රමයකුත් නැහැ. 'අනන්ත ගොචරං' මේ කියන්නෙ කෙළවරක් නොපෙනන ගොදුරු බිමක්- 'අනන්තගොචරං' කියල කියන්නේ කෙළවරක් නොපෙනෙන ගොදුරු බිමක්. දැන් සාමාන්‍යයෙන් මුවෙක් එහෙම අල්ලගන්න ඕනැ නම් එලවගෙන ගිහිල්ල අන්තිමට ඒ ගොදුරු බිම කෙළවරදිවත් අල්ලගන්නව. නමුත් බුදුපියාණන් වහන්සේගේ සිත පිළිබඳව බලනකොට ඒ විදියේ සොයල දැලින් අල්ලගන්න පුළුවන් කෙළවරක් පේන්නෙ නැහැ. මේ ගාථාවෙ අර්ථය සමහර ධම්මපද විවරණ ආදියෙ දක්වන කොට මේ කාලෙ 'අනන්ත' කියන එකේ මතුපිට අර්ථයයි අරගෙන තියෙන්නෙ. එතන 'අනන්තගොචරං' කියන එක බුදුරජාණන් වහන්සේ පිළිබඳව යෙදීම ගැන සමහර අර්ථ

විවරණකාරයන් දක්වන්නේ කෙළවරක් නැති දෑ අරමුණු කරගෙන සිටින නිසා ඒක අනන්ත ගෝචරයි කියල. බුදුරජාණන් වහන්සේ කෙළවරක් නැතිදෑ දත් බව - සබ්බඤ්ඤුත ඥාණය - ගැන හිතාගෙනයි ඒ කියන්නේ . බුදුපියාණන් වහන්සේට හැම එකක්ම පෙනෙන නිසා, කෙළවරක් නැති අරමුණු තිබෙන නිසා 'අනන්තගොචර' ලු. ඒ අර්ථය නොවෙයි අපි ගන්නේ මෙතන. 'අනන්ත' වෙන්නෙ ඇත්තවශයෙන්ම අරමුණක් නැති නිසාමයි. අරමුණක් තිබුනනම් අල්ල ගන්න පුළුවන්. අරමුණක් නැති බවමයි මෙතන කියන්නේ. මේ 'අනන්තගොචර' කියන වචනයේ අර්ථය තේරුම් ගැනීමට උපකාර වන ගාථා දෙකක් අපට හමුවෙනව ධම්මපදයේ අරහන්ත වග්ගයේ. ඉතාම වටිනා ගාථා දෙකක්. බොහෝ දුරට සමානයි එකිනෙකට. ගාථා යුගලයක් වගේ.

"යෙසං සන්නිචයො නත්ථි - යෙ පරිඤ්ඤාත භොජනා
සුඤ්ඤතො අනිමිත්තො ච - විමොක්ඛො යෙස ගොචරො
ආකාසෙව සකුන්තානං - ගති තෙසං දුරන්නයා"

ඒ පළමුවෙනි ගාථාව. ඊට තරමක් සමානයි ඊළඟ ගාථාවත්.

"යස්සාසවා පරික්ඛීණා - ආහාරෙච අනිස්සිතො
සුඤ්ඤතො අනිමිත්තො ච - විමොක්ඛො යස්ස ගොචරො
ආකාසෙව සකුන්තානං - පදං තස්ස දුරන්නයං"

මේ ගාථා දෙකේම සමාන අර්ථයි තියෙන්නේ. අපි බලමු මුල් ගාථාව. "යෙසං සන්නිචයො නත්ථි - යෙ පරිඤ්ඤාත භොජනා" යම් කෙනකුන්ට එකතු කර ගත් දෙයක් නැද්ද? මේ වචන යොදල තියෙන්නේ බොහොම ගැඹුරු අර්ථයෙන්. ධම්මපදයෙ තියෙන ගාථාවල බොහෝවිට රූපකාර්ථයක් තියෙනව. බුදුපියාණන් වහන්සේ ගැඹුරු ධර්මයක් ඉදිරිපත් කරල තියෙන්නේ ඊට නිසි භාෂාවකින්. බොහෝ විට ගැඹුරු රූපක තියෙනව. ඒවායේ අර්ථය හරියට වටහා ගත්තේ නැත්නම් ඒ ධර්මය සාමාන්‍ය දෙයක් හැටියට කෙනෙක් සලකන්නත් ඉඩ තියෙනව. දැන් මෙතන "යෙසං සන්නිචයො නත්ථි " - යම් කෙනෙකුට ගොඩ ගහගත්ත දෙයක් නැද්ද? නැත්තේ වේද? මේ ගොඩ ගහ ගන්නේ මොනවාද? මේ පඤ්චුපාදානක්ඛන්ධය මොහොතක් පාසා ලෝකයා ගොඩ ගහ ගන්නව. කර්ම රැස්කරනව පමණක් නොවෙයි. මේ උපාදානස්කන්ධය, භවය කියන එක මොහොතක් පාසා ගොඩ නැගෙන දෙයක්. 'උපචය' කියල කියනව ඒකට. රහතන් වහන්සේලාට 'උපචයක්' නැහැ. එතකොට 'සන්නිචයක්' එහෙම නැත්නම් කර්ම රැස් කිරීමකුත් නැහැ. ඒ එක්කම 'යෙ පරිඤ්ඤාත භොජනා' ආහාරය හොඳට තේරුම් අරගෙන තියෙනව. සාමාන්‍ය ප්‍රත්‍යවේක්ෂාව වශයෙන් පමණක් නොවෙයි. ධාතු වශයෙන් ආහාරයේ යථා ස්වභාවය, එක ආහාරයක් පමණක් නොවෙයි. ආහාර

හතරම. කබලිංකාරාහාර, ඵස්ස, මනොසඤ්චෙතනා, විඤ්ඤාණ යන ඒ හතර ආහාරයම ගන්න පුළුවන්. ඔය විදියේ ගැඹුරු අර්ථයක් මෙතන තියෙන්නෙ. යම් කෙනෙකුන්ට අර විදියේ ගොඩගහගත්තු දෙයක් නැද්ද? භෝජන හොඳට තේරුම් අරන් තියෙනවද? මෙතන භෝජන කියන වචනය යොදල තියෙන්නෙත් අර ගෝචර කියන වචනයට ගැලපෙන ආකාරයෙන් "සුඤ්ඤතො අනිමිත්තොච-විමොක්ඛො යෙස ගොචරො" ඒ රහතන් වහන්සේලාගේ ගොදුරු බිම - ඔන්න මෙතෙනදී අහුවෙනව මොකක්ද ගොදුරුබිම කියල "සුඤ්ඤත, අනිමිත්ත කියන විමොක්ඛ දෙකයි.

සුඤ්ඤතයත්, අනිමිත්තයත්. එතකොට රහතන් වහන්සේලා ගොදුරු ගන්න වෙලාවට, අරහත් ඵල සමාධියෙ වැඩ ඉන්න වෙලාවට - සිත යන්නේ සුඤ්ඤත පැත්තට, අනිමිත්ත පැත්තට. ඉතින් මාරයාටවත්, තණ්හාවටවත් දැලක් දාලා අල්ලන්න බැරි අවස්ථාවක්, ඒ ගොදුරු ගන්න අවස්ථාව. අන්න ඒකයි මෙතන "සුඤ්ඤතො අනිමිත්තොච විමොක්ඛො" සුඤ්ඤත, අනිමිත්ත,විමොක්ඛය. ඒ ගෝචරය. "ආකාසෙව සකුන්තානං ගති තෙසං දුරන්නයා" හරියට අහසෙ පක්ෂීන් පියාඹල ගියාම ඒ මාර්ගය සොයා ගන්න බැරුව වගේ - මෙතන 'ගති' කියන එක අටුවා ආදියෙ සාමාන්‍යයෙන් තෝරන්නෙ රහතන් වහන්සේ පිරිනිවන්පෑවට පස්සෙ ගිහිල්ල උපන්න තැන, එහෙම නැත්නම් ගියේ කොහේද කියල. ඒක නොවෙයි මෙතන 'ගති' කියන්නේ. මේ චිත්ත ප්‍රවෘත්තියයි. රහතන් වහන්සේලාගේ සිත පිළිබඳව ඒ සිත කොහෙද යන්නෙ කියල බලාගන්න බැහැ කියන එකයි මෙතන කියන්නෙ. ඊළඟ ගාථාවෙනුත් ඒ අදහසයි කියැවෙන්නේ.

"යස්සාසවා පරික්ඛීණා - ආහාරෙච අනිස්සිතො- යම් කෙනකුගේ හෝ ඒ රහතන් වහන්සේගේ - එතන ඒක වචනයෙන් යොදල තියෙන්නේ - 'ආසවා පරික්ඛීණා, ආශ්‍රවයන් ක්ෂය වී ඇද්ද 'ආහාරෙච අනිස්සිතො' ආහාරයෙහි නොඇලී සිටියේද, 'සුඤ්ඤතො අනිමිත්තොච - විමොක්ඛො යස්ස ගොචරො' යමෙකුගේ ගොදුර සුඤ්ඤත සහ අනිමිත්තවිමොක්ඛයද. "ආකාසෙව සකුන්තානං පදංතස්ස දුරන්නයං" අහසේ පක්ෂීන්ගේ මෙන් ඒ රහතන් වහන්සේ ගේ "පදං" කියන්නේ මාර්ගය. 'අපදං කෙන පදෙන නෙස්සථ' කියන ගාථා පදයත් මතක් කරගන්න පුළුවන්. ඒ අනුව 'පදං තස්ස දුරන්නයං' ඒ මාර්ගය සොයා ගන්න බැහැ කියන එකයි. එතකොට මේ "අනන්ත" කියන පදයෙ අර්ථ රාශියක් තිබෙන බව අපට පේනව. 'අනන්ත ගොචරං' කියන පදයේ අර්ථය අපට තේරුම් ගන්න වෙන්නේ මේ ගාථා ආශ්‍රයෙනුයි.

ඊළඟට "විඤ්ඤාණං අනිදස්සනං- අනන්තං සබ්බතො පහං" - දැන් අපි "සබ්බතො පහං" කියන වචනය තේරුම් ගන්න බලමු. අපි අර න්‍යාය

ගැන, එහෙම නැත්නම් සිනමාව ගැන, කථා කරන කොට ප්‍රකාශ කළා, ඒ සිනමා තිරයෙ වැටෙන චිත්‍රයක, යම් කිසි ජවනිකාවක, ඒ නරඹන්නා - ප්‍රේක්ෂකයා - ඇලෙන්නෙ, ඒක 'මමය' කියල හඳුනාගන්නේ, ඒ චරිත එක්ක තමන් හඳුනාගන්නේ මක්නිසාද?' අර අඳුරු පසුබිම නිසයි. අඳුරු පසුබිම නිසා මෝහනයට වැටෙනව. එක්තරා විධියක මෝහනයකට වැටෙනව. ආස්වාදය කියන්නේ ඒකයි. ඇත්ත වශයෙන්ම එක්තරා ආලෝකයක් තියෙනව සිනමා ශාලාවෙ, ඒ ආලෝකය ඉතාමත්ම සීමිතයි. ඒක සමහර විට තිරයට විතරක් වැටෙන ආලෝකයක්. අපි අර කලින් දේශනයක සඳහන් කළා දවල් කාලයේ චිත්‍රපටියක් පෙන්වන කොට දොරවල් ආදියත් වහල, කළුතිර ආදියත් දාලයි ඒක පෙන්වන්නෙ කියල. දැන් මෙතන කියැවෙන්නේ "සබ්බතො පභං" යම්කිසි විදියකින් අර චිත්‍රපටිය පෙන්වන අවස්ථාවක - අපි කලිනුත් සඳහන් කළා උපමාව පමණක් නම් - දවල් කාලයේ අර විදියට චිත්‍රපටියක් බලන අතරේ, කෙනෙක් හොඳට ඒකටම යොමු වෙලා, ඒකට මුළාවෙලා - හිටිගමන්ම දොර ජනෙල් එහෙම විවෘත වුනොත්, අර තිර ආදිය ඉවත් වුනොත්, මොකක්ද සිද්ධ වෙන්නෙ. එහෙම පිටින්ම සිනමා ලෝකයෙන් එළියට එනව. චිත්‍රපටිය නතර වුනෙ නැති වෙන්න පුළුවනි. නමුත් හාත්පසින්ම ආලෝකය ආව නිසා, ඒ සම්පූර්ණ ආලෝකයෙන් තිරයෙ තිබුනු සීමිත ආලෝකය මැකිල ගියා. ඒ චිත්‍රපටියේ තිබුණු ආස්වාද පක්ෂය නැතිවෙලා ගියා. මෙන්න මේ විඤ්ඤාණය පිළිබඳවත්, ඇත්ත වශයෙන්ම විඤ්ඤාණය ගැන කියනවනම්, විඤ්ඤාණයත් පඤ්ඤවත් අතර වෙනස බලන කොට මේවා එහෙම පිටින්ම එකිනෙකට සම්බන්ධ නැති දේවලුත් නෙවෙයි. ඒක අර මහා වෙදල්ල සූත්‍රයෙ එහෙම දක්වල තියෙනව. ඒ වගේම මේ දෙකේ වෙනසකුත් තියෙනව.

### පඤ්ඤා භාවෙතබ්බා - විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං [9]

විඤ්ඤාණය පිරිසිඳ දතයුත්තක්. විඤ්ඤාණයේ ස්වභාවය තේරුම් ගත යුත්තක්. එතකොට කෙනෙක් අහන්න පුළුවන් "කොහොමද? මේ විඤ්ඤාණයෙන් නේ අපි හැමදෙයක්ම කරන්නෙ. කොහොමද විඤ්ඤාණය තේරුම් ගන්නෙ? කියල. නමුත් බුදුරජාණන් වහන්සේ ඒකට මාර්ගයක් පෙන්නුම් කරල තියෙනව. 'පඤ්ඤා භාවෙතබ්බා - විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං' භාවිත වූ ප්‍රඥාවෙන් - ප්‍රඥාව භාවිත වෙන කොට, විඤ්ඤාණය පිරිසිඳ දැනගන්න පුළුවන් වෙනව. කොටින්ම කියනව නම්, විඤ්ඤාණය අර සීමිත ආලෝකය වගේ පටුයි. අභිසංඛත විඤ්ඤාණය. සාමාන්‍ය නොරහත් විඤ්ඤාණයට අපි යෙදූ වචනය තමයි 'අභිසංඛත විඤ්ඤාණය' - නාමරූපයේ හිරවෙලා තියෙන විඤ්ඤාණය. තිරයෙ බැඳිල තියෙන නරඹන්නන්ගේ ඇස් දෙක වගේ. ඔන්න ඔය විදියට සීමිත පටු ස්වභාවයක් තියෙනව සාමාන්‍ය ලෝකයාගේ විඤ්ඤාණයේ. මේක ප්‍රඥාවෙන් එහෙම පිටින්ම ආලෝකවත් වූ

හැටියෙ සිද්ධ වෙන්නෙ කුමක්ද ? "සබ්බතො පභං" හැම පැත්තෙන්ම ප්‍රභාව ආවාම අර ඉස්සෙල්ල තිබුන අවිද්‍යා අඳුරු රාමුව ඉවත් වෙනව. ඒ අවිද්‍යා අඳුරු රාමුවෙන් මිදුන විමුක්ත විඤ්ඤාණයයි මෙතන 'සබ්බතොපභ විඤ්ඤාණය" කියල කියන්නෙ.

"විඤ්ඤාණං අනිදස්සනං- අනන්තං සබ්බතොපභං" මේ ප්‍රභාවෙ, මේ ප්‍රඥාව පිළිබඳ ප්‍රභාවෙ, විශේෂ අර්ථයක් තියෙනව සූත්‍ර දේශනාවල. **"චතස්සො ඉමා භික්ඛවෙ පභා කතමා චතස්සො. චන්දප්පභා සූරියප්පභා. අග්ගිප්පභා පඤ්ඤාපභා ඉමා බො භික්ඛවෙ චතස්සො පභා එතදග්ගං භික්ඛවෙ ඉමාසං චතස්සන්නං පභානං යදිදං පඤ්ඤාපභා"**[10]

අංගුත්තර නිකායෙ චතුක්ක නිපාතයේ සූත්‍රයකයි මෙහෙම සඳහන් වෙන්නෙ. "චතස්සො ඉමා භික්ඛවෙ පභා" මහණෙනි මේ ප්‍රභාවෝ හතර දෙනෙක් ඇත. මේ ආලෝක හතරක් ඇත. "කතමා චතස්සො" - මොනවද හතර, චන්දප්පභා- චන්ද්‍රප්‍රභාව, සූරියප්පභා- සූර්‍ය ප්‍රභාව,අග්ගිප්පභා- අග්නි ප්‍රභාව. පඤ්ඤාප්පභා- ප්‍රඥා ප්‍රභාව. ඉමා බො භික්ඛවෙ චතස්සො පභා මේවායි මහණෙනි ප්‍රභා හතර, එතදග්ගං භික්ඛවෙ ඉමාසං චතස්සන්නං පභානං යදිදං පඤ්ඤාප්පභා. මහණෙනි මේ ප්‍රභා හතර අතුරින් ප්‍රඥා ප්‍රභාවම අග්‍රයි. ඒ වගේම වටිනා සූත්‍රයක් නිතර උද්ධෘත වශයෙන් දක්වනව අර්ථය තේරුම් ගත්තත්, නැතත්- "පභස්සරමිදං භික්ඛවෙ චිත්තං. තඤ්ච බො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං තං අස්සුතවා පුථුජ්ජනො යථාභූතං නප්පජානාති. **තස්මා අස්සුතවතො පුථුජ්ජනස්ස චිත්තභාවනා නත්ථීති වදාමි. පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච බො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි විප්පමුත්තං තං සුතවා අරියසාවකො යථාභූතං පජානාති. තස්මා සුතවතො අරියසාවකස්ස චිත්තභාවනා අත්ථීති වදාමි"** 'පභස්සරං ඉදං භික්ඛවෙ චිත්තං' මහණෙනි මේ සිත ප්‍රභාස්වරය, තඤ්ච බො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං" නමුත් ඒ සිත පිටතින් ආපු උපක්ලේශවලින් කිලිටි වෙලයි තියෙන්නේ, තං අස්සුතවා පුථුජ්ජනො යථාභූතං නප්පජානාති- මේ කාරණය ධර්මය නොදත් පෘථග්ජනයා තත්වූ පරිදි නොදනී, තස්මා අස්සුතවතො පුථුජ්ජනස්ස චිත්ත භාවනා නත්ථීති වදාමි -එමනිසා අශ්‍රැතවත් පෘථග්ජනයාට චිත්ත භාවනාවක් නැතැයි කියමි-

'පභස්සරමිද භික්ඛවෙ චිත්තං, තඤ්ච බො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි විප්පමුත්තං' - මහණෙනි මේ සිත ප්‍රභාස්වරය. එය ආගන්තුක උපක්ලේශ වලින් මිදී ඇත. 'තං සුතවා අරියසාවකො යථාභූතං පජානාති' මේ කාරණය ධර්මය අසා ඇති ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා තත්වූ පරිදි දනී, 'තස්මා සුතවතො අරියසාවකස්ස චිත්තභාවනා අත්ථීති වදාමි'[11] එම නිසා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකයාට චිත්තභාවනාවක් ඇතැයි කියමි.

මෙන්න මේ විදියට එතකොට අපට පෙනෙනවා ප්‍රභාස්වර සිත පිළිබඳවයි මේ ප්‍රකාශ කරන්නේ. අර 'අනිදස්සන, අනන්ත සබ්බතොපභ විඤ්ඤාණය'. රහතන් වහන්සේ ගේ සිත පිළිබඳවයි මෙතන මේ කියවෙන්නේ. දැන් මේක ගැඹුරුම, එහෙම නැත්නම් පුළුල්ම, අර්ථයෙන් නැතත් අපි කාරණය තේරුම් ගැනීමට ගත්ත සිනමා උපමාව නැවතත් මතක් කර ගත්තොත්, අර විදියට දවල් කාලයේ පෙන්වන චිත්‍රපටියෙ, කෙනෙක් සම්පූර්ණයෙන්ම අර චිත්‍රපටියේ නිමග්න වෙලා, එහෙම පිටින්ම සිනමා ලෝකයෙ ගැලිල ගත කරන අවස්ථාවෙ, හදිසියෙන්ම විශාල ආලෝකයක් ඇවිත් සම්පූර්ණ ශාලාවම ඒකාලෝක වුනානම් මොකද වෙන්නේ? අපි මේ දේශනාවෙ නිර්වාණය අරමුණු කරගෙන යොදාගත්ත වචන එක්තරා සීමිත අර්ථයකින් නැවතත් මතක් කරගත්තොත් "සබ්බ සංඛාර සමථයක්" - ගැන අපි සඳහන් කළා. අර චිත්‍රපටිය පිළිබඳ සංස්කාරයන් සමථය වෙනව. ඒ කියන්නේ අර නළු නිළියන්ගේ ඇඳුම් පැළඳුම් ඒව ඔක්කොම, එහෙම පිටින්ම, සමහර විට ඒක වෛවර්ණ චිත්‍රපටියක් වෙන්න පුළුවන්. වෛවර්ණ චිත්‍රපටිය විවර්ණ වෙනවා, අර ආලෝකය ආවාම. තිරයෙ තියෙන දර්ශනය, පිටතින් පැමිණි ආලෝකයෙන් එහෙම මැකිලා යනව. ඒකෙ ප්‍රතිඵලය මොකක්ද? අර පුද්ගලයාගේ සිතේ තිබුන සංස්කාරයන්, චිත්‍රපටි නිෂ්පාදකයන් විසිනුත්, තමාගේ සිතිනුත්, ඇතිකර ගත්තු අර සංස්කාර සමූහය තාවකාලිකව හරි සංසිඳෙනව. 'සබ්බසංඛාර සමථො' කියන එක සීමිත අර්ථයකින් එතැනත් ගන්න පුළුවන්. ඊළඟට "සබ්බූපධි පටිනිස්සග්ගො" කියල කියන්නෙ ඒ පුද්ගලය මමය, මගේය කියල එකතු කරගෙන තිබුන යම්තාක් අත්දැකීම් තිබුනනම් ඒ චිත්‍රපටිය ආශ්‍රයෙන් - කෙනෙක් චිත්‍රපටියක් බලන කොට අමුතු ලෝකයක ඉන්නෙ. අත්දැකීම් රාශියක් එකතු කර ගන්නව - ඒ අත්දැකීම් පොදිය ගිලිහිල යනව, ඒ මොහොතට. තණ්හක්ඛයො හොඳට ආශාවෙන් බලාගෙන හිටිය වෛවර්ණ දර්ශණයට තිබුන තණ්හාව නැතිවෙලා යනව මොහොතකට හරි. 'විරාගො' - විරාග යන වචනයෙ අර්ථ දෙකක් තිබෙන බව අපි කිව්ව. නොඇල්ම පමණක් නොවෙයි. නො ඇල්මට හේතුවන සායම සේදී යාම - පාට සේදී යාම. එතකොට අර පාට සේදිලා ගියෙ අමුතු දේකින් නොවෙයි. විඤ්ඤාණයේ සීමිත ආලෝකය ප්‍රඥවේ අසීමිත ආලෝකයෙන් වැහිල ගියා මැකිල ගියා. නිරොධො - 'නිරොධ' කියන්නේ නැවතීම. චිත්‍රපටිය එතැනම නතර උනා. සමහර විට අර යන්ත්‍ර ක්‍රියා කරනව වෙන්න පුළුවන්. නමුත් අපි කලින් සඳහන් කළා, චිත්‍රපටියක් අවසාන වශයෙන් නිෂ්පාදනය කරන්නේ නරඹන්නාමයි, ප්‍රේක්ෂකයාමයි. එතකොට නිෂ්පාදනය කළ එක්කෙනාටම තමයි චිත්‍රපටිය නවත්තන්න පුළුවන්. අන්න නිරෝධය එතනමයි. චිත්‍රපටිය එතනම නතර උනා. "නිබ්බාන" නිවීම. යම්කිසි ආවේග, උද්වේග, සංවේග ඇති වෙලා තිබුන නම් චිත්‍රපටිය නිසා, ඒව එහෙම පිටින්ම මොහොතකට හරි සංසිඳෙනව

අර ආලෝකය ආවහම. ඔන්න එතකොට අපට දන්නා දෙයින් නොදන්නා දේ පිළිබඳව - සමහර විට - යම්කිසි අවබෝධයක් මේ චිත්‍රපටි උපමාවෙන් ඇතිකරගන්න පුළුවනි. 'සබ්බතො පභං' කියන එක ඔය අර්ථයයි. දැන් එතකොට ගාථාව හුඟක් දුරට අපි විග්‍රහ කරල ඉවරයි. ඇත්ත වශයෙන්ම මුල් පදේ තියෙන වචන කීපය තමයි පෙර අපර දෙදිග උගතුන්ට මහ ලොකු ගැටලුවක් වෙලා තියෙන්නේ. අපි තවම අටුවාචාරීන් වහන්සේලාගේ මතය ඉදිරිපත් නොකළේ උන්වහන්සේලාට අගෞරවයක් නිසා නොවෙයි. ඒකත් අවිනිශ්චිතව අර්ථ කීපයක් දී ඇති නිසයි. ඒක අපි අගදී සඳහන් කරනව මේ ඉදිරිපත් කළ විවරණයත් එක්ක සංසන්දනය කිරීමට අවස්ථාවක් ලබා දීමට.

නමුත් දැනට, මේ ගාථාවෙ අවසාන පදය ගැනත් යමක් කියන්න වෙනව. අවසාන පදේ තියෙන්නේ 'විඤ්ඤාණස්ස නිරොධෙන එතෙථතං උපරුජ්ඣති. දැන් අර නාමයත් රූපයත් නිරුද්ධ උනා. ඇත්ත වශයෙන්ම නාමරූප නිරෝධය වගේ තමයි. සිනමා තිරේ තිබුන ඔක්කොම දේවල් මැකිල ගියා කියන එක වගේ නාමරූපය නැති උනා. "විඤ්ඤාණස්ස නිරොධෙන" මෙතන විඤ්ඤාණස්ස නිරොධෙන කියන්නේ මක් නිසාද? අර අභිසංඛත විඤ්ඤාණයයි මෙතැන කියවෙන්නේ. අර කලින් තිබුන අභිසංඛත විඤ්ඤාණයෙ නිරෝධයයි. 'විඤ්ඤාණස්ස නිරොධෙන - එතෙථතං උපරුජ්ඣති". ඒ අභිසංඛත විඤ්ඤාණයාගේ නිරොධයෙන් මේ සියල්ල උපරෝධනය වෙනව. දැන් මෙතනත් පොඩි ගැටළුවක් තියෙනව. සාමාන්‍යයෙන් 'නිරුජ්ඣති' 'උපරුජ්ඣති' කියන වචන සමානාර්ථවත් වචන හැටියටයි සැළකෙන්නෙ. බොහෝ සූත්‍රවල සමානාර්ථවත් හැටියට සමහර විට පිළිගන්නත් පුළුවන් විදියට පෙනෙනව. වෙන එකක් තබා මහා නිද්දේස ආදී පැරණි අටුවාවලත් 'උපරුජ්ඣතීති, නිරුජ්ඣති ' කියල ඒ විදියටත් අර්ථ විග්‍රහ කරල තියෙනව. නමුත් මේ ගාථාවෙ ඊට වඩා යම් කිසි ගැඹුරක් තියෙන බව අපට පේනව, මේ එක ගාථා පදයෙන් පවා. "විඤ්ඤාණස්ස නිරොධෙන - එතෙථතං උපරුජ්ඣති '- එතකොට විඤ්ඤාණය නිරුද්ධ වීමකුත් නාමරූපය ගැන 'උපරුජ්ඣති' කියල වචනයකුත් කියවිල තියෙනව. මෙතන යම්කිසි විශේෂයක් තියෙනව. එපමණක් නොවෙයි. අපි එදා යන්තමින් සඳහන් කළා, මේ ගාථා ධර්මය දේශනා කිරීමට බුදු පියාණන් වහන්සේ අරමුණු කළ අවස්ථාව පිළිබඳව, යම්කිසි පසුබිමක් හැටියට. මේකට හේතුඋනේ එක්තරා භික්ෂුවකට ඇතිවුන ගැටළුවක්. ඒ ගැටළුව කුමක්ද? නිකං ඉන්න වෙලාවට හිතිච්ච අදහසක්, ප්‍රශ්නයක්, මොකක්ද? 'කත්ථ ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති. " එතන තියෙන්නේ 'නිරුජ්ඣන්ති' කියන වචනයයි. පළමුවෙන්ම මේ භික්ෂුවට ඇති වුනේ 'නිරුජ්ඣන්ති' කියන වචනයත් සම්බන්ධ ප්‍රශ්නයක්. ඒ කියන්නේ 'කොතැනක නම් මේ සතර මහා භූතයෝ නිරුද්ධ වෙත්ද'

කියන ප්‍රශ්නයයි මේ භික්ෂුවට ඇති වුනේ. ඉතින් මේක නිරුද්ධ වෙච්ච තැන හොයා ගන්න දිව්‍යලෝක බ්‍රහ්මලෝක ඔස්සේ මේ භික්ෂුව ගියා. අපි ඒ කාරණය කලින් සඳහන් කළා. අන්තිමේදී මහා බ්‍රහ්මයා "ඇයි මෙච්චර දුර ආවේ, බුදු පියාණන් වහන්සේ ඉදෙද්දී" කියල. බුදුපියාණන් වහන්සේ ළඟට යැව්වහම බුදුපියාණන් වහන්සේ පළමුවෙන්ම කළේ ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම නොවෙයි. 'මහණ මේ ප්‍රශ්නය ඇසූ හැටිම වැරදියි. මේකෙ පොඩි සංස්කරණයක් - ශුද්ධ කිරීමක්- කරන්න ඕන කියල කලින්ම ප්‍රශ්නය සුද්ධ කරල දුන්න. කොහොමද ශුද්ධ කළේ?

> කත්ථ අපොච පඨවී - තෙජො වායො න ගාධති
> කත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
> කත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති.

මෙන්න මේ විදියටයි අහන්න ඕන කියල එතන බුදුරජාණන් වහන්සේ යෙදුවෙ 'නිරුජ්ඣති' කියන වචනය නොවෙයි 'උපරුජ්ඣති' කියන වචනයයි. අන්න එතනත් විශේෂත්වයක් තියෙනව. 'කත්ථ ආපොච පඨවී - තෙජො වායො න ගාධති', එතන අමුතුම වචනයක් තියෙනව - න ගාධති - කොතැනක නම්, පඨවි, ආපෝ, තෙජෝ, වායො කියන මහාභූතධර්ම 'න ගාධති' - ගාධති කියන්නේ ප්‍රතිෂ්ඨාවක් - පිහිටීමක්, නොලබයිද? කොටින්ම කියනවනම් ගාධති කියන වචනය යොදනව සමහර විට ජලාශයක ගැඹුර මැනීමට. අපි අර කලින් කියාපු උපමාවත් සිහිගන්වගන්න පුළුවන්, රූප සංඥාව මගින් විඤ්ඤාණයේ ගැඹුර මනිනව කියල කිව්ව එක. මේ ධාතු හතර ප්‍රතිෂ්ඨාවක් නොලබන්නෙ කොතැනද ? 'කත්ථ ආපොච පඨවි - තෙජෝ වායො න ගාධති. ඒවගේම - කත්ථ දීඝඤ්ච රස්සඤ්ච -අණුං ථූලං සුභාසුභං - දිග - කොට, අණු -සථූල, සුභ-අසුභ, ඒ වගේම "කත්ථ නාමංච රූපංච අසෙසං උපරුජ්ඣති". ඒ නාමයත් රූපයත් - අසෙසං- සම්පූර්ණයෙන්ම - උපරුජ්ඣති - මෙතන නිරුජ්ඣති කියන වචනය කිට්ටු කරගත්තේවත් නැහැ බුදු පියාණන්වහන්සේ. මෙතනදී අමුතු පද යොදල තියෙනව'න ගාධති'. ඒවගේම උපරුජ්ඣති. ඔන්න ඔතනිනුත් අපට පෙනෙනව 'නිරුජ්ඣති' ත් 'උපරුජ්ඣතිත්' අතර යම්කිසි සියුම් අර්ථ භේදයක් තියෙනව කියල. මේකෙ රහස කුමක්ද? මේ භික්ෂුවට ඇතිවුන ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම මේ කාලයේ භෞතිකවාදීන්ට එහෙම ඇති වෙන විදියෙ ප්‍රශ්නයක්. මේක මිථ්‍යා ප්‍රශ්නයක්. සතර මහාභූතයින් ලෝකයේ, එහෙම නැත්නම් විශ්වයේ, යම්කිසි තැනක නිරුද්ධ වෙනව කියන එක. එක්තරා විදියක න්‍යාය විරෝධී, කියමනක්. ඒ .මොකද? 'කොතැනක නිරුද්ධ වෙනවද' කියල ඇහුවම ඒ 'තැන' ගැනත් සඳහන් කරන්න වෙන්නෙ සමහර විට ධාතු මුල් කරගෙන. අන්න අහවල් තැනය කියල. මේක එක්තරා විදියක ඖළාරික, භෞතිකවාදී සාමාන්‍ය ලෝකයා අහන විදියේ ප්‍රශ්නයක්. ඒක නිසා තමයි බුදු පියාණන්

වහන්සේ ඒ ප්‍රශ්නය සංශෝධනය කළේ. එහෙම නොවෙයි, මහණ අහන්න තියෙන්නේ.- හතරමහාභූතයන් කොතැනක නිරුද්ධ වෙනවද කියල නොවෙයි අහන්න තියෙන්නේ. සතරමහාභූතයිනුත්, එපමණක් නොවෙයි අර දිග-කොට, අණු-සථූල, සුභ-අසුභ ආදී ප්‍රඥප්තිත් නාමයත්, රූපයත් මේව උපරෝධනය වන්නෙ කොහේද? සතරමහා භූතයින් නොපිහිටන්නේ කොහේද? අරව උපරෝධනය වන්නේ කොහේද? අන්න එතකොට බුදුපියාණන් වහන්සේ ලෝකයා සාමාන්‍ය දෙයක් හැටියට සළකන රූප සංඥව පිළිබඳ ප්‍රශ්නය සිතට සම්බන්ධකරල දක්වනව. සතරමහාභූතයින්ගේ හොල්මන් තියෙන්නේ සිතේමයි. මේ ලෝක සත්තවයාගේ සිතේ තමයි මේ සතර මහා භූතයින් හොල්මන් කරන්නේ. එතකොට හොල්මන කරන තැනින්මයි පන්නන්න ඕනෑ. මේක ලෝකයේ හෝ දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝක අතර තැනක හෝ සක්වළ කෙළවරක හෝ ඒ විදියේ තැනක නොවෙයි. එතකොට සතරමහාභූතයිනුත්, ඔවුන්ගේ හොල්මනුත් නතර කළ හැක්කෙ මේ විඤ්ඤාණයේමයි. මේ සිතේමයි. ප්‍රඥ ප්‍රභාව, ආලෝකය, ගෙනාවම අර භූතයින් එහෙම නැතිවෙලා යනව වගේ සතර මහා භූතයින් ගේ බලපෑම නැතිවෙලා යනව. ඒ හොල්මන් නැතිවෙලා යනවා ප්‍රඥ ප්‍රභාව හමුවේ. අඳුරෙ තමයි සතර මහා භූතයින් රූප සංඥවෙන් ලෝකයා පොළඹවන්නේ. ලෝකයාගේ සිත බැඳල, අලවල, කොටුකරල, පටුකරල තබාගන්නේ. එතකොට කලින් ඇලී, බැඳී , කොටුවී, පටුවී තිබුන විඤ්ඤණය- අභිසංඛත විඤ්ඤණය- අර ප්‍රඥා ප්‍රභාව නිසා අනිදස්සන, අනන්ත,සබ්බතොපභ විඤ්ඤණයේදී සම්පූර්ණ විමුක්තිය ලබනව. ඔන්න ඔය විදියට අපට තේරුම් ගන්න පුළුවන් මේ 'විඤ්ඤණං අනිදස්සනං' ආදි ගාථාව. හැබැයි අපි තවම අටුවාව ගැන යමක් කීවේ නැහැ. ඒක සමහර විට දෝෂයක් වෙන්න පුළුවනි. ඒක නිසා අපි දැන් අටුවාව මේ පිළිබඳව කරන විවරණයත් ඉදිරිපත් කරමු.

බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ සුමංගල විලාසිනී දීඝනිකාය අටුවාවේදී මේ කෙවඩ්ඪ සූත්‍රය පිළිබඳව එක් එක් වචනය අරගෙන විග්‍රහ කරනව. ඊට කලින් - මේ මූලික ගාථාවට කලින් - අපට කියන්න වෙනව, බුදුපියාණන් වහන්සේ අර භික්ෂුව ඇසූ ප්‍රශ්නය සංශෝධනය කළා නේ. ශුද්ධ කළා නේ. අන්න ඊට හේතුව පිළිබඳවත් අටුවාචාරීන් වහන්සේ එක්තරා අදහසක් දක්වනව. ඒ කියන්නේ, අර භික්ෂුව 'කොතැනක මේ සතරමහාභූතයින් නිරුද්ධ වෙනවද? කියන ප්‍රශ්නය ඇසුවෙ උපාදින්න අනුපාදින්න වශයෙන් කියන දෙඅංශයම අල්ලලාය. බුදුපියාණන් වහන්සේ ප්‍රශ්නය අර විදියට සංස්කරණය කළේ උපාදින්නයට සීමා කිරීමටය. ඒ කියන්නේ මේ මනුෂ්‍ය ශරීරයට සීමා කරල මේ ප්‍රශ්නය තේරුම් කරන්න ඕන නිසාය, බුදු පියාණන් වහන්සේ ප්‍රශ්නය සංශෝධනය කළේ කියල. එහෙම හිතාගෙන අර දීඝං,රස්සං

ආදී පද - ඒ ප්‍රශ්න, ගාථාවේ තියෙන "කත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති. කත්ථ දීඝංච රස්සංච ආදී වශයෙන් එතන සඳහන් වෙන වචන, අටුවාචාරීන් වහන්සේ තෝරන්නේ උපදින්න වූ ශරීරයට සීමා කරගෙනයි.

ඒ අනුව තෝරනව - මේක කියන කොටත් සමහර විට කෙනෙකුට හිතා ගන්න පුළුවනි මේක කොයිතරම් ගැලපෙනවද කියල. - තෝරන්නෙ මෙහෙමයි. 'උපාදින්නං යෙව සන්ධාය පුච්ඡා[12] ප්‍රශ්නය උපාදින්නය ඇසුරු කරගෙනයි. 'දීඝං රස්සං' කියල කියන්නේ. දිග කොට කියල කියන්නෙ, යම්කිසි පුද්ගලයකුගේ ශරිරයේ උස්බව, මිටිබව පිළිබඳවය. 'අණුංථූලං' කියන්නෙත් කුඩා බව, මහත් බව, ශරිරය පිළිබඳව - 'උපාදින්නං යෙව සන්ධාය' ඒ විදියටමයි එතනත් තෝරන්නේ. 'සුභාසුභ' කියල කියන්නේ පුද්ගලයකුගේ ශරිරයේ ලක්‍ෂණ අවලක්‍ෂණ ස්වභාවය ගැනයෙ. ඊළඟට 'නාමං ච රූපංච' කියන එක ඒ ඔක්කෝටම වඩා පුදුම විදියට තෝරනව. එතන 'නාමං' කියල කියන්නෙ අර පුද්ගලයගේ නමය.'රූපං' කියල කියන්නෙ අර පුද්ගලයාගේ රූපයය. දැන් මෙතන පෙනනව අර තරම් ගැඹුරු, නිවන පිළිබඳවවූ ගැඹුරු ගාථා ධර්‍මයකට ආමුඛය ප්‍රස්තාවනාව වන මේ ගාථාවේදීම අටුවාචාරීන් වහන්සේට වැරදිල තියෙනව. මුලදීම වැරදීමක් කරගෙන තියෙනව. ඒ කියන්නේ මේ මනුෂ්‍යශරීරයට සීමාකරල, අර තරම් ගැඹුරු ගාථාවේ අර්ථය යටපත් වන අන්දමටයි මෙතන තෝරල තියෙන්නේ. 'දීඝං රස්සං අණුංථූලං' ආදි පදවල තිබෙන සාපේක්‍ෂක ධර්‍මතාව - ඒ කියන්නේ මේ පදවල ශබ්ද ධර්‍මය පිළිබඳව, භාෂාව පිළිබඳව ඇති ධර්‍මතාව මෙතන යටපත් වෙලා තියෙනව. දිග කොට අණු ස්ථූල කියල කියන්නේ අර පුද්ගලයාගේ උස මහත නොවෙයි. මේ අර ප්‍රඥප්ති පිළිබඳව, සංකල්ප පිළිබඳව, ලෝකයේ තියෙන ද්වයනිශ්‍රිත ස්වභාවයයි, මෙයින් හැඟෙන්නෙ. ඒ ඔක්කොම යටපත් වෙනව මේක පුද්ගලයකුගෙ හැඩරුව හැටියට ගත්තම. 'සණ්ඨාන වසෙන' කියල ඔය විදියටයි තෝරන්නේ. ඉතින් අර ඔක්කොටම වඩා 'නාමඤ්ච රූපඤ්ච' කීම නමත් රූපයත් හැටියට ගැනීමෙන් ඇත්ත වශයෙන්ම විඤ්ඤාණං අනිදස්සනං කියන ගාථාව ඉදිරිපත් කරන්නත් කලින්ම අර්ථය ඉතාමත්ම ලිහිල් බවට පත් කරගෙන තියෙනව. එතකොට මේ විධියෙ ලිහිල් පදනමක ඉඳගෙනයි ඊළඟට අර "විඤ්ඤාණං අනිදස්සනං" ආදි ගාථාව තෝරන්නෙ. ඒ අර්ථ විවරණයත් අපට පුළුවන් තරමින් - ශක්ති ප්‍රමාණයෙන් - ඉදිරිපත් කරන්න බලමු. මේ හැම එකකටම පාළි පාඨත් කියන්න වෙනව. ඉඳහිටල සමහර විට අතහැරෙන්න පුළුවනි.

එතන 'විඤ්ඤාණං' කියන වචනෙ ඉඳලම පටන් ගන්නව අටුවාචාරීන් වහන්සේ. 'විඤ්ඤාණන්ති තත්ථ විඤ්ඤාතබ්බන්ති විඤ්ඤාණං නිබ්බානස්ස නාමං' මෙතන විඤ්ඤාණ කියන පදයට නිරුක්තිය හැටියට දක්වන්නේ

'විඤ්ඤාතබ්බන්ති' දතයුතුය කියන අර්ථයෙන් විඤ්ඤාණ කියන එක නිවනටම නමක්ය. ඒ කියන්නේ, නිවනට නමක්ය මෙතන මේ 'විඤ්ඤාණය' කියන වචනය. ඒක නිවන බව හඳුනන්නේ කොහොමද? 'විඤ්ඤාතබ්බං' - 'දතයුතු දෙයක්' කියන අර්ථයෙන්. එතන විඤ්ඤාණයට දෙන මේ නිරුක්තියත් ගැලපෙන්නෙ නැහැ. දත යුතුය කියන අර්ථයෙන් 'විඤ්ඤාණං' කියල යෙදෙන්නෙ නැහැ, සාමාන්‍යයෙන්. එපමණක් නොවෙයි, නිවනට යොදන පද රාශියක්, අසංඛත සංයුක්තයේ පද 33ක්ම දක්වල තියෙනව, පෙලගස්වල. එක තැනකවත් 'නිවන' 'විඤ්ඤාණ' නමින් හඳුන්වල නැහැ. ඇත්ත වශයෙන් සූත්‍රපිටකයේ කිසිම තැනක නිවන 'විඤ්ඤාණ' නමින් හඳුන්වල නැහැ. එතකොට මෙතන මුල් වචනයම පිළිගන්න අමාරුයි. "විඤ්ඤාතබ්බන්ති විඤ්ඤාණං නිබ්බානස්ස නාමං" මේ නිබ්බානයටම නමක්ය විඤ්ඤාණය කියන එක. 'අනිදස්සන' කියන එක ඊළඟට තෝරන්නෙ 'තදෙතං නිදස්සන අභාවතො අනිදස්සනං' ඒ නිවනට නිදර්ශනයක් නැතිනිසා ඒකට සම කළ හැකි දෙයක් නැති නිසා ඒක 'අනිදස්සන' වෙනවය කියල. අපි අර කලින් ඉදිරිපත් කළ මතත් එක්ක මේව සන්සන්දනය කරල බලන එකයි තියෙන්නේ. අපි එකක්වත් ඒකාන්ත වශයෙන් කියනව නොවෙයි. එතකොට මෙතන 'අනිදස්සනං' කියන එක තෝරන්නේ නිදර්ශනයක් නැති නිසා, ඒකට උපමා කළ හැකි දෙයක් නැති නිසා ඒක 'අනිදස්සනං'. නිවනම අනිදස්සන හැටියට හඳුන්වනවය. ඊළඟට 'අනන්තං' කියන එක තෝරන්න ගියාම ඒක තෝරන්නෙ නිවන පිළිබඳව 'උප්පාදන්තයක්' 'වයාන්තයක්' සහ 'ඨිතස්ස අඤ්ඤථත්ත'අන්තයක් කියල එතන අන්ත තුනක්ම දක්වනව. අටුවාචාරීන් වහන්සේ කියනව මේ නිවනට උප්පාදන්තයකුත් නැත වයාන්තයකුත් නැත. 'ඨිතස්ස අඤ්ඤථත්ත' කියල කියන අතින් මැද අවස්ථාව - ඒ කියන 'අන්තයත්'නැත. අන්න ඒ අර්ථයෙන්ය නිවන 'අනන්ත' වන්නේ. ඒ විදියට අනන්ත කියන පදයත් තෝරනව. - 'විඤ්ඤාණං, අනිදස්සනං, අනන්තං'.

ඊළඟට මේ ඔක්කොටම වඩා ව්‍යාකූල වෙන්නේ "සබ්බතොපභං" කියන පදය තෝරන්න ගියාමයි. මේ 'සබ්බතො පභං' කියන එක තේරීමේදී අටුවාචාරීන් වහන්සේ මේ 'පභං' කියන වචනය තෝරන්නේ 'පභන්ති පන එතං කිර තිත්ථස්ස නාමං' පැන් තොටක් හැඳින්වීමට යොදන වචනයක් හැටියටයි මේ 'පභං' කියන වචනය තෝරන්නේ. සාමාන්‍යයෙන් පැන්තොටට යොදන්නේ "පපා' - 'ප'යන්නයි එතන තියෙන්නෙ. මෙතන අටුවාචාරීන් තෝරන්නේ "පකාරස්ස පන හකාරො කතො" ඒ කියන්නේ 'ප'යන්නට 'හ' යන්න ආදේශවෙලා. 'පපං' කියන එක වෙනුවට පභං කියල යෙදිල තියෙනවය. ඇත්ත වශයෙන් එතකොට වචනය 'සබ්බතො පපං' - 'හැම පැත්තෙන්ම පැන්තොටවල් තිබෙන නිසා'. මේකට අමුතු විදියට විවරණයක් දෙන්නෙ. 'නිවන නමැති මහ මුහුදට බැස ගැනීමට හැම පැත්තෙන්ම කමටහන් පැන් තොටවල් තියෙන නිසා නිවනට 'සබ්බතො පභං' කියනවය.

'සබ්බතො පහං' කිව්වට ඇත්ත වශයෙන්ම 'සබ්බතො පපං' ය. ඔන්න ඔය විදියටයි තෝරන්නේ. මේක කොයිතරම් දුරට පිළිගත හැකිද කියල නුවණින් කල්පනාකර බැලිය යුතුව තිබෙනව. මෙතනට 'පැන් තොටක කථාවක්' අවශ්‍ය නැහැ. මේ 'පහා' කියන වචනය යොදන්නෙ 'ආලෝකය' පිළිබඳවයි. ඊට වඩා ප්‍රකටව සූත්‍රධර්මයේ 'පහා' කියන වචනය යෙදිල තියෙනව නිවන පිළිබඳව. ඔන්න ඔය විදියට 'සබ්බතොපහං' කියන වචනය තෝරනව. ඒ සුමංගල විලාසිනී අටුවාවෙදී. අපට විශේෂයෙන් තවත් කාරණයක් කියන්න සිඩවෙනව. මැදුම් සඟියේ 'බ්‍රහ්මනිමන්තනික' සූත්‍රයෙත් 'විඤ්ඤාණං අනිදස්සනං' ආදී මේ ගාථාවෙ මුල්පදය පමණක් සඳහන් වෙනව එක්තරා සූත්‍රප්‍රදේශයක. 'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතොපහං' ආදී වශයෙන් බ්‍රහ්ම නිමන්තනික සූත්‍රයෙත් සඳහන් වෙනව. මෙතන මහ පුදුම දෙයක් සිඩ වෙනව. 'පපඤ්චසූදනී අටුවාව කළෙත් බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේමයි. නමුත් එතනදී අර දුන්න විවරණය වෙනස් කරල තියෙනව. ඒ විවරණය අමුතුම මාර්ගයක් අරන් තියෙනව - බ්‍රහ්මනිමන්තනික සූත්‍ර අටුවාවෙදී. එතනදී 'අනිදස්සනං' කියන එක තෝරන්නෙ අර කලින් වගේ නිවනට නිදර්ශනයක් නැතෙයි කියන විදියට නොවෙයි. "චක්ඛුවිඤ්ඤාණස්ස ආපාථං අනුපගමනතො අනිදස්සනං නාම"[13]. ඒ කියන්නේ, "ඇසට හමුවෙන්නෙ නැත" කියන එක. චක්ඛු විඤ්ඤාණ ආපාථයට නොපැමිණෙන නිසා, ඇහැට පෙනෙන දෙයක් නොවන නිසා, නිවනට 'අනිදස්සන' කියල කියනව කියල එතනදී තෝරනව. නිවන ඇහෙන් බලල බලාගන්න පුළුවන් දෙයක් නොවන නිසා. 'අනිදස්සනං' කියන එක ඒ විදියට තෝරල, ඊළඟට 'සබ්බතො පහං' කියන පදය තේරීමේදී විකල්ප අර්ථ කීපයක්ම දෙනව. මෙහෙමත් වෙන්න පුළුවන්, මෙහෙමත් වෙන්න පුළුවන් කියල අර්ථ ගණනාවක්ම දක්වනව. පළමුවෙන්ම වගේ දක්වනව"සබ්බතොපහන්ති සබ්බතොපභාසම්පන්නං නිබ්බානතොහි අඤ්ඤධම්මො සප්පභතරො වා ජොතිමන්තතරො වා, පරිසුද්ධතරොවා පණ්ඩරතරො වා නත්ථි' ඒ විදියට පළමුවෙනි අර්ථකථනය කරනව. 'සබ්බතො පභා සම්පන්නං' හැම දේකටම වඩා ආලෝකවත්. ඒ අර්ථයෙන් නිවන 'සබ්බතො පහංය'. ඊළඟට ඒකට හේතුව දක්වන්නේ නිවනට වඩා ආලෝකවත් වූ හෝ ජෝතිමත් වූ හෝ ඒ කියන්නේ දීප්තිමත් වූ හෝ පිරිසිදු වූ හෝ සුදුවූ හෝ වෙන ධර්මයක් නැත. නිවන සුදුපාටයි කියන එකත් මෙතන කියැවෙනව. එතකොට මේ කියන හැටියට නිවනට වඩා ආලෝකවත්, දීප්තිමත්, සුදුවූ, පිරිසිදුවූ, දෙයක් නැති නිසා ඒකට ' සබ්බතො පහං' කියල කියනව. මෙතන මේ නිරුක්ති දැක්වීමේදී 'සබ්බ තො' කියල වෙන් කරල ගැනීමත් තුල්‍යාර්ථය - සමාන කිරීමේ අර්ථය - ගැනීමත් සුදුසු නැහැ. ඇත්ත වශයෙන් සබ්බතො පහං කියන එකේ දිසා අර්ථයයි ගත යුත්තේ. 'හැමපැත්තෙන්ම' කියන එකයි. මෙතන අරගෙන තියෙන්නේ සබ්බතො හැමදෙයටම වඩා - අන්න එහෙමයි

අටුවාවෙදී විග්‍රහ කරල තියෙන්නෙ. ඔන්න ඔය විදියට පළමුවෙනි අර්ථ කථනය දීල ඊළඟට තවත් එකක් දෙනව. 'සබ්බතො වා පභූ' එහෙම ගන්නෙ නැත්නම්, තවත් ක්‍රමයක් දෙනව ඕන කෙනෙකුට ඒකත් පිළිගන්න. 'සබ්බතො වා පභූ' - හැම දෙයටම වඩා ප්‍රභූය. ප්‍රභූ කියල කියන්නේ ප්‍රධානය. ශ්‍රේෂ්ඨය කියන අර්ථයෙන්. අර 'පභා' කියන වචනයට කිට්ටු නිසා ඒකත් අරගෙන තියෙනව. 'සබ්බතො වා පභූ'. හැමදෙයටම වඩා ප්‍රභූ. එතනත් කියනව 'අසුකදිසාය නාම නිබ්බානං නත්ථීති න වත්තබ්බං' - අසවල් දිසාවෙහි නිවන නැතෙයි කියල නොකිය යුතු නිසාත්, පෙරදිග ආදී කිසිම දිසාවක නිවන නැත්තේයයි නොකිය යුතුය, යන අර්ථයෙන් ඒ හැම පැත්තේම තිබෙන නිසා ඒකට 'ප්‍රභූ' කියල කියනව. ඔය විදියට තවත් අර්ථයක් දීල. ඊළඟට තුන්වැනිව තමයි නිවන පිළිබඳව සුමංගල විලාසිනියෙ දැක්වූ අර පැන්තොට පිළිබඳ කථාවත් ඒ විදියටම උපුටා දක්වන්නේ.

එතකොට මෙහෙම උපමා විවරණ කීපයක් දීමට හේතුව කුමක්ද? මේ තරම් වටිනා ගාථාවකට. බුදුපියාණන් වහන්සේ එකිනෙකට නොගැලපෙන අර්ථ සහිතව නොවෙයි මේ දේශනාව කරල තියෙන්නෙ. අටුවාචාරීන් වහන්සේලා මේ ධර්මය රැකගන්න ලොකු උත්සාහයක් දරල තියෙනව. නමුත් අවාසනාවකට වගේ යම්කිසි ඓතිහාසික හේතුවක් නිසා මේ ගැඹුරු නිර්වාණ ප්‍රතිසංයුක්ත සූත්‍ර රාශියකම - වෙන එකක් තබා පාඨාන්තර පිළිබඳව වත් ශුද්ධියක් නැතිව අටුවාචාරීන් වහන්සේලාට කරකියා ගත හැකි දෙයක් නොමැතිව, මෙහෙමත් වෙන්න පුළුවන් මෙහෙමත් වෙන්න පුළුවන්, මෙහෙම ගන්නවානම් මේක මේ විදියට පෙන්වන්න පුළුවන් කියල, ඔහොම අනියත වශයෙන්ම කියනව. මේව මේ විදියට තියෙන නිසාම අපත් ඒ විදියට පිළිගත යුතුද ? එහෙම නැතිනම් මේවා තේරුම් ගතයුතු යම්කිසි ක්‍රමයක් තියෙනවනම් තේරුම් ගන්න උත්සාහ කළ යුතුද? කියල අපි නුවණින් කල්පනාකර බැලිය යුතුව තිබෙනව. මුල්ම දේශනාවෙදී අපි සඳහන් කළා ශූන්‍යතා ප්‍රතිසංයුක්ත දේශනා කල්යාමේදී අභාවයට යනවය, මේවායේ ගැඹුරු අර්ථ යටපත් වෙනවය කියල බුදුපියාණන් වහන්සේ දේශනා කොට වදාළ බව. ඒ අනාගත වාක්‍යයත් බොහෝ දුරට - සම්පූර්ණයෙන්ම නොවුනත් බොහෝදුරට - සත්‍යවෙලා තිබෙන බවයි අපට මේ විවරණ වලින් පෙනෙන්නේ.

බ්‍රහ්මනිමන්තනික සූත්‍රයෙන් අපි දැක්වූ ඒ පාඨය - අනිදස්සන විඤ්ඤාණය පිළිබඳ ඒ පාඨය - සඳහන් වෙන්නේ එක්තරා විශේෂ ඡේදයකයි.

'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පභං තං පඨවියා පඨවිත්තෙන අනනුභූතං ආපස්ස ආපත්තෙන අනනුභූතං, තෙජස්ස තෙජත්තෙන අනනුභූතං වායස්ස වායත්තෙන අනනුභූතං, භූතානං භූතත්තෙන අනනුභූතං, දෙවානං

දෙවත්තෙන අනනුභූතං,පජාපතිස්ස පජාපතිත්තෙන අනනුභූතං, බ්‍රහ්මානං බ්‍රහ්මත්තෙන අනනුභූතං ආභස්සරානං, ආභස්සරත්තෙන අනනුභූතං වෙහප්ඵලානං වෙහප්ඵලත්තෙන අනනුභූතං,අභිභුස්ස අභිභුත්තෙන අනනුභූතං, සබ්බස්ස සබ්බත්තෙන අනනුභූතං [14]

මේ විදියෙ අමුතු ඡේදයකයි. 'විඤ්ඤාණං අනිදස්සනං' පාඨය බ්‍රහ්ම නිමන්තනික සූත්‍රයේ සඳහන් වෙන්නේ. ඒ සූත්‍රය ගැනත් අපේ සැළකිල්ල යොමුකරන්න වටිනව. මක් නිසාද? එතනින් අර අනිදස්සන විඤ්ඤාණයේ ස්වභාවය පිළිබඳව යම්කිසි ගැඹුරු කාරණා රාශියක් මතුකරගන්න පුළුවන් නිසා. මෙතන මේ සංකල්ප 13 ක් යෙදිල තියෙනව.

'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පභං' අනිදස්සන අනන්ත සබ්බතොපභවූ මේ විඤ්ඤාණය - තං පඨවියා පඨවිත්තෙන අනනුභූතං. පෘථිවියේ පෘථිවිත්වයට යටත් නොවූවක්, ඒ විදියටම තෙජො ධාතුවේ තෙජො ස්වභාවයට, වායෝ ධාතුවේ වායො ස්වභාවයට භූතයින්ගේ භූතත්වයට, දෙවියන්ගේ දේවත්වයට, බ්‍රහ්මයින්ගේ බ්‍රහ්මත්වයට ප්‍රජාපතීන්ගේ ප්‍රජාපතීත්වයට, ආභස්සර කායික බ්‍රහ්මයින්ගේ ආභස්සරත්වයට ආදී වශයෙන් ඔය විදියට අපි පාඨය ප්‍රකාශ කරන කොටම දැනෙන්න ඇති අර පඨවිත්ත, දෙවත්ත, බ්‍රහ්මත්ත වැනි පද යෙදුන කීප වරක්ම. එයින් කියවෙන්නේ මේ කියන සංකල්පවලට ලෝකයා දෙන යම්කිසි ස්වභාවයක් සත්‍යතාවක් තිබෙනවනම් - පඨවියේ පඨවිත්වයක් තියෙනව කියල ලෝකයා විශ්වාස කරනව. පොළොවෙහි පොළෝබවක් තිබෙනව. පොළෝ ස්වභාවයක්. ආපෝ-දියෙහි දිය ස්වභාවයක් තියෙනව. මේව දැඩිව ගන්නව ලෝකයා. එපමණක් නොවෙයි දෙවියන්ට දේවස්වභාවයක් තියෙනව බ්‍රහ්මයට බ්‍රහ්ම ස්වභාවයක් තියෙනව කියල හිතනව. ඔන්න ඔය විදියට මේ කියපු ස්වභාවත් අර අනිදස්සන විඤ්ඤාණයට බලනොපාන බවයි මෙතනින් කියවෙන්නේ. මේ බ්‍රහ්මනිමන්තනික සූත්‍ර පාඨයේ දළ අර්ථය, සාමාන්‍ය අර්ථය. අනිදස්සන විඤ්ඤාණය අර කියාපු පඨවි, ආපො, තෙජො, වායො ධාතුන්ගේත්. අර දේව බ්‍රහ්ම ආදි සංකල්පවලත් තිබෙන ඒ ස්වභාවයට යටත් නොවූවක්, කියල බුදුපියාණන් වහන්සේ එතනදී ප්‍රකාශ කරන්නේ. ඇත්ත වශයෙන්ම එතන ඒ කථාන්තරය පිළිබඳ පරිසරයත් පසුබිමත් සමහර විට උපකාරවන්න පුළුවනි - අර බ්‍රහ්මයාට ඇතිවුන එක්තරා මිථ්‍යාදෘෂ්ටියක් නිසා - මම නිත්‍යය සදාකාලිකය, අජරාමරය කියල ඔය විදියට බක බ්‍රහ්මයට ඇතිවුන මානය බිඳීමටයි බුදුපියාණන්වහන්සේ බ්‍රහ්මලෝකයට වැඩම කරල මෙන්න මේ සූත්‍රදේශනා පාඨයත්, තවත් ඒ විදියේ දෙශනා කීපයකුත් කළේ. දැන් මෙතන කියවෙන්නේ රහතන් වහන්සේගේ විඤ්ඤාණය, - විමුක්ත පුද්ගලයාගේ අනිදස්සන විඤ්ඤාණය - මේ කියාපු සතරමහා භූතයින්ට අයත් ස්වභාවයන්ටවත්, ඒ වගේම දේවත්වය, බ්‍රහ්මත්වය ආදි ඒ සංකල්ප වලට ලෝකයා ආරෝපණය. කරන සත්‍යතාවට වත් යටත් වෙලා නැත. ඒවා මේ විඤ්ඤාණයේ නොපිහිටයි කියන අදහසයි මෙතන කියවෙන්නේ.

# අධෝලිපි

1. අං.නි. IV 110 පිට (බු.ජ.23)
2. ම.නි. I 320 පිට (බු.ජ.10)
3. ම.නි. II 132 පිට (බු.ජ.11)
4. සං.නි. III 180 පිට (බු.ජ.15)
5. මහා පුණ්ණම සු.ම.නි. III 118 පිට (බු.ජ.12)
6. ම.නි. III 500 පිට (බු.ජ.12)
7. දුතිය නිබ්බාන සු. උද.ඛු.නි. I 290 පිට (බු.ජ.24)
8. ප.දී. 261 පිට (හේ.මු.)
9. ම.නි. I 686 පිට (බු.ජ.10)
10. අං.නි. II 268 පිට (බු.ජ.19)
11. අං.නි. I 20 පිට (බු.ජ.18)
12. සු.වි. 258 පිට (හේ.මු.)
13. ප.සූ. II 343 පිට (හේ.මු.)
14. ම.නි. I 770 පිට (බු.ජ.10)

# 8 වන
# දේශනය

# 8 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං, යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"

"මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම. සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්‍ෂය කිරීම නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය".

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහාසංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ අටවන දේශනයයි මේ.**

ගියවර දේශනය අවසාන හරියේදී අපි අනිදස්සන විඤ්ඤාණය කෙබඳු එකක්ද යන්න තේරුම් ගැනීමට මැදුම් සඟියේ බ්‍රහ්ම නිමන්තනික සූත්‍රයෙන් ගත හැකි සාධක උපකාර කරගත හැකි අන්දම තරමක් දුරට සාකච්ඡා කළා. එතැනදී අපි පළමුවෙන්ම එක්තරා ඡේදයක් ඉදිරිපත් කර ගත්තා. ඒ ඡේදය නැවත මතක් කර ගැනීම් වශයෙන් සඳහන් කරන්න පුළුවනි.

'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතොපභං තං පඨවියා පඨවිත්තෙන අනනුභූතං - පෙ - සබ්බස්ස සබ්බත්තෙන අනනුභූතං'. මේ ඡේදයෙන් ප්‍රකාශ කළේ අදහස වශයෙන් ගත්තොත් අනන්ත වූ සබ්බතො පභ හැම පැත්තෙන්ම ප්‍රභාවත් වූ - ඒ අනිදස්සනවිඤ්ඤාණය පඨවි ධාතුවේ පඨවි සවභාවයෙනුත්, ආපො ධාතුවේ ආපො සවභාවයෙනුත් ආදී වශයෙන් ඒ කියන එක් එක් සංකල්පයට අදාල වූ සවභාවයෙන් විනිර්මුක්තයි. ඒ කියන්නෙ ඒවට යටත් උනේ නැහැ. 'අනනුභූතං' එකී සංකල්ප වලට ලෝකයා ආරෝපනය කරන යම් සවභාවයක් ඇතොත්, යම් සත්‍ය සවභාවයක් හැටියට සළකන දෙයක් ඇතොත්, ඒක මේ අනිදස්සන විඤ්ඤාණයේ සටහන් වෙන්නෙ නැහැ. ඒකයි ඒ විඤ්ඤාණය ඊට යටත් නොවෙනවයි කියන්නෙ. සාමාන්‍යයෙන් ලෝකයා එදිනෙදා ව්‍යවහාරයේ පාවිච්චි කරන සංකල්ප වලට එක්තරා සත්‍ය සවරූපයක් දෙනව. මේව ගන්න පුළුවන් ධම්මාරම්මණ හැටියට, සිතට අරමුණු වන ධර්ම. 'ධම්ම' කියල කියන්නේ, සිංහල වචනයකින් කීවොත් 'දේවල්'. එතකොට ලෝකයා

හිතන්නේ මේ කියාපු මේ සංකල්ප සමූහයේ යම් කිසි 'දෙයක්' තියෙනව කියල. මේ එක එකක් ගත්තාම හැම එකකම යම් කිසි දෙයක් තියෙනව කියල. මේ ධම්මාරම්මණ වල, එහෙම නැත්නම් මනසට අරමුණු වන දේවල, යම් කිසි සවභාවයක් 'දෙයක්' හරයක් තිබෙනවය කියන විශ්වාසය ලෝකයා තුළ තිබෙනව. නමුත් මේ රහතන්වහන්සේගෙ විමුක්ත සිතේ ඒ කියන ඒ සවභාවය සටහන් නොවන බවයි මෙතනින් ප්‍රකාශ වෙන්නෙ. මේ ධම්මාරම්මණවල සත්‍ය සවභාවයක් තියෙනව කියල සිතීම ලෝකයාට ඉතාමත්ම අවශ්‍ය කාරණයක්. මක්නිසාද? ආරම්මණ වශයෙන් ඒවයෙ එල්බගන්න නම් ඒවායේ යම්කිසි හරයක් තියෙන්න ඕන. හරයක් ඒවාට ආරෝපනය කරන්නවත් ඕන. එතකොට ලෝකයා ආරෝපනය කරනව ඒවාට යම් කිසි හරයක්. ඒක තමයි පෘථිවියෙහි පෘථිවි සවභාවයක් තියෙනව. ආපො ධාතුවෙහි ආපෝ සවභාවයක් තියෙනව. ජලයේ ජලසවභාවයක් තියෙනව ආදී වශයෙන්. ඒ විධියට භූතයින්ට අදාලවූ භූතත්වයක් තියෙනව. දේවත්වයක් තියෙනව. ප්‍රජාපතිත්වයක් තියෙනව. බ්‍රහ්මත්වයක් ආදී වශයෙන් වෙන එකක් තබා, 'සබ්බඤ්ඤ සබ්බතො' මේ හැම දේකටම ඒ 'සබ්බත්ත' කියන සවභාවයකුත් තියෙනව කියල ලෝකයා විශ්වාස කරනව.

යම් කිසි සංකල්පයක් ගත්තාම ඒ හැම එකකටම මේ විධියට සත්‍ය සවභාවයක් දීම නිසා ලෝකයා ඒවා පිළිබඳව නිත්‍ය සංඥාවල් ඇතිකර ගන්නව. ශුභ සංඥාවල් ඇති කරගන්නව. ආත්ම සංඥාවල් ඇතිකර ගන්නව. වෙන විධියකින් කියනවනම්, තණ්හා මාන දිට්ඨි වලට මේ සංකල්ප අරමුණු කරගන්නව. ඒ අරමුණු කරගන්නෙ ඔන්න ඔය කියපු පඨවිත්ත, දෙවත්ත ආදී ඒවාට ආරෝපනය කරන සවභාවයෙන්. නමුත් 'අනිදස්සන විඤ්ඤාණය' මේ කියන සවභාවවලින්, ලෝකයා මෝහනය වන සවභාවවලින්, මිදිලයි තියෙන්නෙ. මේ භවනාටකය ගෙතීමට ලෝකයා සත්‍යවශයෙන් සළකන මේ සංකල්ප සමූහය පිළිබඳව මෝහනයක් රහතන්වහන්සේගේ විඤ්ඤාණයේ ඇතිවන්නේ නැහැ. ඒක තවදුරටත් පැහැදිලි වෙනව මේ බ්‍රහ්මනිමන්තනික සූත්‍රයෙම සඳහන් වන තවත් පාඨයකින්. බක බ්‍රහ්මයා නිත්‍ය සංඥාව නිසා ඇතිකරගත්තු මානය - තමාගේ 'බ්‍රහ්මත්වය' පිළිබඳව ඇති කරගත්තු නිත්‍ය සංඥාව නිසා හටගත් මානය - බිඳීමට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශකරනව මෙන්න මෙහෙම:

'පඨවිං ඛො අහං බ්‍රහෙම පඨවිතො අභිඤ්ඤාය යාවතා පඨවියා පඨවිත්තෙන අනනුභූතං තදභිඤ්ඤාය, පඨවිං නාහොසිං පඨවියා නාහොසිං පඨවිතො නාහොසිං පඨවිං මෙති නාහොසිං පඨවිං නාභිවදිං' මෙතැනින් කියැවෙන්නෙ 'බ්‍රහ්මය, මම පෘථිවිය පෘථිවිය වශයෙන් 'අභිඤ්ඤාය' ඒ කියන්නේ විශිෂ්ට නුවණින් තේරුම් අරගෙන, ලෝකයා තේරුම් ගන්න

සාමාන්‍ය සංඥාවෙන් නොවෙයි, විශිෂ්ට නුවණින් ප්‍රඥාවෙන් තේරුම් අරගෙන, පඨවිං පඨවිතො අභිඤ්ඤාය, යාවතා පඨවියා පඨවිත්තෙන අනනුභූතං තදභිඤ්ඤාය' - පෘථිවියෙහි පෘථිවි ස්වභාවයෙන් අනනුභූත වූ ඒ කියන්නේ පෘථිවි ස්වභාවයට යටත් නොවූ යම් දෙයක් ඇත්නම් - එතන යම්දෙයක් කියල සඳහන් කරන දේ පසුවයි තේරුම් කරන්නෙ - ඒක තමයි අර අනිදස්සන විඤ්ඤාණය. අපි අර කලින් සඳහන් කළ අනිදස්සන විඤ්ඤාණය ගැන කියන ඡේදයට කලිනුයි මේ පාඨය සඳහන් වෙන්නෙ. එයින් අපට හැඟෙනව, පෘථිවි ස්වභාවයෙනුත් අනනුභූත වූ යම් දෙයක් ඇත්ද, යම්තාක් දෙයක් ඇත්ද, ඒ කියන්නෙ යම් අනිදස්සන විඤ්ඤාණයක් ඇත්ද 'තදභිඤ්ඤාය' ඒ අනිදස්සන විඤ්ඤාණය හරිහැටි තේරුම් අරගෙන, ඔන්න ඊළඟට ප්‍රකාශ කරනව බුදුපියාණන්වහන්සේගේ දර්ශනය - 'පඨවිං නාහොසිං' මම පෘථිවිය නොවීමි, 'පඨවියා නාහොසිං' පෘථිවියෙහි නොවීමි, පඨවිතො නාහොසිං පෘථිවියෙන් නොවීමි, පඨවිං මෙති නාහොසිං පෘථිවිය මගේ යයි නොගතිමි, 'පඨවිං නාභිවදිං' පෘථිවිය පිළිබඳව මානයෙන් කියාපෑමක් නොකෙළෙමි.' මෙතනින් කියැවෙන විභක්තිරූපවලිනුත්, අපට හැඟෙනව, ලෝකයා අර සංකල්පවලට ස්වභාවයක් දීල ඒවාට - 'තවයක්' දීල, ඒ විධියට ඒ සංකල්පය තමන්ගේ තණ්හා, මාන, දිට්ඨි වලට අරමුණු කර ගැනීමට සුදුසු තත්ත්වයකට පත්කර ගත්තට පස්සෙ 'ඊළඟට විභක්තිරූප මතුවෙනව. ඒ විභක්තිරූප කීපයක් තමයි මෙතනින් මේ කියැවුණේ. එතකොට මේ කියන පෘථිවිය, - පෘථිවිය - දැන් කෙනෙක් හිතන්න පුළුවන් 'මගේ පෘථිවිය' එහෙම නැත්නම් 'මම පෘථිවියෙහි සිටිනව' ඒ වගේම පෘථිවියෙහි සිටි මම' ඒ වගේම 'පෘථිවිය' 'පෘථිවියෙන්' කියන අන්න ඒ විදියෙ සංකල්පය අනුව හදාගත්තු විභක්ති රූප දැඩිව ගැනීමෙන් කරන්නෙ අර තමාගේ 'මමත්වය' තහවුරු කර ගැනීමයි.

දැන් අපි කවුරුත් දන්නව 'මල' කියන එක පරවෙන්න පුළුවන් බව. නමුත් 'මා - දුටු - 'මල' කියල ගත්තහම, ඒක මා කියන සංකල්පයට ඇතුල්වුනාට පස්සෙ, එය නැවත සිහිගන්වන්න පුළුවන් නිසා ඒකෙ යම්කිසි නිත්‍ය ස්වභාවයක් තියෙනව. නැවත ඒ ගැන හිතන්න පුළුවන් විධියේ හිතට යොමුවන නිත්‍ය සංඥාවක් එයින් එනව. ඔන්න ඔය අදහසයි මෙතන සඳහන් වෙන්නෙ.

විමුක්ත සිතක ස්වභාවය අර සංකල්ප දැඩිව ගැනීමක් නැති එකයි. ලෝකයා යොදන විභක්තිරූප දැඩිව ගැනීමක් නැහැ. ඒවා සාමාන්‍ය ව්‍යවහාර බව දන්නව. දැන ගැනීම නිසාම ඒවට යටත් වෙන්නේ නැහැ. 'පඨවිං නාහොසිං' 'මම පෘථිවිය නොවීමි.' 'පඨවියා නාහොසිං' 'මම පෘථිවියෙහි නොවීමි', පෘථිවියෙන් නොවීමි. 'පෘථිවිය මගේ යයි නොගතිමි'.

'පඨවිං නාභිවදිං' මෙතන 'අභිවදිං' කියන වචනය යෙදිල තියෙන්නෙ මානය පිළිබඳව. නිතර එකළහ යොදන පද තුනක් තියෙනව. 'අභිනන්දති' 'අභිවදති' 'අජ්ඣෝසාය තිට්ඨති' කියල නිතර සූත්‍රවල සඳහන් වෙනව. 'අභිනන්දති' කියල කියන්නේ තණ්හා වශයෙන් සතුටු වීම. විශේෂ වශයෙන් සතුටු වෙනව කියන එකයි අභිනන්දති කියන්නේ. 'අභිවදති' කියල කියන්නේ මානය පිළිබඳව කියාපෑමක්, යමක් පිළිඅරගෙන කියා පෑමක්. 'අජ්ඣෝසාය තිට්ඨති' කියන්නේ දෘෂ්ටි වශයෙන් පැටලී සිටීමක්. එතකොට තණ්හා, මාන, දිට්ඨි කියන පද තුනට සමාන්තරව යෙදෙන පද තමයි. අභිනන්දති, අභිවදති, අජ්ඣෝසාය තිට්ඨති කියන්නේ.

එතකොට ඒ පද අතුරින්, මෙතන තියෙන්නේ 'අභිවදති' කියන පදයයි. 'පඨවිං නාභිවදිං' 'පෘථිවිය පිළිබඳව මාන වශයෙන් කියාපෑමක් නොකෙළෙමි.' මෙතනිනුත් අපට පෙනෙනව පෘථිවියෙහි, පෘථිවිසංඥාව සාමාන්‍ය ලෝකයා දැඩිව අරගෙන අර විධියට පෘථිවිය මගේ, මගේ පෘථිවිය, මම පෘථිවියෙහි සිටිනවා ආදි වශයෙන් ඒ සංකල්ප වලට නිත්‍ය ස්වභාවයක් ආරෝපනය කරනව. මේක මේ ලෝකයාගේ භව නාටකය ගෙන යෑම සඳහා යොදාගන්නා එක්තරා උපක්‍රමයක්. නමුත් මේ ධාතුන්ගේ පවා, මේ හැම එකකම, ශූන්‍යත්වයක් තියෙනව. මෙතන මුලින්ම සඳහන් වෙන්නෙ පඨවි, ආපො, තෙජෝ, වායො, කියන ධාතු හතරයි. බුදුපියාණන් වහන්සේ මේ ධාතුන්ගේ ශූන්‍යත්වය, මේවායේ අනිත්‍ය ස්වභාවය තේරුම් අරගෙන, ඒ නිසාම මේව දැඩිව ගැනීමක් කරන්නේ නැහැ. සාමාන්‍ය ලෝකයා හිම කැටයක පෙනෙන තද ගතිය නිසා හිමකැටය පිළිබඳව පඨවි සංඥාව දැඩිව ගන්නව. නමුත් අපි දන්නව. ඒකෙ තියෙන අනිත්‍ය ස්වභාවය. හිමකැටය තරමක් දුරටත් රත්කරන කොට ඒකෙ ආපො ලක්ෂණය මතුවෙනව. තවදුරටත් රත් කරන කොට ඒකෙ තෙජෝ ස්වභාවය මතුවෙනව. තවදුරටත් රත්කරන කොට, ඒක වාෂ්ප බවට පත් වෙලා වායො ලක්ෂණය ඉස්මතු වෙනව.

ඔය විධියට ලෝකයා දැඩිව ගන්නා මහාභූත ධර්මවල පවා තිබෙන්නෙ අනිත්‍ය ස්වභාවයක්. මෙන්න මේ අනිත්‍ය ස්වභාවය ගැන හිතේ හරි වැටහීමක් ඇති, අභිඥා වශයෙන් වැටහීමක් ඇති, විමුක්ත පුද්ගලයා මේ මහාභූත ධර්මයන්ගේ හොල්මන් වලින් කැළඹෙන්නේ නැහැ. මහාභූත ධර්මයන්ගේ හොල්මන් වලට විඥාණය යටත් වෙන්නෙ නැහැ. අන්න ඒ බවයි මෙතනින් කියැවෙන්නේ. ඒ වගේම තමයි අනිකුත් සංකල්ප පිළිබඳව. සංසාරගත සත්ත්වයින්ගේ ව්‍යවහාර තියෙනව. දෙවියන් අතර මම දෙවියෙක් කියල හිතනව. අර බක බ්‍රහ්මයා 'මම බ්‍රහ්මයෙක්' කියල ඒ මාන්නය ගත්ත. ඒවත් හරියටම අර හිම කැටය වගේම කල්ප ගණනක් පහුවෙලා හරි දිය වෙලා යනව. හිමකැටයක් වගේම දියවෙලා යන විදියෙ දෙයක්

තමයි බ්‍රහ්මත්වයත්. අන්න ඒ විදියට ලෝකයාගේ භව නාටකයේ නිත්‍යවශයෙන් ගන්න සංකල්ප වල නිත්‍ය සංඥාවක් රහතන් වහන්සෙගේ විමුක්ත විඤ්ඤාණයේ සටහන් වන්නේ නැහැ. අන්න ඒකයි 'අනිදස්සන' විඤ්ඤාණය කියන්නේ. අනිදස්සන විඤ්ඤාණය ඒවායින් විමුක්තයි.

මෙන්න මේ කාරණය අපට තව දුරටත් තේරුම් ගන්න පුළුවන්- විමුක්ත තත්ත්වය තේරුම් ගැනීමට එක්තරා ඉඟියක් ලබා ගන්න පුළුවන්- මෙතෙක් අපි ව්‍යවහාර කළ චිත්‍රපටි, නාට්‍යාදිය පිළිබඳ උපමාවෙන්. ඒක නැවතත් අපි සිහිපත් කර ගත්තොත්, ඒ චිත්‍රපටි ආදියේ සාමාන්‍යයෙන් ඔය චිත්‍රපට නිෂ්පාදකයින් සමහර ත්‍රාසජනක දර්ශන මවාපෑමට යොදාගන්න උපක්‍රම ඉතාමත්ම සියුම්. සමහරවිට චිත්‍රපටියක් නරඹන්නන් -ප්‍රේක්ෂකයින් - ත්‍රාසයෙන් මුසපත් කරවන අන්දමේ මහා ගිනිගැනීම්, මන්දිර ගිනි ගැනීම්, හැටියට පෙන්වන්න ඒ අය පාවිච්චි කරන්නෙ මොනවද? කඩදාසි ගෙවල්. කඩදාසි ගෙවල් වලට ගිනි තියනව. නමුත් ඒ දර්ශනය නරඹන තැනැත්ත රැවටෙනව, මහා මන්දිරයක් ගිනි ගන්නව කියල. ඒ වගේම මහා භයානක වාහන අනතුරු දැක්වීමට සෙල්ලම් බඩු පාවිච්චි කරන්නෙ. මේ භවනාටකයෙත් තියෙනව ඔන්න ඔය විදියේ ත්‍රාසජනක දර්ශන. ඒවායේ ත්‍රාසජනක ස්වභාවයක් තිබුනට මොකද? නියම තත්ත්වය, නරඹන්නන් ඇත්ත වශයෙන්ම තේරුම්ගන්නව නම්, නරඹන්නාට ඒ අවස්ථාවෙ වැටහෙනව නම්, මේව කඩදාසි ගෙවල්, මේ සෙල්ලම් බඩු වගයක් කඳුමුදුන් වලින් පෙරලෙන්නේ කියල, එහෙම වැටහීමක් එනව නම් ඒ අයට ත්‍රාසය වෙනුවට ඇතිවෙන්නේ හාසයක්. අන්න ඒ වගේම මේ භව නාටකයෙත් තිබෙනව ත්‍රාසජනක පැත්තකුත්, හාසජනක පැත්තකුත්.

මේ වචන දෙකම අඩංගු වෙනව 'සංවේග' කියන වචනයෙ. සංස්කාරයන් පිළිබඳව සංවේගය ඇතිකර ගැනීමේදී මේ තත්ත්ව දෙකම අපට කිට්ටුකරගන්න පුළුවනි. සාමාන්‍ය ලෝකයාට පෙනෙන්නෙ මේ භවනාටකයෙ අර ත්‍රාසජනක පැත්තයි. මක්නිසාද - අවිද්‍යාව නිසා. නමුත් රහතන් වහන්සේට - විමුක්ත පුද්ගලයාට - මේ භවනාටකයේ හාසජනක පැත්තකුත් පෙනෙනව. ඒකට එක්තරා නිදර්ශනයක් හැටියට දක්වන්න පුළුවනි බුදුපියාණන් වහන්සේ, ඒ වගේම සමහර විට මුගලන් මහරහතන් වහන්සේ වැනි ඍද්ධිමතුන් වහන්සේලා, මේ සංසාරයේ නොයෙකුත් සත්ත්වයින් රූකඩ රැඟුමක් වගේ කර්මානුරූපව ඒ ඒ භවවල උපදින ආකාරය දැකල සමහර අවස්ථාවල 'සිතුප්පාදයක්' - මඳ සිනහවක් - පහළ කළා කියල සඳහන් වෙනව. මේක ඇත්තවශයෙන්ම උපහාසයක් වශයෙන් හෝ අකරුණාවකින් හෝ කෙරෙන දෙයක් නොවෙයි. නමුත් මේකෙ එක්තරා ඉඟියක් තියෙනව. මේ හසිතුප්පාදයක් ඇතිවීම, මේ භවනාටකයේ හාස්‍යජනක පැත්ත දැකීම වගේ. සමහරවිට මහ උසස්

තත්ත්වවල වැජඹුනු අය ප්‍රේතයින් හැටියට, එහෙමනැත්තම් ඊටත් වඩා පහත් තත්ත්වවල උපදිනව දැකල, මේ භවනාටකයේ නිස්සාර බව වටහාගැනීමෙනුයි මඳ සිනහවක් පහළ වෙන්නෙ. ඒකත් හරියට චිත්‍රපටියක පෙන්නුම් කරන දේවල්වල අනිත්‍යස්වභාවය, මවාපෑම් ස්වභාවය, හරියට අවබෝධ වුන කෙනෙකුට ඇතිවන තත්ත්වය වගේ. මේ භවනාටකය ගැන කල්පනාකරල බැලුවාම මේ සංසාරගත සත්ත්වයා හරියට අර උද්ධංභාගිය සංයෝජන වලින් ඉහලට ඇදෙන ඕරම්භාගිය සංයෝජන වලින් පහලට ඇදෙන රූකඩ ගොඩක් වගේ. නූල් වලින් ඉහලට පහලට ඇදෙන රූකඩ ගොඩක් වගේ. මෙන්න මේ රූකඩ රඟුම් දැකල තමයි රහතන්වහන්සේලාට මේකෙ මේ නිස්සාරත්වය අනුව එක්තරා විධියෙ හසිතුප්පාදයක් ඇතිවන්නේ. ඒ විධියට කල්පනා කරල බලනකොට මේ භවනාටකයේ රඟ දැක්වීමට යොදන ප්‍රධාන මූලද්‍රව්‍ය තමයි සතර මහා භූතයින් - පඨවි, අපො, තෙජො, වායො. අර චිත්‍රපටියක, නාට්‍යයක පවා ඒ දර්ශීන මවාපෑමට සමහර විට එකම දේ යොදාගන්න පුළුවන් කීප ආකාරයකින්. චිත්‍රපටියක එක ජවනිකාවක පුටුවක් හැටියට යොදාගන්නා එක, තව ජවනිකාවක පාපුටුවක් හැටියට යොදාගන්න පුළුවන්. තවත් ජවනිකාවක ඒක මේසයක් වෙන්න පුළුවන්. ඒ වගේම දැන් චිත්‍රපටිවල තියෙනව දෙබිඩ්චරිත රඟපෑමක්. එකම පුද්ගලයා, එකම නළුවා, සමහර විට ජවනිකා කීපයක දෙදෙනෙක් හැටියට පෙනී හිටිනව. මේ භවනාටකයෙත් ඒ විදියේ තත්ත්වයක් තියෙන්නෙ. ඇත්ත වශයෙන් කල්පනා කරල බලනකොට ඥාතීන් වශයෙන් එකිනෙකාට නෑයන් නොවූ කෙනෙකු මේ සංසාරයේ නැතෙයි කියල බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළා. අපේ මේ ලෝක චිත්‍රයේ, අපේ සමාජධර්ම ආදිය පිළිබඳව යම්කිසි විප්ලවයක් ඇතිවීම වැළැක්වීම සඳහා අපි කල්පනා කරනව මේ නෑසබඳකම් ඉතාමත්ම ඈත කාලයකට අයිති දේවල් හැටියට. නමුත් ධර්මානුකූලව කල්පනා කරනව නම් සමහරවිට සත්‍යසිද්ධි ආශ්‍රයෙන් උනත් - මවකගෙන් කිරිබොන ළදරුවා හෝ ළදැරිය ඒ තැනැත්තියගේම මියගිය පියා හෝ මව හෝ වෙන්න පුළුවන්. අන්න ඒ තරම් පුදුම හාස්‍යජනක තත්ත්වයක් මේ භවනාටකයෙ ජවනිකාවල තියෙනව. මේක ලෝකයාට සාමාන්‍යයෙන් වැටහෙන්නේ නැහැ. හාස්‍යජනක තත්ත්වය නිසා ලෝකයා හිනාවීම නොවෙයි කරන්නෙ සංවේගය ඇති කර ගැනීමයි. මේ විදියේ දේකට හසු වෙලා සිටිනව නේද කියල. ආශ්‍රව අනුශය ශක්තිය නිසා මේව වැටහෙන්නේ නැහැ නොවේද? ඒ නිසා ක්ලේශ ආදිය අපි ඇති කර ගන්නව නේද කියල. ඒ විධියටත් සංවේගය ඇතිවෙනව. මේ හැම එකකම ශූන්‍යතාව. අනිමිත්ත වශයෙන්, ඒ වගේම දුක්ඛ වශයෙන්, ශූන්‍යතා වශයෙන් යම්කිසි අවබෝධයක් ලබන්න පුළුවන් මෙන්න මේ කාරණා අනුව. පඨවි, ආපො, තෙජො, වායො කියන මහාභූත ධර්මයන් හා ලෝක

ආරම්භයේදී ඒවායේ තත්ත්වය ලෝක විනාශයේදී, කල්පවිනාශයේදී, ඒවා විනාශවී යන ආකාරය - ඒවා ගැන කල්පනා කරන්න පුළුවන්. අන්න ඒ විධියට පුද්ගලයින් පිළිබඳව, සත්ත්වයින් ගැන කල්පනා කරල බැලුවොත් ඥාතිසම්බන්ධය අනුව, අර තරම් සංවේගජනක තත්ත්වයක් තියෙනව.

මෙන්න මේ අනුව තමයි බුදුපියාණන් වහන්සේ සමහර විට 'සතතපුරියුගාමන' සූත්‍රය ආදියේදී ' අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං' කියල ප්‍රකාශ කළේ. සංස්කාර කියන එකට අපි දිගටම යොදා ගන්න අර්ථය තමයි, නාට්‍යයක එක් එක් ජවනිකා මවා පෑමට තාවකාලිකව යොදාගන්න, වෙලාව පිරිමහගන්න යොදාගන්න, උපකරණ වගේය කියන එක. මේ පුද්ගලයනුත් එහෙමයි, අර නළුවන් වගේ. කර්මානුරූපව උපදින සත්ත්වයින් හිතාගන්නව 'මම දෙවියෙක්' 'මම බ්‍රහ්මයෙක්' කියල. ඒ කර්ම ටික ඉවර උනාට පස්සෙ එහෙමම විනාශවෙලා කොහේ යනවද දන්නේ නැහැ. ඒ වගේම තමයි උපකරණත්. අර පා පුටුව, පුටුව, ආදිය වගේ. නමුත් මේකෙ රහස මොකක්ද? අර ජවනිකා නරඹන ප්‍රේක්ෂකයින් එක් එක් ජවනිකාවක දකින දේ ඒ ඒ හැටියෙන්ම අරගෙන තමයි නාට්‍ය නිෂ්පාදනය කරන්නේ. අපි මුලදීම කිව්ව නාට්‍ය නිෂ්පාදනයේ අවසාන කොටස අයිති නිෂ්පාදකයින්ට නොවෙයි නරඹන්නන්ටෙයි කියල. ප්‍රේක්ෂකයා තමයි හිතේ නාට්‍යයක් මවාගන්නේ. එතකොට නාට්‍යයක් මවා ගැනීමට මේ එක් එක් සංස්කාර ගොඩගහ ගන්නව. අර එක ජවනිකාවක පුටුව සමහර විට ඒකම පා පුටුව වෙන්නත් පුළුවන්. ඒක පුටුව හැටියට හිතේ තැන්පත් වෙනව. ඊළඟ ජවනිකාවෙ ඒක පාපුටුවක් හැටියට යොදාගත්තු නිසා, ඒ විදියට හිතේ එකතු වෙනව. අන්න ඒ වගේම තමයි සත්ත්වයින් පිළිබඳවත්. මගේ අසවලා කියල. ඔය විදියට භවනාටකයේ එක්තරා විධියක සංවේගජනක තත්ත්වයක් තිබෙන නිසා වෙන්න ඕන බුදුපියාණන්වහන්සේ අර අනිත්‍යතාව විදහාදක්වන බොහෝ සූත්‍රවල සමහර විට කල්ප විනාශය ගැන කියවෙන සූත්‍රවල පවා 'අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං' කියල "ඔයත් ඇති මහණෙනි සියලු සංස්කාරයන් පිළිබඳව කලකිරෙන්නෙ, නොඇලෙන්න, ඒවායින් මිදීමට ඔයත් ඇති, මා මේ ප්‍රකාශ කළ කරුණු ටිකත් ඇති" කියල බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ. මෙන්න මේ සංස්කාර කියන එක මේ මිහිපිට ජීවත්වන සත්ත්වයාගේ විඤ්ඤාණයේ දැක්වෙන මේ නාමරූප චිත්‍රපටියට - එහෙම නැත්නම් විඤ්ඤාණයේ ගෙනෙන මේ චිත්‍රපටිවලට - මූලිකවන සේයාරූ පටක් වගේ. ලෝකයත් එක්තරා විධියක වේදිකාවක් හැටියට ගත්තොත්, මේ ලෝකය අවට තියෙන මේ ගස්කොළං, ඒ වගේම මේ සත්ත්වයින් මේ හැමදෙයක්ම ඇත්තවශයෙන් බලනකොට සිනමා තිරයක දැක්වෙන දේවල් වගේ. නමුත් මෙතන රහස

මොකක්ද? මේවායේ සංඛත සවභාවය සාමාන්‍ය ලෝකයාට වැටහෙන්නේ නැහැ - මේවායේ තියෙන 'රාමුව'. චිත්‍රපටියක් බලනකොට මේක මේ තිරයේ දැක්වෙන දෙයක් කියන ඒ හැඟීම නැහැ. ඒ අවස්ථාවෙ මේක සත්‍ය දෙයක්, සැබෑ දෙයක් හැටියට පේනව. අන්න ඒ ලෝකයේ සැබෑ සවරූපය පිළිබඳව බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරන්නේ 'ජාතං භූතං සමුප්පන්නං කතං සංඛතමද්ධුවං'. මේ ලෝකයේ, හට ගත්තු, ඇත්ත දේ හැටියට පෙනෙන දේවල් ඇත්තවශයෙන්ම 'කතං සංඛතං' කරන ලද ගොඩනගන ලද සංස්කාරවලින් සකස් කරන ලද දේවල්ය කියල මේවායේ අසත්‍ය සවභාවය අනිත්‍ය, දුඃඛ අනාත්ම සවභාවය මෙයිනුත් මතුකරල දෙන්නෙ. අන්න ඒක නිසා මේ සංස්කාර කියන වචනය ගැන විශේෂයෙන්ම අපට හිතා ගන්න පුළුවනි. එයින් අපට හැඟෙන්නෙ මේ ලෝකයේ ඇති කෘත්‍රිම සවභාවය. මේ ලෝකය කෘත්‍රිම දෙයක් බවට පත් කරන මේ පඨවි ආදි හැම දෙයක්ම සංස්කාර. අන්න ඒ නිසා ඒවායේ අනිත්‍ය සවභාවය පිළිබඳ අවබෝධයක් ඇති අර අනිදස්සන විඤ්ඤාණය ඒවායින් විමුක්තයි. ලෝකයා දැඩිව ගන්නා මේ සංකල්පවලින් විමුක්තයි. ඒවායේ හොල්මන්වලින් සැලෙන තත්ත්වයක් නැහැ. රහතන්වහන්සේගේ මේ විමුක්ත තත්ත්වය හොඳට තේරුම් ගැනීමට ඉතාමත්ම සරල, ඒ වගේම ගැඹුරු, පුදුම අන්දමේ ගාථා හතරක් අපට සොයාගන්න පුළුවනි අධිමුත්තථේරගාථාවෙන්. මේ අධිමුත්ත සවාමීන්වහන්සේ පිළිබඳ ප්‍රවෘත්තිය ඉතාමත්ම පුදුම විධියේ සිද්ධියක්. අධිමුත්ත සවාමීන් වහන්සේ මහ වනයක් මැදින් වැඩම කරන අවස්ථාවේ පල්හොරු මුලකට අසුඋනා. ඔවුන් සූදානම් වෙනව මිනිස් බිලියක් දීල දේවපූජාවක් පවත්වන්න. මේ රහතන් වහන්සේ අල්ල ගත්ත මරන්න. රහතන් වහන්සේ කිසිම කැළඹීමක් නැහැ. මුහුනේ කිසි භයක් සන්ත්‍රාසයක් නැහැ. හොරදෙටුව ඇසුව මේකට හේතුව. අන්න එතකොට ඒ අධිමුත්ත රහතන් වහන්සේ පිළිතුරු දුන්න, ගාථා කීපයකින්. එයින් විශේෂයෙන් හතරක් අපට තෝරගන්න පුළුවනි.

1. නත්‍ථි චෙතසිකං දුක්ඛං - අනපෙක්ඛස්ස ගාමණි
   අතික්කන්තා භයා සබ්බෙ - ඛීණසංයොජනස්ස වෙ
2. න මෙ හොති අහොසින්ති - භවිස්සන්ති න හොති මෙ
   සංඛාරා විභවිස්සන්ති - තත්‍ථ කා පරිදෙවනා
3. සුද්ධං ධම්මසමුප්පාදං - සුද්ධං සංඛාරසන්තතිං
   පස්සන්තස්ස යථාභූතං - න භයං හොති ගාමණි
4. තිණකට්ඨසමං ලොකං - යදා පඤ්ඤාය පස්සති
   මමත්තං සො අසංවින්දං - නත්‍ථි මෙති න සොචති

එක අතකින් බලනකොට මේ ගාථා හතරෙ අඩංගුවන අර්ථයෙන් කොටසක් හරි, අල්පමාත්‍රයක් හරි, අප මේ කලින් ප්‍රකාශකළ දේශනාවල ඒ ඒ තැන්වල සඳහන් වෙලා තියෙනව. දැන් මුල් ගාථාව ගත්තොත් 'නත්ථි චෙතසිකං දුක්ඛං අනපෙක්ඛස්ස ගාමණී' - 'ගාමණී' කියල අමතන්නෙ සොරදෙටුවටයි. 'ගම්දෙටුව' අනපෙක්ඛස්ස කියන්නෙ අපේක්ෂාව, තණ්හාව, ආශාව, ආදියක් නැති තැනැත්තාට චෛතසික වශයෙන් ඇතුළත දුකක් නැත. 'අතික්කන්තා භයා සබ්බෙ ඛීණසංයොජනස්ස වෙ' සියලුම භව සංයෝජන ක්ෂය කළ තැනැත්තා විසින් සියලුම භය ඉක්මවන ලද්දේ වෙයි. දැන් මේ ගාථාව ගැන විතරක් අපි මුලින්ම කල්පනා කරල බලමු. දැන් මෙතන කියවෙන 'නත්ථි චෙතසිකං දුක්ඛං' අපි කලින් දේශනයකදී අර 'සංචෙතනීය' සූත්‍රය මුල් තැන තියාගෙන දේශනා කළ එක්තරා දේශනයකදී අපි ප්‍රකාශ කළා කය, වචනය, මනස කියන ඒවා සත්‍ය වශයෙන් නොගත්තු තැනැත්තාට ආධ්‍යාත්මික වශයෙන් සැපදුක් නැත කියල- 'අජ්ඣත්තං සුඛ දුක්ඛං' ඒ කියන්නේ 'අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සො කායොතිපි න හොති. යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං සා වාචා තිපි න හොති. යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං සො මනොතිපි න හොති යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං ඛෙත්තං තං න හොති වත්ථුං තං න හොති ආයතනං තං න හොති අධිකරණං තං න හොති යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං' කියල ඒ ආකාරයෙන් අපි ප්‍රකාශ කළා. ඒ කියන්නෙ අවිද්‍යාවගේ අසෙස විරාග නිරෝධයෙන්, ඒ රහතන්වහන්සේට කයකැයි කියන හැඟීමකුත් නැහැ. ලෝකයා සාමාන්‍යයෙන් කයය කියල හිතන ඝන සංඥාවෙන් ගත්තු කාය සංඥාවකුත් නැහැ. ඒ වගේම 'සා වාචාතිපි න හොති' ලෝකයාගේ මේ වචනය - වචනයෙන් රැස්කරන සංස්කාර ආදියට මූලික හේතුව, වචනයට සත්‍යතාවක් දීම, භාෂා ආදි ව්‍යවහාරයන්ට දෙන සත්‍යතාව - ඒක නැහැ. 'සා වාචාතිපි න හොති' දැන් අපට කෙනෙක් බැන්නහම හිත නරක් වෙන්නෙ ඒ වචන වලට දීපු සත්‍යතාව අනුව. ඒ වගේම 'සො මනොතිපි න හොති' සිතත් ඒ විදියටම. ඇතිව නැතිවන මේ සංස්කාර සමූහය මගේ සිත කියල ගන්නව. අන්න ඒ නිසා 'ඛෙත්තං තං න හොති වත්ථු තං න හොති ආයතනං තං න හොති අධිකරණං තං න හොති යම්පච්චයාස්ස උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං' ඇතුළතින් සුව දුක් ඇතිවීමට, සැපදුක් ආදිය ඇතිවීමට හේතු වූ යම් කෙතක්, ඉඩමක්, ආයතනයක්, කාරණයක්, තිබුණ නම් ඒව නැහැ. අන්න ඒ අදහසයි මෙතන මේ කෙටියෙන් කියවෙන්නේ. 'නත්ථි චෙතසිකං දුක්ඛං' - සොරමුල විසින් ඇත්තවශයෙන්ම මේ ස්වාමීන්වහන්සේ මරණයට පත් කළත් එයින් චෛතසික වශයෙන්

දුකක් නැහැ. මගේ ශරීරය කියල නැහැ. මක්නිසාද මාරයා උදුරගන්න එන්න කලින් අතහැරල ඉවරයි. ඒ අදහස පළමුවෙනි ගාථාවෙ සඳහන් වෙනව.

ඊළඟ ගාථාව පිළිබඳව කල්පනා කරල බැලුවම ඒකෙනුත් ශූන්‍යතාව පිළිබඳ හොඳ හැඟීමක් එනව. 'නමෙ හොති අහොසින්ති භවිස්සන්ති න හොති මෙ, සංඛාරා විභවිස්සන්ති තත්‍ථ කා පරිදෙවනා 'මට වැටහෙන්නේ නෑ මා හිටියා කියල. "මම වීමි" යන අදහසක් මට ඇතිවන්නේ නැහැ. මම වන්නෙමි' යන අදහසකුත් මට ඇති වන්නෙ නැහැ. ඒ කියන්නේ මට අතීතයක් තිබුනයි අනාගතයක් තිබෙනවයි කියන හැඟීමක් මට එන්නෙ නැහැ. 'සංඛාරා විභවිස්සන්ති' - මට වැටහෙන්නේ මෙන්න මෙච්චරයි. සංස්කාරයන් විනාශවෙලා යනව. අතීතයේ උනෙත් ඒකයි. අනාගතයේ වෙන්න තියෙන්නෙත් එච්චරයි. 'තත්‍ථ කා පරිදෙවනා' - ඒ නිසා එහිලා කවර වැලපීමක්ද? මෙතන ඉතාමත්ම වැදගත් අදහසක් සඳහන් වෙනව. මේක අපි තවදුරටත් විස්තර කළොත්, දැන් නිවන පිළිබඳවයි මේ දේශනා මාලාව යන්නෙ. නිවන පිළිබඳ මේ දේශනාමාලාව පවත්වන්න සිද්ධ වුනෙත් මේ පිළිබඳ නොයෙකුත් විධියේ මතිමතාන්තර තිබෙන නිසා. අපි ගන්න ඉලක්කය කුමක්ද කියන එක පිළිබඳවවත් වැටහීමක් නැහැ අබෞද්ධයින් අතර පමණක් නොවෙයි බෞද්ධයින් අතරත්. දැන් මෙතනින් හොඳ කාරණා කීපයක් මතුකරගන්න පුළුවන්. මේ භවය පිළිබඳවයි මෙතන කථා කරන්නේ. මේ රහතන් වහන්සේ අතීත භවවල කොතෙකුත් ආත්ම භාව ලබන්න ඇති, ප්‍රේතයින් බ්‍රහ්මයින් හැටියට දෙවියන් හැටියට මනුෂ්‍යයින් හැටියට. එතකොට මෙතන මේ කියන්නෙ බොරුවක් 'නොවෙයි. 'න මෙ හොති අහොසින්ති' මම හිටියා කියල හැඟීමක් ඇතිවන්නේ නෑ කියල කීමෙන් අදහස් කරන්නේ මොකක්ද? අර සාමාන්‍ය ලෝකයා අතීත භව දැකල, එහෙම නැත්නම් අභිඥාලාභීන් එහෙම අතීතභව දැකල, කල්පනා කරන්නේ මම අසවල් ආත්මයේ අසවලා වෙලා හිටිය. මම දෙවියෙක් වෙලා හිටිය. බ්‍රහ්මයෙක් වෙලා හිටිය කියල, සමහර විට මාන්නය ඇතිකර ගන්නව. තිරිසනෙක්, ප්‍රේතයෙක් වෙලා හිටියනම් ඒ අනුව යම්කිසි හිත දුර්වලකරගැනීමක් ඇතිවෙනව. අන්න ඒ විධියේ තත්ත්වයක් මේ රහතන් වහන්සේට නැහැ. පෙනෙනව අතීතයේ තිබුනෙත් සංස්කාර ගොඩක්, අනාගතයෙත් ඇතිවන්නෙත් සංස්කාර ගොඩක්. චිත්‍රපටියෙ තිබුන දේවල් ඔක්කොම මවාපෑම් ගොඩක් කියල වැටහීම ඇතිකරගත්තු නරඹන්න වගේ, ප්‍රේක්ෂකයා වගේ, ප්‍රඥාව නිසා ඇතිවන තත්ත්වයක්. 'තත්‍ථ කා පරිදෙවනා' - ඒක නිසා මෙතන ඇත්ත වශයෙන්ම වැලපෙන්න දෙයක් නැහැ කියන එක.

සංස්කාර කියන එකට, අපි එක අවස්ථාවකදි කිව්වා භවයෙ තියෙන දහලීම් රැසක් සහ දැහලීම් රැසක් කියල. මේ දහලීම් - දැහලීම් ගැන කියන කොට අපට හිතාගන්න පුළුවන් කඹයක්, වර පටක් ආදිය ගෙතීමේදී කෙරෙන දෙයක්, මේ දහ වැටෙන එක. දහ වැටෙනව, දහ ලිහෙනව. පොඩි සරල උපමාවක් ආශ්‍රයෙන් අපට මේ භවය පිළිබඳව යම්කිසි වැටහීමක් ඇතිකරගන්න පුළුවනි. භවයත්, භවනිරෝධයත් කියන මේ කාරණා දෙකයි වැදගත් වන්නෙ. 'නිවන' හඳුන්වල තියෙනව භව නිරෝධය හැටියට. බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනව 'මම මේ භව නිරෝධය ගැන දේශනා කරනකොට ඇතැම් අය මට චෝදනා කරනවය උච්ඡේදවාදියයි කියලා - විශේෂයෙන්ම ආත්මවාදය ගත්තු බමුණන්. නමුත් ආත්මවාදය ගත්තු බමුණන්, තීර්ථකයන් පමණක් නොවෙයි, සමහර විට බෞද්ධ පඬිවරුන් පවා භයයි නිවන අභාවමාත්‍රයක් කියල. භවනිරෝධය කියන වචනයට බයයි. ඒක නිසා තමයි නොයෙකුත් විදියට ගුණවයක් ආරෝපනය කරන්නෙ නිවනට. මොකක්දෝ අමුතු එකක් මේක කියල. එතකොට මෙතන රහස කුමක්ද? භවය පිළිබඳ බුදුපියාණන් වහන්සේ දක්වන විශේෂ දර්ශනය ගැන අවබෝධයක් නැතිකම. බුදුපියාණන් වහන්සේ පහළවීමට කලින්, භවය පිළිබඳව ලෝකයා කල්පනා කළේ යම්කිසි 'සත්' පදාර්ථයක් හැටියට. භවය කියන්නේ සදාකාලික නිත්‍ය පදාර්ථයක් කියල. ඔවුන්ට මේ 'සත්' පදාර්ථය විනාශකිරීම උච්ඡේදයක් වුනා. 'මමය' 'මාගේය' කියල ගත්තු ආත්ම තත්ත්වයක්. බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කළ 'පටිච්ච සමුප්පාද' ධර්මයට අනුව මේ භවය විස්තර කෙරෙන්නෙ 'උපාදාන පච්චයා භවො' උපාදානය නිසයි මෙතන භවයක් පවතින්නෙ. අන්න එතන ඉතාමත්ම වැදගත් කාරණයක්, අල්ලා ගැනීම නිසයි භවයක් වන්නේ. අපි අර කලින් කියූ පාපුටුව, පාපුටුවක් උනේ පා පුටුවක් හැටියට පාවිච්චි කිරීම නිසා. ඒක පුටුවක් හැටියට අල්ල ගත්තොත් ඒ ජවනිකාවෙ ඒක පුටුවක්, ඒක මේසයක් හැටියට අල්ල ගත්තොත් ඒක මේසයක්. ඊළඟට ඒ වගේම අපිට හිතාගන්න පුළුවන්, දැන් නාට්‍ය ජවනිකාවක එකම ලී කැල්ල - ඒකෙ එලබගත්තොත් ඒක හැරමිටියක්, ඒක අමෝරා ගත්තොත් ඒක මුගුරක්, අවියක්. ඔන්න ඔය විදියට ලෝකයා සත්‍ය හැටියට ගන්න දේවල් වල 'දෙයක්' නැහැ. ඒව දේවල් හැටියට පෙනෙන්නෙ තණ්හා, මාන, දිට්ඨි වශයෙන්. චෛතසික හේතුනුයි මෙතන තියෙන්නෙ. චෛතසික හේතුන් ගොඩක්, ලෝකයා අමතක කරනව ඒවට සංකල්ප, ප්‍රඥප්ති ආරෝපනය උනාට පස්සෙ. ඒවා සත්‍ය දේවල් හැටියට හිතාගෙන, ඒවා විභක්ති අනුව හොඳට බෙදා හදා ගෙන අර විධියට පුටුවෙහි, පුටුව උඩ, පුටුව තුළ පුටුව මගේ ආදී වශයෙන් නොයෙකුත් විධියේ සංකල්ප, මන්‍යනාවන් ඇති කරගන්නව. ඔය විධියේ තත්ත්වයක් රහතන් වහන්සේගේ විමුක්ත සිතේ නැහැ. අන්න ඒකයි මෙතන තියෙන්නෙ.

'උපාදාන පච්චයා භවෝ' - තේරුම් ගන්නවා මේක උපාදානය නිසයි කියල. සාමාන්‍යයෙන් 'පටිච්ච සමුප්පාදය' විස්තර කරනකොට 'උපාදානපච්චයා භවෝ' කියන එක ගැන හිතන්නෙ මේ භවයේ උපාදාන නිසා ඊළඟ භවයක් ඇති උනා කියල. නමුත් මේක මොහොතක් පාසා වෙන දෙයක්. දැන් මම අතින් අල්ලගෙන ඉන්න මේ වට අත්ත වට අත්තක් උනෙ මේකෙන් ගත්ත ප්‍රයෝජනයක් නිසා. මේක වෙන දේකින් හැදුවත් මේකට වට අත්තක් කියනව, නමුත් මේක වෙන දෙයකට යොදනවනම් වෙන දෙයක් හැටියට ගන්න පුළුවනි. ඔය විදියට 'උපාදන පච්චයා භවෝ' මේ උපාදාන කියන වචනය ආශ්‍රයෙන් අපට මේ 'භවය' තවදුරටත් තේරුම් ගන්න පුළුවනි.

අපි පටන් ගත්තෙ මේ භවය 'දහලීම්' සහ 'දැහලීම්' සමූහයක් කියල. පොඩි නිදර්ශනයක් වශයෙන් අපට සිහියට නභා ගන්න පුළුවන් නම් - දැන් අපි දන්නව කඹයක්, වරපටක් ඇඹරීම් ආදියේදී කෙරෙන දෙයක් තමයි දෙදෙනෙක් දෙපැත්තක ඉඳගෙන මේක දහ-ලනව. දහලෑමකින් තමයි කඹයක් අඹරන්න පුළුවන්. එහෙම නැත්නම් වරපටක් අඹරන්න පුළුවන්, අපි යම්කිසි හේතුවක් නිසා වරපටක් මෙතනදී ගන්නව. වැල් තුන හතරක් අරන් දෙදෙනෙක් අඹරන්න පටන් ගන්නව. අඹරනව. සාමාන්‍යයෙන් ඇඹරීමේදී කරන්නෙ එක්කෙනෙක් එක පැත්තකට අඹරද්දී අනික් කෙනා අනික් අතට අඹරන්න ඕන. එතකොටයි ඇත්තවශයෙන්ම ඒක වරපටක් වෙන්නෙ. නමුත් මෙතනදී අපි හිතාගනිමු, නිදර්ශනයක් සඳහා, මේ විදියට අඹරන්න සූදානම් වන අවස්ථාවෙදිම මැදින් කවුරුහරි මේක අල්ලගන්නව, අර දෙන්නා දැක්ක හෝ නොදැක්ක හෝ - යම්කිසි හේතුවකින්, මේ දෙන්නත් අඹරගෙන යනව, හැබැයි පොඩි වැරදීමක් වෙනව, සාමාන්‍යයෙන් මේ වරපට අඹරන්න නම් දෙපැත්තේ දෙන්න දෙපැත්තට අඹරන්න ඕන. නමුත් මේ දෙන්නම එක පැත්තටයි අඹරන්නෙ. මේක මේ දෙන්නටම වැටහෙන්නෙ නෑ. මැද එක්කෙනාට වැටහෙන්නෙත් නෑ. මක්නිසාද? මැදින් අල්ලගෙන ඉන්න නිසා,. අර උපාදානය නිසා. මේ කෙරෙන දහ-ලීම ඇත්ත වශයෙන්ම දහලීමක් නොවන බව වැටහීමක් නෑ. හැබැයි අර උපාදානය නිසාම මේක දහලීමකුත් වෙනව. මැදින් අල්ලගෙන ඉන්න නිසා වරපටක් වගේ දෙයක් ඇඹරෙනව. වරපටක් වගේ දේකුයි ඇඹරෙන්නෙ. ඇත්ත වශයෙන්ම වරපටවල් දෙකක් කියල කියන්නත් පුළුවන්. එකපුද්ගලයෙක් අල්ලගෙන ඉන්න තැන ඉඳල මැද ඉන්න කෙනා ළඟට එක වරපටක්. එතන ඉඳල අනික් පැත්තට තවත් වරපටක්. නමුත් ඈතින් ඉඳන් බලනකොට බැලූ බැල්මට පේන්නෙ දෙන්නෙක් වරපටක් අඹරනව. තියෙන්නෙ ඇත්ත වරපටක්. අපි දැන් හිතමු මොහොතකට, හිටිගමන්ම, අර මැදින් අල්ලගෙන ඉන්න පුද්ගලය අතහැරිය කියල.

මොකක්ද වෙන්නෙ එතකොට? එක පැත්තටම දහ-ලමින් සිටිය මේ වරපටට එක මොහොතකින්'ම අර 'සබ්බ සංඛාරසමථ' 'සබ්බූපධිපටිනිස්සග්ග' වගේ දෙයක් වෙනව. ඒව එහෙම පිටින්ම ලිහිල ඇත්තවශයෙන්ම මෙතන වරපටක් නැහැ කියන අවබෝධය කෙනෙකුට එනව ඒ එක්කම. අන්න ඒ විධියෙ දෙයක් තමයි මේ ලෝකයත්. මේ ලෝකයේ තියෙන අනිත්‍යතාව, බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කළේ, මේක අල්ල නොගන්නා තාක්, උපාදනයක් නැතිතාක් - මේ අනිත්‍යතාවෙන් අපට කිසිම පීඩාවක් නෑ. ලෝකයේ හැම 'දහ-ලීමක්ම' ඒක්ෂණයෙන්ම 'දැහලීමකින් ඉවරවෙනව, එකයි ලෝකස්වභාවය මේ 'උදයබ්බය' කියල කියන්නෙ ඒකයි. එතකොට අර කොන් දෙකෙන්ම එක පැත්තට අඹරනකොට මැදින් අල්ලගෙන නැත්නම් මොකද වෙන්නෙ? අනන්ත කාලයක් 'කල්පකෝටි ගණනක්' අර දෙන්න එකතු වෙලා 'වරපට' එකපැත්තකට ඇඹරුවත් කවදවත් වරපට හැදෙන්නෙ නැහැ. මක්නිසාද? දෙන්නම එකපැත්තටයි කරකවන්නෙ. ඔන්න ඔය විධියේ තත්වයක් ලෝකෙ තියෙන්නෙ. ලෝකෙ බලන හැම දෙයකම තිබෙන අනිත්‍ය ස්වභාවයෙන් අපට පීඩාවක් වෙන්නෙ නැහැ. පීඩාවක් වන්නෙ අන්න මැදින් අල්ලගත්තු හැටියේ. මැදින් අල්ලගත්තු හැටියේ අන්න වරපටක් වගේ දෙයක් ඇඹරෙනව, ඕකටයි ලෝකයා 'ලෝකය' කියල කියන්නෙ. මේකයි ලෝකයා 'සත්‍ය' හැටියට ගන්නෙ. එහෙම සත්‍ය හැටියට ගැනීමේ ප්‍රතිඵලය මොකක්ද? මේක සත්‍ය වූ දෙයක් නම්, නිත්‍ය දෙයක් නම්, මේකෙ අනිත් පැත්ත, සත්‍යවූ ලෝකය විනාශ කිරීමක් වෙන්න ඕන උච්ඡේදයක් වෙන්න ඕන. මේ තත්වය පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ 'උපාදන පච්චයා භවො' කියන වචනයෙ අර්ථය අනුව කල්පනා කළොත් මේ පොඩි නිදර්ශනය මාර්ගයෙන්, ඇත්ත වශයෙන් මෙතන නැතිවෙන්න දෙයක් නැහැ. නැතිවෙන්න විනාශවෙන්න ආත්මයක් නැහැ.

ඇත්තවශයෙන්ම ලෝකයේ තිබෙන අනිත්‍යතාව උදයබ්බය වශයෙන් මොහොතක් පාසා ඇතිවීමක් සහ නැතිවීමක්. මේක මැදින් ග්‍රහණයක් ඇත්නම් - උපාදන පච්චයා භවො- ඊළඟට තියෙන්නෙ මොකක්ද? භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණ සොක පරිදෙව දුක්ඛ දෙමනස්සුපායාසා සම්භවන්ති' - දුක් දෙම්නස් උපායාසාදිය හරියට අර මැදින් අල්ලගෙන හිටිය තැනැත්තට ඇඹරීම නිසා වෙන පීඩා වගේ. ඒ විධියේ දෙයක්. එතකොට සෝවාන් ආදී මගඵල ලබන පුද්ගලයන් ලෝකය පිළිබඳව ලබාගන්නා වැටහීම ඉතාමත් කෙටියෙන් දක්වන පාඨයක් තමයි අපි කලිනුත් සඳහන් කළේ. 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං. බැලුවම කිසි දෙයක් ඒකේ නැහැ වගේ. යම්තාක් දෙයක් හටගන්නා ස්වභාවය ඇත්තේද? ඒ තාක් හැම දෙයක්ම නිරුඬ වන

ස්වභාවයක්ද ඇත්තේය. අන්න අර ලෝකයේ අහිංසක ඇතිවීමත් නැතිවීමත් පිළිබඳව ඉතාමත්ම සරල වැටහීමක් ඇතිවෙනව ඒ සෝවාන් පුද්ගලයාට. අර මැදින් අල්ලගෙන හිටිය පුද්ගලය මොහොතකට - මාර්ග චිත්ත බලයෙන් - අතහැරියාම වගේ. සාමාන්‍ය ලෝකයාගේ ස්වභාවය අල්ලාගෙන ඉඳීම. එල්ලීගෙන ඉඳීම. ඒක නිසා තමයි අර මැදින් අල්ලගෙන ඉන්න පුද්ගලයා අර දහලීම්, දැහලීම් මධ්‍යයේ කොපමණ පීඩා ඇති උනත්, සොකපරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස ඇති උනත් අතහරින්නෙ නැහැ. ඒක බොහොම අමාරුයි. බුදුපියාණන්වහන්සේ පහළවෙලා ධර්මය ප්‍රකාශ කරනතාක් ලෝකයා ඒක අතහරින්නෙ නැහැ. එතකොට කොයි ආකාරයකින් හරි අර ඒ උපාදාන ස්වභාවය මොහොතකට හරි ඉවත් කරල ආර්‍යඅෂ්ටාංගික මාර්ගය පුහුණු කරල - ලෝකෝත්තර වශයෙන් පුහුණු කරල - මොහොතකට අතහැරිය නම් පුද්ගලයෙක්, අන්න ඊළඟට ආයිත් අල්ල ගන්නකොට තේරෙනව අර දහ අඩුයි. 'සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස ඒව නැතිවෙලා ගිහිල්ල. අර දහය තරමක් දුරට ලිහිල. වරපට තරමක් දුරට ලිහිල. ඒ වගේම භවයට නැවත එන මොහොතෙදී තේරෙනව මේ භවයට එන්නෙ උපාදානය නිසයි කියල. මේ අල්ලගැනීම නිසයි කියල. ඒ අල්ලාගැනීම තියෙන්නෙ අර ආශ්‍රව අනුසය නිසා - අප්‍රහීන ක්ලේශ නිසා - කියල ඔය විදියේ වැටහීමක් එනව. පටිච්ච සමුප්පාදධර්මය එතනම තේරෙනව, ඔන්න ඔය විදියේ තත්ත්වයක් අපට මේ වරපට ආශ්‍රයෙන් තේරුම් ගන්න පුළුවන්. මේ භවය පිළිබඳව වටහාගන්න, මේ උපමාව තරමක් දුරට උපකාර වෙනවය කියල හිතනව. මක්නිසාද? ලෝකයා භවය ගැන කල්පනා කරන්නෙ - බෞද්ධ අබෞද්ධ හැම දෙනෙක්ම - අර සත් පදාර්ථය පිළිබඳව සාමාන්‍ය මිථ්‍යා දෘෂ්ටිකයින් ගත්තු දෘෂ්ටිය අනුවමයි. දෘෂ්ටිය පිළිබඳ පිරිසිදු වීමක් නැතිතාක් 'නිවන' ලෝකයා තුළ බියදනවන දෙයක්'. භව නිරෝධය කියන එකට බොහොම බයයි. අටුවාචාරීන්වහන්සේලා පවා සමහර විට නිවන හඳුන්වන විට අර 'ධ්‍රුව' කියන පදය වැරදියට තෝරනව.

ඒ කියන්නෙ 'නිවන' කියන වචනය හැඳින්වීමට සමහරවිට යොදනව 'සස්සත' කියන වචනය. කිසිසේත් කිට්ටු නොකළ යුතු වචනයක් නිවන හැඳින්වීමට යොදනව. 'නිත්‍ය ශාස්වත තත්ත්වයක් තමයි නිවන. අපෙන් අහන්න එපා මොකක්ද කියල. ඒක ප්‍රකාශ කළොත් ඒක අර බ්‍රහ්මත්වයට ළංවන නිසා, බ්‍රහ්මනිර්වාණ ආදියට ළංවන නිසා. නමුත් මේ විදියේ තත්ත්වයක් ඇතිඋනේ මක්නිසාද? අර 'ධ්‍රුව' කියන වචනය නිසා. බුදුපියාණන්වහන්සේ නිවන හඳුන්වන එක වචනයක් තමයි 'ධ්‍රුව'. ඒ වචනයෙ අර්ථය හරියට තේරුම් අරන් නැහැ. මේ 'ධ්‍රුව' කියල කියන්නෙ ස්ථිර, අචල කියන අදහසයි. සමහර අවස්ථාවල මේ සමගම බ්‍රහ්මය

එහෙම යොදනව 'නිච්චං ධුවං සස්සතං අවචනධමමං'[1]. ඔය විදියේ පද සමූහයක් යෙදෙනව තමයි. ඒ කියන්නෙ ඒව එක ළඟින් යන පද නිසා. නමුත් මෙතන නිවන 'ධුව' වශයෙන් හැඳින්වූයේ මක්නිසාද? නිවනින් ලැබෙන ප්‍රත්‍යක්ෂය කවදාවත් වෙනස්වන්නේ නැහැ. 'අචලං සුඛං' කියල ප්‍රකාශ කරන්නෙ ඒකයි. ඒ අදහසමයි, අකුප්පාචෙතොවිමුත්ති' කියන පදයෙන් හැඟෙන්නෙ. බුදුපියාණන් වහන්සේ නිවන හඳුන්වනව සමහර අවස්ථාවල 'අකුප්පාචෙතොවිමුත්ති කියල. අනෙක් හැම චෙතොවිමුත්තියක්ම කුප්පයි-කුප්ප පටිච්ච සන්ති [2] කෝප්‍යයි, කුපිත වෙනව, චලනය වෙනව, සමහරවිට ජීවිතකාලය තුළදී චලනය නොවුනත් මරණවේදනාව හමුවේ චලනය වෙනව. අවසාන දිනුම් කණුව තමයි මේ මරණ වේදනාව. යමෙකුගේ දිනුම හෝ නොදිනුම වැටහෙන අවස්ථාව තමයි මරණවේදනාව. ඒ මරණ වේදනාව හමුවේ අනෙකුත් චෙතොවිමුත්ති හැම එකක්ම පරාදවෙනව. නමුත් මේ කියන චෙතොවිමුත්තිය-මාරයා එන්න කලින් අතහරින මේ නිවන, අකුප්පා චෙතොවිමුත්තිය-කවදාවත් හෙලවෙන්නෙ නැහැ. ඒක අචලයි. 'අචලං සුඛං' කියල කියන්නෙ ඒකයි. 'ධුවං' කියල කියන්නෙ ඒකයි. ඔය විදියට බුදුපියාණන් වහන්සේ නිවන හැඳින්වීමට යෙදූ පදවල අර්ථය සමහරවිට හරිහැටි තේරුම් නොගත් බව පේනවා.

සමහරවිට බුදුපියාණන්වහන්සේ තීර්ථකයින් එහෙම යෙදූ වචන යොදනව වෙන අර්ථයකින්. එබඳු තැන් බොහොමයි. නමුත් ඒ තීර්ථකයින් යෙදූ අර්ථයෙන් ගත්තොත් ධර්මය විකෘත වෙනව. ඒ විදියෙ අවස්ථාවක් නිසා තමයි අටුවාචාරීන්වහන්සේලා ඉතාමත් අවාසනාවන්ත අන්දමට 'සස්සත' කියන වචනය පවා නිවන හැඳින්වීමට, යොදගෙන තියෙන්නෙ, ශාස්වත දෙයක් හැටියට. මූලිකම හේතුව අර භවය පිළිබඳ තියෙන වැරදි වැටහීම, මෙතන ඇත්ත වශයෙන්ම භවයක් තියෙනව කියල. 'අස්මිමානය' කියල වචනයක් තියෙනව. ඒකෙන් හැඟෙන්නෙ 'වෙමි' කියල මානයක් ලෝකයේ තියෙන බව. වෙන ශාස්තෘවරුන් බැලුවෙ මේ සත්‍ය වූ 'මම' බේරාගන්න. එහෙම නැත්නම් 'මම'ට අමෘත තත්ත්වයක් ලබාදෙන්න. බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ මෙතන ඇත්තවශයෙන් තියෙන්නෙ අස්මි මානයක්, 'වෙමි කියල කියන මානයක් පමණයි. මේ මානය ඉවත් කිරීමයි අවශ්‍යවන්නේ. අන්න ඒ නිසා තමයි නිවන පිළිබඳව සමහර විට සඳහන් වෙන්නෙ 'සම්මාමානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස' 'අස්මිමානසමුග්ඝාතං පාපුණාති දිට්ඨෙවධම්මෙ නිබ්බානං' - රහතන් වහන්සේ පිළිබඳව සඳහන් වෙනව අස්මිමානය විනාශ කිරීමක් කියන තත්ත්වයට පැමිණෙනව කියල. ඒක 'දිට්ඨෙව ධම්මෙ නිබ්බානං' ඒකමයි දිටු දැමියෙහිම නිවන. සමහර කෙනෙක් කල්පනා කරනව අස්මිමාන සමුග්ඝාතය වෙනමයි, නිවන වෙනමයි කියල. නමුත් අස්මිමාන

සමුගඝාතයත් එක්කම නිවීම එතනමයි. මක්නිසාද? මේක මේ ඇත්ත වරපටක්, ඇත්ත කඹයක්, කියල හිතාගෙනයි මෙච්චර කාලයක් අඹර අඹර හිටියෙ. මේක තේරෙන්නෙ නැත්තෙ අර උපාදානය - මැදින් අල්ලා ගැනීම - නිසයි. නමුත් අතහැරිය මොහොතෙ තේරෙනව. ඒ රහස වැටහීම නිසා තමයි ආර්ය පුද්ගලයා හැඳින්වීමට යොදන පද මේ සංසාරයේ උපදින උත්පත්ති සංඛ්‍යාව අනුව නම්කරල තියෙන්නෙ. අර වැටහීම එනව. සත්තක්ඛත්තුපරම' කියන සෝවාන් පුද්ගලය තව හත්වරයි උපදින්නෙ. අර 'දහය' ලිහිල. ඒ නිසා රහසක් වටහගත්ත, ආර්යාෂ්ටාංගික මාර්ගයෙම ගියොත් මේක ලිහාගන්න හැකිය කියල. අතහරින්න බයේනේ එල්ලිල ඉන්නෙ. අතහරින්නෙ නැත්තෙ මක්නිසාද? අතහැරියොත් විනාශයක් වෙයි කියල.

බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ මහ බරක් හැටියට පේන මේ බර, උපාදානය නිසාම ඇතිවන බරක් බවයි. යමක එල්ලී ගෙන ඉන්න වේගයමයි මෙතන තියන බර. ඒ කාරණය ලෝකයාට තේරෙන්නෙ නැහැ. මා විනාශවෙයි කියන හැඟීම නිසා අර කඹයෙ එල්ලිල ඉන්නව. නමුත් මොහොතකට හරි අත හැරියනම් තේරෙනව අර දහ-ලීම් දැහලීම් සමූහය ඒ මොහොතට නැතිවෙලා යනබව. ලිහෙන බව. ඒ ලිහීම පිළිබඳව සම්පූර්ණ අවබෝධය එන්නෙ සම්පූර්ණයෙන්ම අතහැරියාමයි ඒ අවස්ථාවෙ ආශ්‍රව අනුශය එහෙමපිටින්ම ක්‍ෂය කළා. එතකොට මේ පොඩි ගාථාව ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් 'තත්‍ථ කා පරිදෙවනා 'මොකක්ද මේකට අඬන්න තියෙන්නෙ? මක්නිසාද? මම හිටිය කියල අවබෝධයක් එන්නෙ නැහැ මම ඉන්නව කියල අවබෝධයක් එන්නෙත් නැහැ. මෙතන වෙන්නෙ සංස්කාරයන්ගේ විනාශයයි. 'විභව' කියල මෙතන යොදල තියෙන්නෙ වෙන අර්ථයකින්, සංස්කාර පිළිබඳ විභවයක්. 'භව-විභව' කියන වචන දෙක පිළිබඳව කථාකරන කොට සමහර කෙනෙක් හිතනව 'මේ භවය සත්‍ය ධ්‍රැව ආත්ම පදාර්ථයක්, විභව කියන්නෙ ඒකෙ විනාශය.' නමුත් මෙතන - විභවිස්සන්ති. - විභව කියන පදය යොදන්නෙ සංස්කාරයන්ගේ විනාශයට. ඒකට කවුරුවත් අඬන්න ඕන නැහැ. නාට්‍යයක භවයක තියෙන අර තාවකාලික, වෙලාව පිරිමහන-පුටුව, පාපුටුව, ආදිය වගේ යොදගන්න දේවල්. පුද්ගලයින් පිළිබඳව කල්පනා කරල බැලුවොත්, කර්මානුරූපව භවසංයෝජන නූල්වලින් එහාට මෙහාට වෙන රූකඩ ගොඩක්. මේ රූකඩ ගොඩ මුල්කර ගෙන තමයි දැන් අපි මේ දේශනාව පවත්වන්නෙත්. පිරිසක් නැත්නම් දේශනාවක් නැහැ. මෙතන මේ දේශනාව කියල කියන නාටකයට උපකාරවන අනිකුත් - මා ඒ වචනෙ නොකීවත්- අපි හැමදෙනාම එක්තරා නාට්‍යජවනිකාවක යෙදිල ඉන්නෙ. දැන් මේක ලොකුවට පෙනුනට මේ වගේම තවත් ජවනිකා සමහර විට බඹ කීපයක් එහායින් කැලේ එහෙම

සිඩ වෙනව ඇති. කඩියො රැලක් සමහරවිට බොහොම කඩිසරව වේදනාවෙන් පෙලෙන ගැඩවිල්ලෙක් උස්සාගෙන යනව ඇති. ඒක ඔවුන්ගේ ජීවිතයේ, ඔවුන්ගේ භවනාටකයේ, එක්තරා ජවනිකාවක්. ඒ වගේම තමයි මේ හැම එකක්ම. එතකොට මෙන්න මේ රාමුව අපට නොපෙනීම තමයි අවිද්‍යාව. මේ අවිද්‍යා රාමුව යම් කිසි අවස්ථාවක අර ආශ්‍රව, අනුසය වලින් විමුක්තව පෙනුනොත්, ඒ තැනැත්තට අන්න ලෝකය එහෙම පිටින්ම විවෘතයි. හරියට අර චිත්‍රපටි ශාලාවේ දොරවල් හදිසියේ ඇරුන වගේ. ඒ තිරයෙ තියෙන ජවනිකාව එහෙමපිටින්'ම සබ්බසංඛාරසමථ' සබ්බූපධිපටිනිස්සග්ග' ආදි අපි කලින් ප්‍රකාශ කළ ආකාරයට එතනින්ම ඉවරයි. ඒ දෙවෙනි ගාථාවයි.

ඊළඟට අපි එමු තුන්වෙනි ගාථාවට.

**සුද්ධං ධම්මසමුප්පාදං - සුද්ධං සංඛාරසන්තතිං**
**පස්සන්තස්ස යථාභූතං - න භයං හොති ගාමණි**

ඒ කියන්නේ 'සුද්ධං ධම්ම සමුප්පාදං- ශුද්ධ ධර්මයන්ගේ හටගැනීමත්. 'සුද්ධංසංඛාරසන්තතිං ශුද්ධ සංස්කාර සන්තතියත් 'පස්සන්තස්ස යථාභූතං'- ඇති තතු හැටියෙන් දකින්නාට, න භයං හොති ගාමණී'- ගම්දෙටුව භයක් නම් ඇතිවන්නෙ නැත. දැන් මේකත් අපට පුළුවන් ලිහල හුහක් ගැඹුරු අර්ථ මතුකර ගන්න. මේකෙ නැති දේවල් නොවෙයි තියෙන දේවල්. මේ ගාථාවෙ තියෙන දේවල්. අපේ ශක්තිප්‍රමාණයෙන් මතුකරගන්නයි බලන්නෙ. මේ 'සුද්ධ ධම්ම' කියල කියන්නෙ මොකද? ලෝකයා 'ධම්ම' හැටියට සළකන දේවල් මනසට අරමුණු වන ඒ ධර්මවල අශුද්ධ ස්වභාවයක් තියෙන නිසා. අශුද්ධ වන්නෙ මක්නිසාද? ආශ්‍රව සහිතයි. මෙතන තියෙන්නෙ අනාශ්‍රව ධර්මයන්. රහතන්වහන්සේට ලෝකයේ දේවල් අරමුණු වන්නේ අනාශ්‍රව වශයෙන්. ඒවායෙන් සංඛතයක් ගොඩනැගෙන්නෙ නැහැ. ඒව 'නමට' සංස්කාර. ඒවායින් චිත්‍රපටියක් ගොඩ නැගෙන්නෙ නැහැ. අර චිත්‍රපටියේ පෙන්වන දර්ශනවල බිය ජනක දර්ශන මේ මේ ආකාරයට හැදිල තියෙනව කියන වැටහීම යටපත් නොවී - අවිද්‍යානුසයෙන් යටපත් නොවී - තියෙනව නම් කෙනෙකුට චිත්‍රපටියක් රසවිඳින්න බැහැ ඇත්තවශයෙන්. ඒ තැනැත්තාට චිත්‍රපටියක් නැහැ. චිත්‍රපටිය එතනින්ම ඉවරයි. අන්න ඒවාගේ මේව සුද්ධ ධම්ම වශයෙන් රහතන්වහන්සේට වැටහෙනව. මේ ධර්ම ඇතිවෙනව, නැති වෙනව එච්චරයි. 'සුද්ධං සංඛාරසන්තතිං' මේව අර සංස්කාර පෙළක් විතරයි සේයා රූපටක් ඔහේ කැරකැවෙනව කියල අන්න ඒ වගේ හැඟීමක් එනව, මේක දකින තැනැත්තාට. 'ගම්දෙටුව, බයක් නම් ඇතිවන්නෙ නැහැ'

අපි මේකටත් අපේ ශක්ති ප්‍රමාණයෙන් උපමාවක් කිට්ටුකළොත් මේ විදියට අපට දක්වන්න පුළුවන්. මහන මැසිමක මහගෙන, මහගෙන යනකොට - අපි දන්නව මැසිමක මහනකොට රෙදි දෙපටක් එකතු කරල මහන්නෙ - හදිසියෙම ඒ මැසිමෙ යටිනූල ඉවරඋනා කියල හිතමු. එතකොට මොකක්ද වෙන්නෙ? යටිනූල ඉවරඋන බව දන්නෙ නැත්නම් මේක මැහිච්ච මැහුමක් වගේ පේන්නත් පුළුවන්. නමුත් බලනකොට මැහිල නැහැ. මොකද වෙලා තියෙන්නෙ. මැහීමක් සම්පූර්ණ වෙන්න නම්, මෙතන තියෙන්න ඕන කාරණා කීපයක්. ඉඳිකටුව පහලට යනවත් එක්කම යටින් නූල එකතුවෙලා මේකට ගැටයක් වැටෙන්න ඕන. රහතන් වහන්සේට මේ ගැටේ වැටෙන්නෙ නැහැ. සංස්කාර නිසා සංඛතයක් ගොඩනැගෙන්නෙ නැහැ. තණ්හා මාන දිට්ඨි නැහැ. තණ්හා වශයෙන් ඇලීමකුත් මාන වශයෙන් වෙළීමකුත් දිට්ඨි වශයෙන් පැටලීමකුත් අවශ්‍යයි මේ 'භව' ගැට ගැහෙන්න. රහතන් වහන්සේගේ හිත වැඩ කරන්නේ යටිනූල ඉවරඋන මහන මැසිමක් වගේ. මේවාට ඉතින් නොයෙකුත් වචන වලින් 'ක්‍රියා සිත්' වැනි දේ කිව්වත් මේ හැම එකකින්ම ඇඟවෙන්නෙ අනාශ්‍රව ධර්ම. ඒවායින් සංඛතයක් ගොඩනැගෙන්නෙ නැහැ. මක්නිසාද? මේව ඇතිවෙනව නැතිවෙනව. ස්වභාවධර්ම වශයෙන්. පටිච්ච සමුප්පාදයෙ මුලින් අවිද්‍යාව දල තියෙන්නෙ මොකද? මේ අවිද්‍යාව නිසා ඇතිවන ධර්ම පරම්පරාවක් - ඒ ක්ෂණයෙන්ම - මේකට කාලයක් නැහැ. අකාලිකවමයි. ධර්මය අකාලිකයි කියල කියන්නෙ ඔය නිසයි. මේ පටිච්ච සමුප්පාදය භවත්‍රයකට බෙදල සංසාරගත විදියට තේරුම්කරන්නට යාමෙන් තමයි මේ ධර්මයේ සන්දිට්ඨික අකාලික ගුණය යටපත් වෙලා තිබෙන්නෙ. අවිද්‍යාව නිසා අර තරම් ධර්ම පරම්පරාවක් ඇති වෙනවනම්, භව ජාති, ජරා, මරණ, ආදියක් ඇතිවෙන ඒ තත්ත්වය ඒ ක්ෂණයෙන්ම ඉවර වෙනව අවිද්‍යා ප්‍රහාණයෙන්. ඒක නිසා තමයි 'න භයං හොති ගාමණි'.

'අමෘත' කියල කියන්නෙ මරණ භය නැතිවීමයි. එතකොට මරණය පිළිබඳව ලෝකයා තුළ තිබෙන්නෙ එක්තරා 'හුඹස් බියක්'. වම්මික සූත්‍රයේ[3] හුඹහක උපමාවක් ප්‍රකාශ කරල තියෙනව, මේ ශරීර කූඩුව සතරමහාභූතයන් නිසාත් මව්පියන් නිසාත් ආහාරපාන ආදිය නිසාත් එකතු වෙලා ගොඩනැඟුණු හුඹහක් හැටියට. ඒ සූත්‍රයේම ප්‍රකාශ කරනව 'අභික්ඛණ සුමෙධ සත්ථං ආදය'. නුවණැති පුද්ගලය, ආයුධයක් අරගෙන මේ හුඹහ බිඳින්න කියල. මේ හුඹහේ සත්‍ය වූ ආත්ම නාගයෙක් ඉන්නව කියන හැඟීමයි ලෝකයා තුළ තිබෙන්නෙ. මේක බිඳල බැලුවම අන්තිමට වෙන්නෙ කුමක්ද? හමුවෙන්නෙ කවුද? අර ලෝකයාගෙන් වැඳුම් පිදුම් ලැබිය යුතු අනාත්ම රහතන්වහන්සේ කෙනෙක්. අනාත්මය ප්‍රත්‍යක්ෂ කළ නාගයෙක්. වම්මික සූත්‍රයට නොයෙකුත් විධියට අපට අර්ථ එකතු

කරගන්න පුළුවනි, ධර්මානුකූලවම. අන්න ඒ විදියෙ තත්ත්වයක් මෙතන. එතකොට මේ චාතුම්මහාභූතික කය පිළිබඳව, එහෙම නැත්නම් ඝනසංඥාවෙන් ලෝකයා ගන්නා කය පිළිබඳව, ඒ ඝන සංඥාව නිසාමයි මරණභයක් ඇතිවෙන්නෙ. භවය නිසාම එතන ජාතිය තියෙනව. පටිච්චසමුප්පාදය පිළිබඳව හොඳ වැටහීමක් මේ අනුව කෙනෙකුට ඇතිකරගන්න පුළුවන්. ජාති කියන වචනය කියනකොටම සමහරවිට සිහියට නැගෙන්නෙ මව්කුසින් බිහිවන පොඩිදරුවෙක්. ඒ විධියෙ දෙයක්. නමුත් මෙතන බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකරන ජාතිය අර භවයත් එක්කම සම්බන්ධයි. අර උපාදානයත් එක්කම සම්බන්ධයි. අපි යම්කිසි දෙයක් පාපුටුවක් හැටියට පාවිච්චි කරන අවස්ථාවෙ අන්න පාපුටුව උපන්න. පාපුටුවෙ ප්‍රයෝජනය නැතිඋන අවස්ථාවෙ පාපුටුව මැරුණ. අන්න ඒ අදහසින්ම තමයි අරියපරියෙසන සූත්‍රයෙ[4] ජාතිධම්මංජරාධම්මං කියල ප්‍රකාශ කරන තැන්වල 'ජාති ධම්මා හෙතෙ භික්ඛවෙ උපධයො' මේ උපධි හැම එකක්ම ජාති ස්වභාවයයි කියල එහෙම ප්‍රකාශ කරන්නෙ. පුත්තභරියං දසිදසං වගේ පණ ඇති දේවල් පමණක් නොවෙයි එතනම සඳහන් වෙනව 'ජාතරූපරජතං ජාතිධම්මං'. අපි දැන් කල්පනා කර බලමු මිල මුදල් ආදිය කොහොමද උපදින්නෙ? කොහොමද ඒවා 'ජරාධම්ම' වෙන්නෙ? ඒ උපදින්නෙ අර තණ්හා මාන දිට්ඨි ආදිය නිසයි. ඒවාට භවයක් ලැබුන. ඒවට උත්පත්තියක් ලැබුනා. ඊ ළඟට උත්පත්තිය නිසාම ඒ උත්පත්තියත් එක්කම අරගෙන එන එක තමයි ජරාමරණ ආදිය. ඒක නිසාම සෝක පරිදේව ආදියට ඒව අරමුණුවෙනව. උපකාර වෙනව. ඔන්න ඔය විදියට මේව තනිකර සංස්කාර වශයෙන් දකින තැනැත්තාට අර දේවල් හැදෙන්නෙ නැහැ. අනිදස්සන විඤ්ඤාණය පිළිබඳව ප්‍රකාශකරන අවස්ථාවල තේරුම්ගැනීමට අපහසුයි වගේ. මක්නිසාද මෙතන මහ වචන ගොඩක් විතරයි තියෙන්නෙ. 'පඨවිං නාහොසිං පඨවියා නාහොසිං පඨවිතො නාහොසිං' ඔය විදියට මෙතනින් කියවෙන්නෙ කුමක්ද? මේ ලෝකයා භවයක් ගොතාගන්න, භවනාටකය සත්‍යදෙයක් හැටියට සැබෑ දෙයක් හැටියට තහවුරු කරගන්න, එකිනෙකා අතර ව්‍යවහාර කරගන්න උපකාර කර ගන්නාවූ සංකල්ප සමූහයම රහතන්වහන්සේ දකිනව එහෙම පිටින්ම මවා පෑම් ගොඩක් හැටියට. මේවායේ නියම හරයක් නැහැ කියන ඒ වැටහීම 'අවබෝධය' රහතන්වහන්සේට තියෙනව.

එතකොට අපි මහන මැසිමෙ උපමාවෙනුත් ප්‍රකාශ කළේ - භවයක් ගෙතෙන්නෙ නැහැ. භවනිරෝධය එතනමයි. සමහර කෙනෙක් කල්පනා කරනව රහතන්වහන්සේ මැරුණට පස්සෙ තමයි - අපි ඒ වචනය යොදන්නෙ ලෝකයා පාවිච්චි කරන අර්ථයෙන් - නිවන්දුව විඳින්නෙ කියල- නමුත් භවනිරෝධය ප්‍රත්‍යක්ෂ කරනව 'දිට්ඨෙව ධම්මෙ'. වෙන කිසිම

ආගමක නැති විදියේ පුදුම දෙයක්. භවනිරෝධය ප්‍රත්‍යක්‍ෂවෙන්නෙ අර මහන මැසිමෙ යටිනූල ඉවරඋන අවස්ථාවෙයි - 'අනුසය සමුග්‍ඝාතය'. ඒ එක්කම ආශ්‍රව කිසිවක් නැහැ. තණ්හා මාන දිට්ඨි කිසිවක් නැහැ. ඒ නිසා මේව එනව, යනව. අමෘතය එතනයි 'අමතං පරිභුඤ්ජන්ති' රහතන් වහන්සෙල අමෘතය පරිභෝග කරනව. දැන් අර අධිමුත්ත රහතන්වහන්සේ පිළිබඳව ඇත්තවශයෙන් සිද්ධඋනේ සොර දෙටුව ධර්‍මය තේරුම්අරගෙන රහතන්වහන්සේ මරණයට පත්කරනව වෙනුවට නිදහස් කරල මහණඋනා කියල සඳහන් වෙනව, නමුත් රහතන්වහන්සේ මරණයට පත්කළත් උන්වහන්සේ පිරිනිවන් පාන්නෙ අමෘතය පරිභොග කරමින්. මක්නිසාද? මාරයා උදුරාගන්න කලින් අතහැරීම නිසා. ඒක නිසා තමයි භයක් නැත්තෙ. හුඹස්බිය නැති උනා. මරණය පිළිබඳ ලෝකයා තුළ ඇති හුඹස් බිය නැති උනා. ඕකයි අමෘතය කියල කියන්නෙ. අමෘතය කියල කියන්නෙ අර දෙවියන් අසුරයින් සටන්කරල ලබා ගන්න අමුතු බෙහෙතක්, අමුතු පානයක් 'රසවත් පානයක්' නොවෙයි. ඔය කියපු අමෘතත්වය- අමෘතත්වය පිළිබඳ හැඟීම, ඒ නිදහස, ඒ විමුක්ති සුවය අන්න ඒක තමයි අමෘත නම් වූ නිර්වාණය. ඉතින් මේකට සදකාලිකත්වයක් අවශ්‍යවන්නේ නැති බව අමුතුවෙන් කියන්න ඕනෙ නැහැ. අපි අර 'කිං කයිරා උදපානෙන ආපා චෙ සබ්බද සියුං' කියන ගාථාවෙනුත් ප්‍රකාශ කළා. පිපාසය නිවාගත්තට පස්සෙ තවත් මොකටද ලිං? තවත් මොකටද වතුර? ඊළඟ ගාථාවත් අපි ගනිමු.

**තිණකට්ඨසමං ලොකං - යද පඤ්ඤාය පස්සති**
**මමත්තං සො අසංවින්දං -නත්ථි මෙති න සොචති**

මේ ඔක්කොම ශූන්‍යතාව පිළිබඳ වටිනා ගාථා. යම් අවස්ථාවක කෙනෙක් ප්‍රඥාවෙන් මේ මුළු ලෝකයම - අභ්‍යන්තර බාහිර මේ මුළු ලෝකයම- 'තිණකට්ඨසමං' තණකොළ, ලීකෑබලි හා සමාන කර, ඒ කියන්නෙ නිසරු කියන එකයි- නිසරු ස්වභාවයෙන් 'පඤ්ඤාය පස්සති' ප්‍රඥාවෙන් දුටුව නම් 'මමත්තං සො අසංවින්දං' - මමත්වයක් පිළිබඳ හැඟීමක් නැතිවන්නේ, මමත්වයක් අල්ලාගන්නෙ නැතිව, 'නත්ථි මෙති න සොචති' මට යමක් නැතිඋනා කියල අඬන්නෙ නැහැ. අර භව නිරෝධය කියන වචනයට භයවන්නෙ නැහැ. මක් නිසාද? මේ ඔක්කොම නිසරු දේවල්. මෙතෙන්දිත් අපට යම්කිසි දෙයක් ප්‍රකාශකරන්න වෙනව. සමහරවිට මේව අමුතුවෙන් විස්තර කළයුතු දේවල් නොවෙයි කියලත් හිතෙන්න පුළුවනි. මේ ලෝකයේ තියෙන දේවල් 'දේවල්' වන්නෙ කොහොමද කියන එක. අපි දැන් හිතමු නාට්‍ය ගැන කල්පනා කළ නිසා ඒකට සමාන එක්තරා ජවනිකාවක් ලෝකයෙන් ගන්න බලමු.

දැන් ඔන්න යම්කිසි කෙනෙක් කැලෑපාරක ගමන්කරනව. හදිසි ගමනක් යන අතරෙ එක කකුලක් හැපෙනව ගලක. බොහොම වේදනයි. අර ගලට සාප කරල ගල අහකට තල්ලුකරල දනව. තව ටිකක් එහාට යනකොට තවත් ගලක් කකුලෙ හැපෙනව. ඒක අරිටත් වඩා බොහොම වේදනා සහිතයි. ආයිත් හැරිල බලල අර ගල හෙමිහිට අහුලගෙන වටපිට බලල ඒක පිහදල, ඒක ලේන්සුවකින් ඔතල ඉනේ සහවගන්නව. ඉස්සෙල්ල හැපුනෙත් ගලක් පස්සෙ හැපුනෙත් ගලක් මොකද මේ වෙනස? ඉස්සෙල්ල හැපුනෙ තිරිවාන ගලක්. පස්සෙ හැපුනෙ මැණික් ගලක්. එතකොට ලෝකයා තුළ මේ මැණික් ගල නිසා ඇතිවන තණ්හා මාන දිට්ඨි නිසා ලෝකයා මැණික වටිනා දෙයක් හැටියට සළකනව. ඉස්සෙල්ල කකුලෙ හැපුනේ අවාසනාවට, පස්සෙ හැපුනෙ වාසනාවට. දැන් මේ කියන සිද්ධිය ඇත්ත වශයෙන්ම අපි චිත්‍රපටි කැමරාගත කරතොත් එක්තරා විදියක හාස්‍යජනක නාට්‍යයක්. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් ලෝකයේ හැම එකක්ම පිළිබඳව තියෙන්නෙ. ලෝකයේ අවට තිබෙන දේවල් රන් රිදී මුතු මැණික් මේ හැම එකක්ම අපි පාවිච්චි කරන හැම දෙයක්ම රහතන් වහන්සේට පේන්නෙ නාට්‍යවේදිකාවක ඇති උපකරණ ගොඩක් වගේ. ඒ වේදිකාවෙ පසුබිමේ තිබිල වේදිකාවට ගත්තට පස්සෙ ඒව ඇත්ත දේවල් හැටියට පේනව. ඒ ඒ ජවනිකාවට අදල හැටියට ඇත්තදේවල් හැටියට පෙනෙනව පමණක් නොවෙයි ඒව අපේ සිතේ තැන්පත් වෙනව. ඒව එසේ තැන්පත් වෙලා තමයි උපාදනස්කන්ධ හැටියට අපි මේ දීඝ සංසාරයෙ අරගෙන යන්නෙ ඇලුම් බැඳුම් ගැටුම් ආදිය. සංසාරයෙ අර කියාපු විදියට සමහර විට අතීතයේ ඇති කර ගත්තු ද්වේශ, අතීතයේ ඇතිකර ගත්තු ඇලුම් මේව අනුව තමයි - යටි හිතේ වගේ - හැසිරීම් පවතින්නෙ. වෙන එකක් තබා කර්මානුරූපව ඒව අනුව තමයි සමහරවිට පලිගැනීම ඇලුම් බැඳුම් ආදිය ඇතිවන්නෙ. මේව ගැන කල්පනා කරල බලන කොට හරියට අර එක ජවනිකාවක යමක් පාපුටුවක් හැටියට ගන්න කොට ඒක ඇත්තවශයෙන්ම පාපුටුවක්. ඊළඟ ජවනිකාවට ඒක ගන්නකොට ඒ බඩුවමයි කියල හැඟීමක් නැහැ. මේක මවාපෑමක් කියන හැඟීමක් නැහැ, අන්න ඒ විදියෙ තත්ත්වයක් තමයි අර 'සංස්කාර' බව - මේව තනිකර 'සංස්කාර' බව - නොදැනීමෙන්, ලෝකයා මේ සංකල්ප දැඩිව ගැනීම නිසා අසුචල් ජාතියෙ මම අසුචලා කියල ඔය විදියට ලෝකයේ තියෙන සචේතනික අචේතනික වස්තු සමුදයම ගන්නව. ඇත්ත වශයෙන්ම පෙන්නුම් කරන්න පුළුවන් අපි අර නාට්‍යයක චිත්‍රපටියක යොදගන්න තාවකාලිකව වෙලාව පිරිමහ ගන්න යොදගන්න දේවල් වගේ. මේ සතර මහාභූතයින්ගේ හොල්මන් කියල ප්‍රකාශ කළේ ඒකයි. සතරමහා භූතයින් තමයි ඒ අතින් පෙන්නුම් කරන මහපුදුම හොල්මන් කාරයින්. මේ හොල්මන්වලටයි

ලෝකයා මුලාවෙලා අර රූප සඥ්ඥව ඇති කරගන්නෙ. ඔය විදියට භවනාටකයෙ තිබෙන එක්තරා සවභාවයක් මෙතනින් ප්‍රකාශකරනව.

මේ කියන භවනාටකයෙ ශූන්‍යත්වය නිස්සාරත්වය පිළිබඳ එක්තරා අංශුමාත්‍ර අවබෝධයක් හරි යෝගාවචරයකුට ලබාගන්න පුළුවනි. සතිපට්ඨාන සූත්‍රයට අනුව, සතිසම්පජඤ්ඤයෙන් ඉරියවු පැවැත්වීමේදී. සම්පජඤ්ඤය පුරුදුකිරීමේදී මේ යෝගාවචරයට නොමිලයේම ඒක පුද්ගල නාට්‍යයක් නරඹන්න අවස්ථාව ලැබෙනව. මෙන්න මේ විදියෙ නාට්‍යයක්. ගච්ඡන්තො වා, ගච්ඡාමීති පජානාති 'යන්නේ හෝ යෙමියි දැනගනියි' 'ඨිතො වා ඨිතොම්හීති පජානාති 'සිටියේ හෝ සිටියෙමියි දැනගනියි' 'නිසින්නොවා නිසින්නොම්හීති පජානාති' 'හුන්නේ හෝ හුන්නෙමියි දැනගනියි' 'සයානො වා සයානොම්හීති පජානාති' 'හෝනේ හෝ හෝනෙමියි දැනගනියි. ඔය විදියට ඉරියවු පැවැත්වීමේදී තමතමන්ගේ සවරූපය තම තමන්ටම පේනව හරියට ඒක පුද්ගල නාට්‍යයක් වගේ. ඒ වගේම අර රූප ධර්මයන්ගේ පදනම ඉවත්වනවිට නාමධර්මයන් එක්තරා විදියක අර්ථශූන්‍ය හොල්මන් බවට පත්වෙනව. රූපධර්මයන්ගේ පදනම තමයි පඨවි ආපො තෙජො වායො කියන ඒවා. මේ පඨවි ආපො තේජො වායො පිළිබඳව යම්කිසි විරාගයක් සිතේ ඇති වෙන කොට, ඒ යෝගාවචරයට පෙනෙනව මේ නාම ධර්මයනුත් නිකං හොල්මන් ගොඩක් වගේ. සමහර විට නැති දේවල් ගොඩක් එක්කයි මේ රඟපෑමක් කරන්නෙ කියල. නැති දොරක් අරින්නෙ "නැති පුටුවක්" - ඔය විදියට දැන් මේකත් අපි නිතර යොදගන්න නාට්‍ය චිත්‍රපටි උපමා අනුව කල්පනා කරල බැලුවොත් ලෝකයේ තියෙනව එක්තරා නාට්‍ය සම්ප්‍රදායක්. ඒක මේ කාලයේ හැඳින්වෙන්නෙ අභිරූපන නාට්‍ය නමින්. ඒ නාට්‍ය විශේෂය එක්තරා විදියක ගොලු නාට්‍ය වගයක්. ඒ නාට්‍යවල සමහරවිට මෙන්න මේ වගේ ජවනිකා දකින්න පුළුවන්. නැති පා පැදියකින් නැති කන්දක් නැගල, නැති කෙනෙක් හමුවෙලා, නැති සාකච්ඡාවක් කරනව, එහෙම නැත්නම්, නැති පුටුවක හිඳගෙන, නැති මේසයක් උඩ, නැති පොතක, නැති පෑනකින්, නැති ලිපියක් ලියනව. මේ 'නැති', 'නැති ' කියල අපි ප්‍රකාශකළේ මොකද? වේදිකාවෙ පාපැදියක්වත්, කන්දක්වත්, වෙන පුද්ගලයෙක්වත් නෑ. වෙන දෙයක් වත් නෑ. කිසිම භාණ්ඩයක් නැහැ. නමුත් අර අභිනයෙන්, අංග චලනයෙන්, මුද්‍රා ආදියෙන්. යම්කිසි දෙයක් පෙන්නුම් කරනව. මේ විදියෙ නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයින්ට ඇතිවන්නෙ හාස්‍ය රසයක්. මේක විහිළුවක් වගේ. ඔන්න ඔය විදියෙ සවභාවයක් අර යෝගාවචරයටත් වැටහෙන්න පටන්ගන්නව. අර රූප ධර්මයන්, ධාතූන්, ශූන්‍ය වශයෙන් බලමින් සතර මහා භූතයින් ශූන්‍ය වශයෙන් සළකමින්, නාමරූප සම්මර්ශනය කරන අවස්ථාවෙ කෙනෙකුට වැටෙහෙන්න පුළුවන් මේ භව නාටකයේ ඇති ශූන්‍යත්වය, නිස්සාරත්වය,

අංගුමාත්‍රයක්වත්. 'නැතිදේවල් එක්ක නේද මේ වැඩේ ගෙනියන්නෙ' කියල. හරියට අර වේදිකාවෙ නැති පාපැදියකින්, නැති කන්දක් නගින්න වගේ එහෙම නැත්නම් නැති මේසයක් උඩ, නැති පොතක යමක් ලියන්න වගේ, නැති දේවල් සමග. ඒ එක්කම වැටහෙන්නෙ මොකක්ද? මේ නාමධර්ම තියෙන්නෙ අර රූපධර්ම මුල්කරගෙනයි රූපධර්මයන්ටත් මේ නාමධර්ම උපකාරීවෙනව කියල එක්තරා වැටහීමක්. මේ දෙක තුළින් මතුවෙන්නෙ මොකක්ද? මේ එකක්වත් සකසුදුගොඩවල් හැටියට අරගෙන යම්කිසි වට්ටෝරු වෙදකමක් කිරීමට අවස්ථාවක් නොවෙයි මේ. නාමය නිසා රූපය පවතිනවනම්, රූපය නිසා නාමය පවතිනවනම්, දෙකම ශූන්‍යයි. ඒ ශූන්‍යතාව පිළිබඳ වැටහීමයි මෙතන කියන්නෙ. මේව කෑලිවලට කඩල ගොඩගසාගෙන එක්තරා විදියක වට්ටෝරු වෙදකමක් ආරම්භ කළොත් අර සංඥා හිතේ එකතු වෙනව. මෙයින් මිදෙනව වෙනුවට බැඳෙනව. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් ඇතිවෙන්න ඉඩ තියෙනව.

# අධෝලිපි

1. බ්‍රහ්මනිමන්තනික සූ.ම.නි. I 764 පිටුව (බු.ජ. 10)
2. දුට්ඨට්ඨක සූ.සු.නි. 248 පිට. (බු.ජ. 25)
3. ම.නි. I 355 පිට. (බු.ජ.10)
4. ම.නි. I 396 පිට. (බු.ජ.10)

# 9 වන
# දේශනය

# 9 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි-පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං".

'මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැරදැමීම තණ්හාව ක්ෂය කිරීම නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය'

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහාසංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනාමාලාවේ නවවන දේශනයයි මේ.**

සංසාරගත සත්ත්වයා මේ භවනාටකයේ දක්වන නිස්සාර, ශූන්‍ය, විකට රඟුම සම්බන්ධයෙන් - ඒ විකටරඟුම සතිපට්ඨාන සූත්‍රයට අනුව ඉරියවු පවත්වන යෝගාවචරයාට ක්‍රමක්‍රමයෙන් ප්‍රකට වන ආකාරය ගැන අපි තරමක් දුරට පසුගිය දේශනයේදී විස්තර කළා. නාමය රූපයෙහි සෙවනැල්ලක් පමණක් බව හෙළිවන්නේ රූපයේ පදනම වන ධාතූන් ශූන්‍ය වශයෙන් බලමින් ඒ යෝගාවචරයා ඉරියවු පැවැත්වීම් ආදිය කරන අවස්ථාවේදි බවත් අපි සඳහන් කළා. අභිරූපන නාට්‍ය නමැති එක්තරා නාට්‍යයක් උපමා වශයෙන් සඳහන් කළා. ඒ නාට්‍යයේ විශේෂත්වය වේදිකාවේ අන්කිසිවෙකු නොමැතිව, යම්කිසිදෙයක් නොමැතිව, කෙනෙකු සිටින හැටියට, දෙයක් ඇති හැටියට දක්වමින්, නිරූපණය කරමින් එක්තරා විධියක හාස්‍යජනක ජවනිකා මවන නාට්‍ය විශේෂයක් නිසා. ගොලු නාට්‍ය විශේෂයක්. අන්න ඒ ගොලුනාට්‍ය පිළිබඳ ඒ ධර්මතාව වගෙයි කෙනෙකුට වැටහෙන්නෙ, ඒ යෝගාවචරයට වැටහෙන්නෙ, ඉරියවු පැවැත්වීමේදී. අර නාමධර්මයන් රූපය ඇසුරුකොට තිබෙන බව වැටහෙන්න පටන්ගන්නව, සතර මහාභූතයන් ශූන්‍ය වශයෙන් වැටහීමේදී.

ඉරියවු පැවැත්වීම සම්බන්ධයෙන් සඳහන්වෙනව සාමාන්‍ය උපදේශයක් වශයෙන් - යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති' [1] කියල එක්තරා පාඨයක්, සතිපට්ඨාන සූත්‍රයෙ. 'යම් යම් ආකාරයකින් යෝගාවචරයාගේ කය පිහිටා තිබේද? ඒ ඒ ආකාරයෙන්

මනා නුවණින් දැනගනී.' කියන එකයි. මෙන්න මෙතනිනුත් අපට පේනව හරියට අර යම්කිසි නාට්‍යයක් රඟ දක්වන නළුවකුගේ හෝ නිළියකගේ අංග චලනය - හස්ත මුද්‍රා ආදිය - දෙස බලාසිටිමින් ඒ කරන දේවල් තේරුම් ගන්න උත්සාහ ගන්නව වගේ, තමාගේ ශරීරය ඒ ඒ ඉරියව් පැවැත්වීමේදී පිහිටා තිබෙන ආකාරය මෙනෙහිකරනකොට මේකත් හරියට ඒක පුද්ගල නාට්‍යයක් නරඹනවා වගේ. නාට්‍ය ආකාරයක් තියෙනව. ඊටත් වඩා සියුම්ව ඒ නාට්‍ය නැරඹීම සම්පජඤ්ඤ පබ්බයේ එන 'ඛුද්දක ඉරියාපථ' - එහෙම නැත්නම් කුඩා ඉරියව්' මෙනෙහි කිරීමේදී සිදුවෙනව. ඉතාමත්ම සියුම් අන්දමින්. ලෝක සත්ත්වයා සාමාන්‍යයෙන් සක්කාය දිට්ඨිය අනුව, සත්කාය දෘෂ්ටිය, දෘෂ්ටි කෝණය කරගෙන සතර මහා භූතයින් උපාදාන හැටියට අරගෙන නාමධර්මයන්ට නිසි රූපාරම්මණ මවාගන්න සිරිතක් තියෙනව. අප අවට තියෙන දේවල් ඒ ඒ රූපධර්මයන් හැටියට හඳුනාගන්නෙ අර සතරමහාභූතයින් උපාදාන හැටියට අරගැනීමෙන්. රූපය හැඳින්වීමේදී යොදන පාඨයෙන් ඒ වගක් හැඟෙන්නෙ - 'චත්තාරොච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං' - සතරමහාභූතයිනුත්, සතරමහා භූතයින් උපාදානකරගෙනයි රූපය. මෙතන උපාදාය කියන එකේ එක්තරා විශේෂ සාපේක්ෂක අර්ථයක් තියෙනව. එතකොට මෙන්න මේ විදියට මේ රූපධර්මයන් මවාගන්නෙ නාමධර්මයන් පිහිටකරගෙන. මෙන්න මෙයින් එක්තරා සාපේක්ෂතාවයකුයි අපට හෙළි වෙන්නෙ. මේ සාපේක්ෂතාව තුළින් කෙනෙකු දකින්නෙ ඒ දෙකේම ශූන්‍යත්වයයි. මේ නාමයේත් රූපයේත් ඒ දෙකේම ශූන්‍යත්වයයි. මෙන්න මේ සාපේක්ෂතා මූලධර්මය බුදු දේශනාවෙ සමහර තැන්වල එක්තරා අනියම් ආකාරයකින් ප්‍රකට වෙනව. ඒ සූත්‍ර ඒ තරම් ප්‍රකට නැති නිසා. ඒව ගැන සැලකිල්ලක් යොමුවන්නෙ නැහැ. හොඳ වටින සූත්‍රයක් තියෙනව, සංයුත්තනිකායෙ සළායතන වග්ගයෙ හත්ථපාදූපම සූත්‍රය කියල. ඒ සූත්‍රයෙ උපමා වශයෙන් එක්තරා බුද්ධදේශිත පාඨයක් සඳහන් වෙනව. එක්තරා උපමාවක් හැටියට පාවිච්චි කරල තියෙනව. නමුත් එතන සාපේක්ෂතා මූලධර්මයයි එයින් ප්‍රකට වන්නෙ. මෙන්න මේ විදියටයි ඒ සූත්‍රයෙ කියැවෙන්නෙ.

'හත්ථෙසු භික්ඛවෙ සති - ආදාන නික්ඛෙපනං පඤ්ඤායති
පාදෙසු සති - අභික්කම පටික්කමො පඤ්ඤායති
පබ්බෙසු සති - සම්මිඤ්ජන පසාරණං පඤ්ඤායති
කුච්ඡිස්මිං සති - ජිඝච්ඡා පිපාසා පඤ්ඤායති'

'හත්ථෙසු භික්ඛවෙ සති' - මහණෙනි අත් ඇති කල්හි, ආදාන නික්ඛෙපනං පඤ්ඤායති' - ගැනීමක් තැබීමක් දක්නා ලැබේ. 'පාදෙසු සති' - පා ඇති කල්හි 'අභික්කමපටික්කමො පඤ්ඤායති' - ඉදිරියට යාමක්, ඒමක් දක්නා ලැබේ. 'පබ්බෙසු සති සම්මිඤ්ජනපසාරණං පඤ්ඤායති' - ඇඟිලි පුරුක්

කියල දෙයක් තිබෙන කල්හි නැමීමක් දිග හැරීමක් කියල දෙයක් තියෙනව. 'කුච්ඡිස්මිං සති ජිඝච්ඡා පිපාසා පඤ්ඤායති' - කුසක් ඇති කල්හි කුසගින්න සහ පිපාසාවක් දක්නා ලැබෙයි. ඒකෙම අනිත් පැත්තම ඊළඟට කියනව.

'හත්ථේසු භික්ඛවෙ අසති - ආදාන නික්ඛෙපනං න පඤ්ඤායති.
පාදේසු අසති - අභික්කමපටික්කමො න පඤ්ඤායති.
පබ්බේසු අසති - සමිඤ්ජන පසාරණං න පඤ්ඤායති
කුච්ඡිස්මිං අසති - ජිඝච්ඡා පිපාසා න පඤ්ඤායති. [2]

ඒකෙ අර්ථ තේරුම් ගන්න පුළුවන් පහසුවෙන්ම. අත්නැති කල්හි අර කියාපු විදියට ගැනීමක්, තැබීමක් දකින්ට ලැබෙන්නෙ නැහැ. පා නැති කල්හි ඉදිරියට යාමක් ඒමක් කියල දෙයක් දකින්ට නැහැ. ඇඟිලි පුරුක් කියල නැතිකල්හි හැකිළීමක් දිග හැරීමක් දකින්ට ලැබෙන්නෙ නැහැ. කුසක් නැතිකල්හි කුසගින්නක් පිපාසයක් නැහැ. මෙතනදී කියවෙන්නෙ සාපේක්ෂතා මූලධර්මයයි. සතිපට්ඨාන භාවනාවෙන් යෝගකර්මයෙ යෙදෙන ඇතැම් කෙනෙක් සමහරවිට හිතන්න පුළුවනි රූපධර්මයන් නැහැ. නමුත් නාමධර්මයන් තියෙනව. වෙනවිදියකින් කියනවනම් අත් නැහැ. නමුත් ගැනීමක් තැබීමක් තිබෙනව. පා නැහැ. නමුත් යාමක් ඊමක් තියෙනව, කියල මේ විදියට ක්‍රියාමාත්‍ර පමණක් දෘෂ්ටිග්‍රාහයෙන් ගන්නත් ඉඩ තියෙනව. ඒව එහෙම අරගෙන කෑලි වලට කඩන්නත් ඉඩ තියෙනව. නමුත් මෙතන වැදගත් වෙන්නෙ මේ දෙකම සාපේක්ෂක බව අවබෝධ කරගැනීමයි. ඒ සාපේක්ෂකත්වය තුළින් දකින්නෙ ඒ දෙකේම ශූන්‍යත්වයයි. එහෙම නැතුව එකක් පමණක් දැඩිව ගත්තොත් එතන දෘෂ්ටියක්, එතන ගැඹුරට යන්නෙ නැහැ. නාමරූපයෙ ශූන්‍යත්වය වටහාගන්න බැරි වෙනව. හරියට අර අපි සඳහන් කළ අභිරූපන නාට්‍යයේ ජවනිකාවක් නරඹන ප්‍රේක්ෂකයකු විසින් ඒ වේදිකාවෙ නැති අය, නැතිදේ ඇතෙයි කියල හිතාගන්න ඕන ඒ රඟපෑම් තේරුම් ගැනීමට නම්. ඒව තියෙන හැටියට හිතාගෙනයි ඒ රඟපෑම් තේරුම් ගන්නෙ. අන්න ඒ විදියෙ දෙයක් මේ. නාමයත් රූපයත් එකිනෙකට සාපේක්ෂක වශයෙනුයි පවතින්නෙ. මෙන්න මේ සාපේක්ෂකතාව තුළින් කෙනෙක් දකින්නෙ අර ශූන්‍යතාවයි.

දැන් අපි මේ නාට්‍ය චිත්‍රපට උපමා ආදිය දැක්වූයේ ඇත්ත වශයෙන්ම සංස්කාරයන්ගේ අනිත්‍යතාව පිළිබඳව යම්කිසි හැඟීමක් දීමටයි. සංස්කාර කියන එක, මේ නාට්‍ය චිත්‍රපට ආදිය ගැන කල්පනා කරනකොට බොහොම ගැලපෙනම වචනයක්. එක්තරා ප්‍රයත්නයකින් කරන එක්තරා මවාපෑමක් හඟවනව. ඒවායේ අසත්‍ය බව ඉබේටම වැටහෙනව. එතනම තියෙනව අසත්‍යබව. මේ භවනාටකයේ අනිත්‍ය සංඥව මගින් කරන්නෙ මේ භවනාටකයේ ඇති දේවල් පිළිබඳව නිත්‍ය සංඥව පහකරන එකයි. නිත්‍ය සංඥව ඉවත්කිරීමෙන් කෙරෙන්නෙ කුමක්ද? ඒ නිත්‍ය සංඥව

ඉවත්වෙනකොට නිමිති ගැනීමක් නැහැ. නිත්‍ය සංඥාව නිසා තමයි ඒ ලැබෙන සංඥා මාත්‍ර අනුව කෙනෙක් නිමිති ගන්නෙ. නිමිති අනුව්‍යඤ්ජන ගැනීමක් නැහැ. නිමිති අනුව්‍යඤ්ජන ගැනීමක් නැතිවෙනකොට ඒවා පිළිබඳව තණ්හාවශයෙන් ප්‍රණිධියක්, ප්‍රාර්ථනාවක්, එහෙම නැත්නම් හිත යම්කිසි දේකට යොමුකිරීමක්, නැතිවෙනව. පණිධියක් නැති වෙනව. ඊළඟට පණිධියක් නැතිවෙනකොට ඒවාට ඉලක්කය වන සාරයක්, හරයක් දකින්න නැතිවෙනව. ඔය විදියට අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤත කියන විමොක්ඛ තුන ඔස්සේ තමයි මේ භවනාටකයෙ නිරෝධය වන්නෙ. මේ භවනාටකයෙ නිරෝධය සැළසෙන්නෙ ඒකෙන්. අන්න ඒකට ප්‍රධාන වශයෙන් උපකාරවන එක තමයි අනිත්‍යසංඥාව. අනිමිත්ත විමොක්ඛයට උපකාරවන - ඒ අනිත්‍ය සංඥාවට උපකාරවන - හැටියට මේ කරපු විවරණයට අනුව අපට පුළුවන් මුළුමහත් ලෝකය පිළිබඳව බුදු පියාණන්වහන්සේ දක්වන සමහර සූත්‍ර ඇත්තවශයෙන්ම මේ භවනාටක අදහසින් අරගෙන මේවායේ අනිත්‍ය ස්වභාවය දකින්න. අපි කලිනුත් සඳහන් කළා සත්තසූරියුග්ගමන සූත්‍රය ගැන. ඉරවල් හතක් පායනකොට මේ ලෝකධාතුව, මේ තරම් සත්රුවන්වලින් පිරුන, මේ තරම් වටිනා දෙයින් පිරුන හැටියට සළකන මුළුමහත් ලෝකධාතුව, එකම ගිනිජාලාවක්වෙලා දැවිල ගිහිල්ල - අන්තිමට ඒ සූත්‍රයේ සඳහන් වෙනව- ගිතෙල් දැවුන තැනක, එහෙම නැත්නම් තෙල් දැවුන තැනක, අළුවත් දැළිවත් ඉතුරුවන්නෙ නැතිව වගේ මේ මුළුමහත් ලෝකධාතුව ගිනිබත් වෙලා කිසිම දෙයක් ඉතිරිවන්නේ නැහැ කියල. එතකොට අනිත්‍ය සංඥාව ඔස්සේ ශූන්‍යතාවට යොමුවෙනව ඉබේටම. මේ ලෝක වේදිකාවේ සිටින නළුනිළියන් පමණක් නොවෙයි තිබෙන සියළුම සැරසිලි ලෝක වේදිකාවත් සමඟම යම්කිසි අවස්ථාවක මෙන්න මේ විදියට විනාශවෙල යනවය කිසිම දෙයක් ඉතිරි වෙන්නෙ නැත කියල ඒ සංඥාව දැඩිව වැටුනොත් මනසකට - අර කාමාසව භවාසව අවිජ්ජාසව කියන ආශ්‍රව ධර්ම වියලවන තරමට දැඩිව වැටුනොත් සිතකට - අන්න එතනම විමුක්තිය තියෙනව. ඒක නිසා වෙන්න පුළුවනි සත්තසූරියුග්ගමන ආදී ඒ සූත්‍ර අහල ඒක්ෂණයෙන් ඇතැම් කෙනෙක් රහත් උනේ. අනිත්‍ය සංඥාව ඒ අතින් බැලුවාම ඉතාමත් ප්‍රබල දෙයක් බව දක්වනව.

**'අනිච්චසඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති. සබ්බං රූපරාගං පරියාදියති සබ්බං භවරාගං පරියාදියති සබ්බං අවිජ්ජං පරියාදියති. සබ්බං අස්මිමානං පරියාදියති සමූහනති.**[3]

මේ අනිත්‍ය සංඥාවෙ තියෙන ශක්තිය, ප්‍රබලත්වය, බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකරනව "මහණෙනි අනිත්‍ය සංඥාව වඩන ලද කල්හි, බහුල වශයෙන් පුරුදුකරනලද කල්හි, සියළුම කාමරාගය අවසන්වෙනව. කෙළවර කරනව, රූපරාගය කෙළවර කරනව, භවරාගය කෙළවර කරනව, අවිද්‍යාව

කෙළවර කරනව. අස්මිමානය කෙළවර කරනව. නසනව, විනාශ කරනව" අන්න ඒ විදියට අනිත්‍යතාව ඔස්සෙ ශූන්‍යතාවට නැඹුරු වීමයි ඊළඟට තියෙන්නෙ.

**'අනිච්ච සඤ්ඤිනො භික්ඛවෙ භික්ඛුනො අනත්ත සඤ්ඤා සණ්ඨාති, අනත්ත සඤ්ඤී අස්මිමාන සමුග්ඝාතං පාපුණාති දිට්ඨෙව ධම්මෙ නිබ්බානං'** [4]

කියල සමහර තැනක සඳහන් වෙනව. 'අනිත්‍ය සංඥව ඇති භික්ෂුවට අනත්ත සංඥව පිහිටනවයි. අනත්ත සංඥව ඇත්තේ දිට්ඨදැම්යෙහිම 'නිවන' වන අස්මිමාන සමුග්ඝාතයට - අස්මිමානය උගුළුවා හැරීමට - විනාශ කිරීමට, පැමිණෙනව. කියන ඒ පාඨයෙනුත් හැඟෙනව මේ අනිත්‍ය සංඥවෙ තියෙන වටිනාකම.

එතකොට මේ ඔස්සෙ කල්පනාකරල බලනකොට තමයි අපිට තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ අර ධම්මපද ගාථාවල සමහර විට පරස්පර විරෝධී හැටියට පෙනෙන සමහර ගාථා-

**පුත්තාමත්ථි ධනමම්ත්ථි**<br>
**ඉති බාලො විහඤ්ඤති**<br>
**අත්තාපි අත්තනො නත්ථි**<br>
**කුතො පුත්තා කුතො ධනං** '- [5]

කියල එහෙම සඳහන් වෙන්නෙ - 'මට පුත්තු ඇත. ධනය ඇත කියා බාලයා වෙහෙසෙයි. තමාට තමාවත් නැත. කොයින්ද පුත්තු, කොයින්ද ධනය' - කියල එහෙම ප්‍රකාශවෙන්නෙ. 'තමාට තමාවත් නැත' කියන අදහස - දැඩි අනාත්ම සංඥව අර ශූන්‍යතාවට නැඹුරුවෙන පැත්තයි මෙතන තියෙන්නෙ. 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා' - ආත්ම වශයෙන් ගතයුතු දෙයක්වත් ආත්මයට අයිති දෙයක්වත් මෙතන නැත කියන අදහසයි. සමහර කෙනෙක් මේ 'සුඤ්ඤතා' කියන වචනයට බයයි. යම් යම් හේතූන් නිසා . ඒ නිසාම තමයි අපි පළමුවැනි දේශනයේදීම සඳහන් කළේ 'ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර' ගැන කල්යාමේදී සංඝයාවහන්සේලාගෙම සැළකිල්ල අඩුවෙන බව. ඒවාට කන් යොමුනොකරන බව, ඒවාගැන තේරුම්ගන්න උත්සාහ නොකරන බව, බුදුපියාණන් වහන්සේ කල්තබාම අනාගතභය හැටියට දක්වල තියෙනව. අන්න එතකොට මේ සුඤ්ඤතා කියන වචනයෙ ඇති වැදගත්කම අපට පෙනෙනව, සමහර සූත්‍රදේශනාවලින්. විශේෂයෙන්ම සුත්ත නිපාතයෙ පාරායණවග්ගයෙ - ඉතාමත්ම ගැඹුරු ධම්කොටස් තියෙන ග්‍රන්ථයක් තමයි සුත්තනිපාතය එයිනුත් පාරායණවග්ගය විශේෂයි, අට්ඨක පාරායණ වග්ග දෙක. මේ පාරායණවග්ගයෙ තියෙනව මොඝරාජ මාණව පුච්ඡා කියල සූත්‍රයක් මොඝරාජනමැති බ්‍රාහමණ මාණවකයෙක් බුදුපියාණන්

වහන්සේගෙන් අසනව මෙන්න මෙහෙම ප්‍රශ්නයක්.

'කථං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති' 'ලෝකය දෙස කවර ආකාරයකින් බලන්නෙකුව මාරයා නොදකීද? මාරයාගේ ඇසට හමුනොවෙයිද? කියන එකයි. බුදුපියාණන් වහන්සේ ඊට දෙන පිළිතුර-

'සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු - මොඝරාජ සදා සතො
අත්තානු දිට්ඨිං ඌහච්ච - එවං මච්චුතරෝ සියා
එවං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති [6]

"මෝඝරාජය, හැමකල්හිම සතිමත්ව ලෝකය ශූන්‍ය වශයෙන් බලව. ආත්මය පිළිබඳ සියුම් වූ ඒ දෘෂ්ටිය මුලිනුපුටා දමා මෙන්න මේ ආකාරයෙන් මාරයාගෙන් - මරණයෙන් එතර වූවෙක් වන්නේය. ලෝකය දෙස මේ විදියට ශූන්‍යවශයෙන් බලන තැනැත්තාව මාරයා නොදකී" මෙතනිනුත් අපට පේනව ශූන්‍යතාව පිළිබඳව අවසානයෙ මුළුමහත් ධර්මයම අර ලෝකධාතුව වගේම ශූන්‍යත්වයටයි නැඹුරු වන්නේ. මෙන්න මේ ශූන්‍යතාව නිසාම තමයි ඉතාමත්ම වටිනා පාඨයක් සඳහන් වෙන්නෙ චූලතණ්හා සංඛය සූත්‍රයෙ. මැදුම් සඟියෙ චූලතණ්හාසංඛය සූත්‍රයෙ සඳහන් වෙනව බුද්ධ දේශනාවක් හැටියටම. ශක්‍රයයි ඒක කියන්නෙ.ශක්‍රයාට දෙසූ එක්තරා විශේෂ දේශනාවක සඳහන් පාඨයක් හැටියට.

'සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසාය ' - [7] ඉතාම කෙටි පාඨයක් නමුත් ගැඹුරු අර්ථයක් තියෙනව. මේක සිංහලට නගනකොට 'සබ්බෙ' කියන්නෙ නම් 'හැම දෙයක්ම. නමුත් අපට මෙතන පරිවර්තනය කරන්න වෙන්නෙ 'කිසිම දෙයක් දෘෂ්ටිපරාමර්ශනයෙන් නොගත යුතුය' කියලයි. 'අභිනිවෙස' කියල කියනව - අපි සමහර අවස්ථාවල පරිවර්තනය කළා 'රිංගා ගැනීම' කියල. දෘෂ්ටි පිළිබඳව විශේෂයෙන්ම අභිනිවෙස කියන වචනය යොදනව. දෘෂ්ටිවලට රිංගා ගන්නව. අන්න එහෙම ස්වභාවයක් ලෝකයාගේ සිත් වල තිබෙනව. යම්කිසි දෙයක් මැව්වට පස්සෙ ඒක ඇතුලට රිංගගන්නව. මේ අභිනිවෙස කියන වචනයෙ ඒ රිංගාගැනීමේ අදහස තියෙනව - 'සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසාය කියන්නෙ ආරක්ෂාව පතාගෙන, ආත්මවශයෙන් අරගෙන, කිසිම දේකට ඇතුල්වෙන්න සුදුසු නැහැ, කිසිම දෙයක් දෘෂ්ටිවශයෙන් පරාමර්ශනය කරන්න, අල්ලගන්න සුදුසු නැහැ කියන එකයි තේරුම. 'සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසාය'

මෙන්න මේ වටිනා ධර්මය ගැන කල්පනා කරල බලනකොට, - මේ 'සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසාය' කියන ධර්මය - මෙතනින් අපට පෙනෙන්නෙ හැමදෙයකම ඇති ශූන්‍යත්වයයි. මේ පිළිබඳව කල්පනාකරල බලනකොට අපට එක්තරා වටිනා සූත්‍රයක් සොයාගන්න පුළුවන් වෙනව අඞ්ගුත්තරනිකායෙ අට්ඨක නිපාතයෙ. 'කිංමූලක' සූත්‍රය [8] කියල වටිනා

සූත්‍රයක් තියෙනව. ඒ සූත්‍රයෙහි බුදුපියාණන්වහන්සේ සංඝයා වහන්සේලාගෙන් අහනව - 'දැන් මහණෙනි, නුඹලගෙන් අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින් ඇසුවොත් මෙන්න මෙහෙම ප්‍රශ්නමාලාවක්, නුඹලා කොහොමද පිළිතුරුදෙන්නෙ. මොනවද ප්‍රශ්න?

**'කිං මූලකා ආවුසො සබ්බෙ ධම්මා. කිං සම්භවා සබ්බෙධම්මා. කිං සමුදයා සබ්බෙධම්මා. කිං සමොසරණා සබ්බෙධම්මා. කිං පමුඛා සබ්බෙධම්මා. කිං ආධිපතෙය්‍යා සබ්බෙ ධම්මා කිමුත්තරා සබ්බෙධම්මා. කිංසාරා සබ්බෙධම්මා'**

කියල මේ ප්‍රශ්න අටක් අහනව. ඒ ප්‍රශ්න අටේ අර්ථය අපි ඉස්සෙල්ල ගනිමු. අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින් නුඹලගෙන් ඇසුවොත් මෙන්න මෙහෙම ප්‍රශ්න, මොනවද? 'සබ්බෙධම්මා' - අර කලින් කියාපු 'සබ්බෙ ධම්මා' මයි මෙතන හැඟෙන්නෙ. සියළු ධර්මයන් එහෙම නැත්නම් හැමදෙයක්ම 'හැම දේකම මුල කුමක්ද? -'කිං මූලකා සබ්බෙ ධම්මා' 'කිං සම්භවා සබ්බෙ ධම්මා' - හැම දෙයකම හටගැන්ම, ප්‍රභවය කුමක්ද' 'කිංසමුදයා සබ්බෙ ධම්මා' - හැම දේකම පැනනැගීම - සමුදය කියන එක අර පටිච්චසමුප්පාදය හැඟවෙන වචනයක්. හැම දේකම පැනනැඟීම, උදව කුමක්ද? 'කිං සමොසරණා සබ්බෙ ධම්මා' හැමදෙයක්ම ගිහිල්ල කොතැනටද එකතු වෙන්නෙ? හැමදෙයකම එක්රැස්වීම කොතනද? කිං පමුඛා සබ්බෙ ධම්මා? හැමදෙයක්ම කුමක් ප්‍රමුඛකොට ඇත්තේද? කුමක් පෙරටුකරගෙන ඇත්තේද? කිං ආධිපතෙය්‍යා සබ්බෙ ධම්මා? 'හැමදෙයක්ම කුමක් අධිපති කොටගෙන ඇත්තේද? 'කිං උත්තරා සබ්බෙ ධම්මා' - උත්තර කියන එකේ විශේෂ අර්ථරාශියක් තියෙනව. ලොකොත්තර කියන එකේ එතෙරවීම කියන අර්ථය තියෙනව. මෙතන උත්තර කියන්නෙ ඉහලම තැන. ශ්‍රේෂ්ඨම දෙය. මුදුන කියන අදහසත් තියෙනව. එතරවීම කියන අදහසටත් මේක ලඟයි. බොහොම ගැඹුරු අර්ථ රාශියක් තියෙනව උත්තර කියන වචනයේ. 'කිං උත්තරා සබ්බෙ ධම්මා? හැම දෙයකම උත්තර අවස්ථාව එහෙම නැත්නම් ඉහලම තැන කොතනද? මුදුන කොතනද? කිං සාරා සබ්බෙ ධම්මා' හැම දෙයකම සාරය කුමක්ද? මේ ප්‍රශ්න අට ඇහුවාම මේ සංඝයාවහන්සේලා කියනව 'අපට නම් මේකට උත්තර හොයාගන්න බැහැ' කියල. ඒ විදියෙ අවස්ථාවල සංඝයාවහන්සේල ප්‍රකාශ කරන විශේෂ වාක්‍යයක් තියෙනව 'භගවම්මූලකා නො භන්තෙ ධම්මා භගවංනෙත්තිකා භගවංපටිසරණා' කියල ඔය විදියට භාග්‍යවතුන්වහන්සේගෙන්මයි අපට මේ ධර්මය ලැබුනෙ. භාග්‍යවතුන්වහන්සේමයි අපේ ශාස්තෲන්වහන්සේ. අපේ පිළිසරණ භාග්‍යවතුන්වහන්සේමයි. 'භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්ති' කියල භාග්‍යවතුන් වහන්සේටම මේ කාරණය වැටහේවා. අපට කියල දෙන්න. අපටනම් තේරෙන්නෙ නැහැ කියල ප්‍රකාශ කළා, ඒ අවස්ථාවෙ බුදුපියාණන් වහන්සේට මේකට පිළිතුරු දෙන්න සිද්ධ උනා. ඇහුවොත්

මෙන්න මේ විදියට කියපල්ලා කියන එකයි ඊළඟට කියන්නෙ. අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින් නුඹලාගෙන් ප්‍රශ්න අට ඇහුවොත් මෙන්න මේ විදියට පිළිතුරු දෙන්න කියල බුදුපියාණන්වහන්සේ පිළිතුරු අටක් දෙනව.

'ඡන්දමූලකා ආවුසො සබ්බෙ ධම්මා' - ඇවැත්නි හැමදෙයක්ම ඡන්දය මුල්කරගෙන ඇත්තේය. 'මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා' - හැමදෙයක්ම මනසිකාරය, මෙනෙහි කිරීම, සම්භවස්ථානය එහෙමනැත්නම් ප්‍රභවය ප්‍රභවස්ථානය කොට ඇත. හටගැන්ම කොට ඇත. ඊ ළඟට ඵස්ස සමුදයා සබ්බෙ ධම්මා' - හැම දෙයක්ම ස්පර්ශය සමුදය ස්ථානය කොටගෙන ඇත. පැනනගින ස්ථානය හැටියට අරගෙන ඇත. 'වෙදනා සමොසරණා සබ්බෙ ධම්මා' - හැම දෙයක්ම ගිහිල්ල එකතුවෙන්නෙ, එක්රැස්වීම, හරියට පරාල ටික ගිහිල්ල මුදුන්වහලට එකතුවෙන්න වගේ, ඒව ගිහිල්ල එකතුවෙන්නෙ වේදනාවට. 'වෙදනා සමොසරණා සබ්බෙ ධම්මා' - 'සමාධි පමුඛා සබ්බෙ ධම්මා' - 'කිං පමුඛා' කියන ප්‍රශ්නයට පිළිතුර මොකක්ද? කුමක්ද ප්‍රමුඛ කරගෙන තියෙන්නෙ? හැම දෙයක්ම සමාධිය ප්‍රමුඛකරගෙනයි තියෙන්නෙ. කිං ආධිපතෙය්‍යා සබ්බෙ ධම්මා' කියන එකට පිළිතුර, 'සතාධිපතෙය්‍යා සබ්බෙ ධම්මා' හැම ධර්මයක්ම, හැම දෙයක්ම සතිය අධිපති කොටගෙන තිබෙනව. 'පඤ්ඤුත්තරා සබ්බෙ ධම්මා' හැම දෙයකම උත්තර තැන, එහෙම නැත්නම් එතෙරවීමේ ස්ථානය, මුදුන්තැන, ඉහලම තැන ප්‍රඥාවයි. 'විමුත්ති සාරා සබ්බෙ ධම්මා' හැමදෙයකම සාරය, හරය විමුක්තියයි.

බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කළ මේ සූත්‍රයේ මූලික අර්ථය විග්‍රහ කිරීමට කලින් අපි ටිකක් කල්පනා කළ යුතුව තිබෙනව ඇයි බුදුපියාණන් වහන්සේ ඇසුවෙවත් නැති ප්‍රශ්නයකට සංඝයාවහන්සේලාගේ මනස සූදනම් කළේ. මේ විදියට නුඹලගෙන් ඇහුවොත් මේ විදියට කියපල්ලා කියල. එහෙම ප්‍රශ්නයක් පැන නැගුනෙවත් නැහැ. මේකට හේතුව අපට හිතාගන්න පුළුවන්. බුද්ධකාලයේ හිටිය නොයෙකුත් අන්‍යතීර්ථකයින් අතර, බ්‍රාහමණාදීන් අතර, නොයෙකුත් මතභේද තිබුන යමක් දෙයක් වන්නේ කොහොමද? දෙයක හරය කුමක්ද? ඔයවිදියෙ ප්‍රශ්න ඒගොල්ලොම හදගෙන එ ගොල්ලොම ඒකට හොඳට උත්තර හදගෙනයි හිටියෙ. බුදුරජාණන්වහන්සේගේ අනාත්ම ධර්මයට තමයි මේකට උත්තර දෙන්න අමාරු. ඒක නිසයි අර සංඝයාවහන්සේලට අන්තිමට කියන්න සිද්ද උනේ අපට නම් තේරෙන්නෙ නැහැ. භාග්‍යවතුන්වහන්සේම කියන්න කියල. අන්‍යතීර්ථකයින් යොදගෙන තිබුන පිළිතුරු මොනවද? ආත්මවාදය, ඊශ්වර නිර්මාණවාදය, අනුව මේ හැම දෙයක්ම එක්කො බ්‍රහ්මයාගෙන් පටන්ගත්ත. එහෙම නැත්නම් මේවයෙ සාරය, හරය තමයි ආත්මය - ආත්ම සාරය. ඔය විදියට ඒගොල්ලන්ට තිබුන හොඳ පිළිතුරු රාශියක්, මේ හැම දෙයක්ම

පිළිබඳව. දර්ශනිකයන් අතර ලොකුම ප්‍රශ්නයක් තමයි, යමක් දෙයක් වන්නෙ කොහොමද? යමක් දෙයක් නොවන්නෙ කොහොමද? කියන එක. මේ කාලයෙත් මේ ප්‍රශ්නය හැමදෙනෙක්ම අහන ප්‍රශ්නයක්. ඒ තරම් ගැඹුරු කාරණයක්. එතකොට මේ සූත්‍රයේ අවාසනාවකට වගේ, අටුවා ආදී විවරණවලදී මේ ගැඹුරු අංශය ගැන ඒතරම් තැකීමක් නැතිව මෙතන අරගෙන තියෙනව කුසල්ධම්වලට පමණක් සීමාවූ අර්ථයක්. මොකද, 'ඡන්ද' කියන වචනය තියෙනව මෙතන, බුදුපියාණන් වහන්සේ දුන්න පිළිතුරේ. 'සති' කියල වචනයක් තියෙනව. 'සමාධි' කියල තියෙනව. 'පඤ්ඤා' කියල තියෙනව. ඉතින් හිතල තියෙනව මේ අහන්නෙ කුසල් ධම් ගැන කියල. මේ ධම්යේ තියෙන කුසල් ධම් වල මුල මොකක්ද? කුසල් ධම් හටගන්නෙ කොහෙද? ඕක ගැනයි කියල මේ ප්‍රශ්න ටික. ඊට වඩා ගැඹුරු දෙයක් මෙතන තියෙන්නෙ. කුසලාකුසල දෙකටම බලපාන එක්තරා මූලධම්තාවක් මෙතන ප්‍රකාශවෙන්නෙ. ධම්මපදයෙ මුල්ගාථා දෙක දිහා බැලුවාම ඒ ගාථා දෙකේම කුසල් අකුසල් දෙකටම උපකාර වන එක්තරා මූලික ධම් නියාමතාවක් තමයි ප්‍රකාශ වෙන්නෙ. 'මනො පුබ්බඞ්ගමා ධම්මා - මනොසෙට්ඨා මනොමයා - කියන පදදෙකෙන් . ඒ ගාථා දෙකේම එතන සඳහන් වෙන්නෙ, යම්කිසි පොදු ධම්තාවක්. ඒ පද දෙක මේ කාලයේ කොයි ආකාරයට තේරුවත්, ඒකෙ මූලික අදහස ගත්තොත් එතන ගන්න තියෙන්නෙ හැමදෙයක්ම මනස පූර්වංගම කොට ඇත්තේය. මනස මුල්කරගෙන, මනස ශ්‍රේෂ්ඨ කොට ඇත්තේය. මනසින්ම සකස් වූ දේවල්. මේක කුසලුත් වෙන්න පුළුවන්. මේක අකුසලුත් වෙන්න පුළුවන්. අන්න ඒ විදියට මේ දෙපැත්තටම අරගෙනයි සූත්‍රය තෝරාගත යුත්තේ. එතන විශේෂයෙන්ම තවත් කිවයුතු දෙයක් තියෙනව. 'ඡන්ද' ආදී වචන - පසුකාලයක මේවා ඒකාන්ත කුසල් ධම් හැටියට තෝරන ක්‍රමයකුත් ඇතිවුනා. දැන් 'සති' කියන වචනය දුටුව හැටියෙම 'සම්මාසති' කියල සමහර කෙනෙක් හිතාගන්නව. එහෙම නැත්නම් 'ඡන්ද' කියල තිබුනොත්. ඒක 'කුසලච්ඡන්දය' 'කත්තුකම්‍යතාඡන්දය' ඔය විදියටයි පරිවර්තනය කරන්නෙ. නමුත් මේ බුද්ධ දේශනාවෙ විශේෂත්වයක් තියෙනව. බුදුපියාණන්වහන්සේගේ දේශනා, ඒ ඒ ශ්‍රෝතෘන්ගේ අවබෝධ ශක්තිය අනුව ක්‍රමක්‍රමයෙන් 'ඔපනයික' වශයෙන් ශ්‍රෝතෘන්ගේ අවබෝධ ශක්තිය දියුණුකිරීම සඳහායි. සමහරවිට දේශනාව ආරම්භයේදී පදයක යොදන අර්ථය නොවෙයි දේශනාව අවසාන වෙනකාට තිබෙන්නෙ. අන්න ඒ විදියෙ ක්‍රමයක් තියෙනව.

'ඡන්ද' කියන වචනයෙ හොඳ අර්ථයකුත් තියෙනව, නරක අර්ථයකුත් තියෙනව. 'ඡන්දරාග' කියන තැන, 'ඡන්දජං අඝං' කියල මේ මුළුමහත් ලෝකයම ඡන්දයෙන් හටගත්තු දුක්ගොඩක් කියල කියනකොට අන්න එතන

ඡන්ද කියල කියන්නෙ තණ්හාව. ඒකාන්ත වශයෙන්ම තණ්හාව වශයෙන් ලෝකයා ගන්න ඒ කෙලෙශ ධර්මය පිළිබඳවයි එතන අහවන්නෙ. - ඡන්ද - ඡන්දරාගවශයෙන්. ඊළඟට 'ඡන්ද ඉද්ධිපාද' කියන තැන, ඒක කුසල ධර්මයක් හැටියට සළකනව. නමුත් ඒක කුසලධර්මයක් උනු පමණින් අර ඡන්ද පවුලට අයිති නැති දෙයක් හැටියට සලකන්න නරකයි. ඒ බව අපට හොඳට හෙළිවන වටිනා සූත්‍රයක් තියෙනව - අතුරු සූත්‍රත් සමහරවිට විස්තර කරන්න සිද්ධ වෙනව පදයක අර්ථය තේරුම් කිරීමේදී - සංයුත් සඟියෙ සූත්‍රයක් තියෙනව ඉද්ධිපාද සංයුත්තයෙ. උණ්ණාභ නමැති බ්‍රාහ්මණයෙක් ආනන්ද හාමුදුරුවො දකින්න ඇවිල්ල මෙන්න මෙහෙම ප්‍රශ්නයක් අහනව. මේ 'ඡන්ද' කියන වචනය පිළිබඳ කාරණයක් මෙතන. බ්‍රාහ්මණය අහන ප්‍රශ්නය. 'කිමත්ථියං නුඛො හො ආනන්ද සමණෙ ගොතමෙ බ්‍රහමචරියං වුසසති' [9] භවත් ආනන්දය, ශ්‍රමණ ගෞතමයන් වෙත බඹසර වාසය කරන්නෙ කුමක් සඳහාද? කුමක් පිණිසද? එකපාරටම ආනන්ද සවාමීන්වහන්සේ පිළිතුරු දෙනව. 'ඡන්ද පහානත්ථං ඛො බ්‍රාහ්මණ භගවති බ්‍රහමචරියං වුසසති' - 'බ්‍රාහ්මණය භාග්‍යවතුන්වහන්සේ වෙත බඹසර වසන්නෙ ඡන්දය ප්‍රහාණය කිරීම සඳහායි'. ඊළඟට අහනව මේ බ්‍රාහ්මණය' 'අත්ථි පන හො ආනන්ද මග්ගො අත්ථි පටිපද එතසස ඡන්දසස පහානාය'. මේකට, ඡන්ද ප්‍රහානය සඳහා, යම්කිසි ප්‍රතිපදවක්, යම්කිසි මාර්ගයක් තියෙනවද කියල. 'එසේය' කියල ආනන්ද සවාමීන් වහන්සේ පිළිතුරු දෙනව. මාර්ගය හැටියට ඉදිරිපත් කරන්නෙ කුමක්ද? අන්න එතනයි වැදගත් කාරණය තිබෙන්නෙ, ඉදිරිපත් කරන්නෙ අර ඉද්ධිපාද හතර.

'ඡන්ද සමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති
විරිය සමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති
චිත්ත සමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති.
වීමංසා සමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති-

ඡන්ද විරිය චිත්ත වීමංසා කියන මේ ඉද්ධිපාද හතරයි ඡන්ද නැතිකිරීම සඳහා ගතයුතු ප්‍රතිපදව, කියල ආනන්ද සවාමීන්වහන්සේ පිළිතුරුදෙනව. ඒ අවසථාවෙ බ්‍රාහ්මණයට මේක ගැටලුවක්. 'එහෙමනම් මේක නැතිවෙන්නෙ නැහැ නේ. තිබෙනවනේ. ඡන්දය ඉතිරිවෙනව නේ.'

'ඡන්දෙනෙව ඡන්දං පජහිසසතීති නෙතං ඨානං විජ්ජති'

ඡන්දයෙන්ම ඡන්දය නැතිකරනව කියන එක කරන්න බැරි දෙයක් කියල බ්‍රාහ්මණය ප්‍රකාශකරනව. ඒ අවසථාවෙ ආනන්දසවාමීන් වහන්සේ උපමාවක් හැටියට දක්වන්නේ බ්‍රාහ්මණය නුඹ දැන් මේ ආරාමයට එනකොට යම් ඡන්දයක් තිබුනා ආරාමයට ඒම සඳහා. මෙතෙන්ට ආවට පස්සේ ඒ ඡන්දය- 'පටිපසසද්ධො'-ඒ ඡන්දය සංසිඳුන.

අන්න ඒ වගේ මේ ඡන්දය නැති කිරීම කියල කියන - මෙතන ඡන්දය කියන්නෙ තණ්හාව - 'තණ්හාව නැති කිරීම' කියන එකට ඇති තණ්හාව සඳහායි මෙතන මුලින් යොදල තියෙන්නෙ, ඡන්ද කියන වචනය. ඡන්දය නැති කිරීම සඳහාමයි, මේ ඡන්ද ඉද්ධිපාදය භාවනා කරන්නේ. එතකොට වචන පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. මෙතන, ඡන්ද ඉද්ධිපාදයත් අර ඡන්දපවුලටම අයිති එකක්. ඡන්ද ප්‍රහාණය සඳහාත් ඡන්දයක් ඕන වෙනව. මේක මධ්‍යම ප්‍රතිපදවෙ විශේෂ මූලධර්මයක්. මේ ඡන්දය කියන වචනයට සමහර කෙනෙක් බොහොම කැමතියි. තණ්හාව කියන වචනයට අකමැතියි. ඒක නිසා සමහරවිට නිවන් දැකීමට තියෙන තණ්හාව කියල කිව්වොත් සමහර කෙනෙක් ඒක ධර්මයට විරුඩ හැටියටත් හිතන්න ඉඩ තියෙනව. ආනන්ද ස්වාමීන්වහන්සේගේම තවත් දේශනාවක-එක්තරා ගිලන් භික්ෂුණියකට කළ දේශනාවක-තිබෙනව 'තණ්හං නිස්සාය තණ්හා පහාතබ්බා' -[10] කියල. ඒත් මධ්‍යම ප්‍රතිපදව පිළිබඳ විශේෂ කාරණයක් එතනින් ඇහෙවෙන්නෙ. තණ්හාව උපකාර කරගෙන තණ්හාව නැතිකරන්න කියල. හැබැයි එතන තණ්හාව කියන්නෙ ඕළාරික තණ්හාව නොවෙයි. යම්කිසි කෙනෙක්, 'අහවලා රහත් උනා' කියල අහන්න ලැබුනාම, එයා රහත් උනා නම් මාත් රහත් වෙන්න ඕන කියල එක්තරා විදියක තණ්හාවක් එතන තියෙන්නෙ. ඉතාම සියුම් තණ්හාවක්. නමුත් ඒ තණ්හාව උපකාර වෙනව අර තණ්හාව ක්ෂය කිරීම සඳහා. ඒක නිසා මේ වචන ඔස්සේ ගිහිල්ල ඒවට බය වෙන්න දෙයක් නැහැ. ඇත්ත වශයෙන් නිවන පිළිබඳව 'රති' කියන වචනය පවා සමහරවිට යොදනව. 'තණ්හක්ඛයරතො හොති' කියනකොට මහපුදුම වචනයක්. 'තණ්හක්ඛයරතො හොති සම්මා සම්බුද්ධසාවකො[11] - සම්මා සම්බුද්ධ ශ්‍රාවකයා තණ්හාක්ෂය කිරීමට ඇලිල. 'රති' කියන එක සමහරවිට නරක වචනයක් හැටියට සළකනව. නමුත් ඔන්න ඔය විදියට සූත්‍රදේශනාවල සඳහන්වෙනව. අර යමක් උපකාර කරගෙන තවත් එකක් ඉවත්කිරීමේ මධ්‍යමප්‍රතිපදත්මක මූලධර්මය අනුව 'ඡන්ද' කියන වචනය 'තණ්හා' කියන වචනය, සමහරවිට 'නෙක්ඛම්මසිත දෙමනස්ස' ඔය ආදී නොයෙකුත් පද යොදල තියෙනව නිවන් දැකීමට තිබෙන ආශාව පිළිබඳව. ඒක නිසා මෙතන මේ 'ඡන්දමූලකා සබ්බෙ ධම්මා' කියන එක අවශ්‍යයෙන්ම ගතයුතු නැහැ මේක කුසල් ධර්ම පිළිබඳ කාරණයක් කියල. සති, සමාධි පිළිබඳවත් කෙටියෙන් කියතොත් කියන්න තියෙන්නෙ මිච්ඡාසති මිච්ඡාසමාධි ආදී පද සූත්‍රදේශනාවල ඇතැම් විට යෙදිල තියෙනව.

එතකොට අපි දැන් මේ මෙතන තියෙන ධර්මකොට්ඨාශවල එකිනෙකට ඇති සම්බන්ධතාවත් ඒ පිළිබඳ යම්කිසි ගැඹුරු අර්ථයකුත් ඇද්ද කියන එකත් විමසල බලමු. 'ඡන්දමූලකා ආවුසො සබ්බෙ ධම්මා., අපි උපමාවකුත් මුල්කරගෙනම මේක තෝරන්න බලමු. දැන් ඔන්න යම්කිසි කෙනෙක්

කුඩයක් අරගෙන කිට්ටු වෙනව අහක දන්න තියෙන කසල ගොඩක් මේ කුඩයට එකතුකරල විසිකරන්න. එතකොට මේ කසලගොඩ පිළිබඳව මේ පුද්ගලයා තුළ තිබෙන්නෙ ඒකත්ව සංඥාවක්. ඒකත්ව කියල කියන්නෙ 'මේක කසල ගොඩක්, එකක්, හැටියට අරගෙන තියෙන්නෙ. පහත්වෙලා මේ කුඩයට කසලගොඩ පුරවනකොට, ඔන්න එකපාරටම දකිනව මැණිකක්. 'කසල ගොඩේ තිබුනත් මැණික මැණිකමයි' කියල ඔන්න ඊළඟට මැණිකටයි ඡන්දය දෙන්නෙ. මැණික පිළිබඳව ඊළඟට ඡන්දය ඇතිවෙනව. අන්න 'ඡන්දමූලකා ආවුසො සබ්බෙ ධම්මා'. අර කසලගොඩක් හැටියට තිබුන එකෙන්, අන්න මැණිකක් උපන්න. 'ඡන්දමූලකා' ඡන්දය තමයි මුල් උනේ ඒකට.

ඊළඟට, 'මනසිකාර සම්භවා' මෙනෙහිකිරීම නිසයි ඒකේ ප්‍රභවය හටගැනීම සිදුඋනේ. සමහරවිට හිතන්න පුළුවන් මැණික උපන්නෙ අර මැණික් පතලෙ හරි, තව කෙතැනක හරි කියල. නමුත් බුදුපියාණන්වහන්සේගේ 'මනො පුබ්බංගමා ධම්මා' කියන ධර්මතාවට අනුව උපදින තැනයි ඊ ළඟට කියන්නෙ. මුල් උනේ ඡන්දයයි. ඊළඟට සම්භවය හටගන්නා ස්ථානය මනසිකාරයයි. මෙනෙහි කිරීමයි. 'ඵස්ස සමුදයා සබ්බෙ ධම්මා' - ඇසට ස්පර්ශ උනා මැණික විශේෂ දෙයක් හැටියට, අර කසලගොඩේ තියෙන අනිත් දේවල් අතරින්. මේක පිළිබඳව ස්පර්ශයක් ඇතිඋනා. ඇහේ ගැටුන මේක. අන්න ඵස්ස සමුදයා'. 'වෙදනා සමොසරණා' - මේ මැණික දැක්කත් එක්කම ඒ පිළිබඳ සැප වේදනා රාශියක් - සිත පිළිබඳව - සිතේ ඇතිඋනා. වෙදනා සමොසරණා - ඒ ඔක්කොම ගිහිල්ල එකතුවෙන්නෙ වේදනාවටයි. ඊළඟට 'සමාධි පමුඛා' - එතකොට මෙතන මේ කියන්නෙ මිථ්‍යාසමාධිය වෙන්න පුළුවන්. නමුත් අර මැණිකටයි හිත ගිහිල්ල තියෙන්නෙ. මැණිකටම යොමුඋන සමාධියක් දැන් තියෙන්නෙ. මිථ්‍යාසමාධියක් වෙන්න පුළුවන්. නමුත් සමාධියක් ඒක. ධර්මතාවක් වශයෙන් බලනකොට ඒක දෙයක් හැටියට වෙන්කරගත්ත. කසලගොඩ ගැන නොවෙයි දැන් එහෙම පිටින්ම මෙයාගෙ භාවනාව - අර මැණික ගැන.

ඊ ළඟට 'සතාධිපතෙය්‍යා සබ්බෙ ධම්මා' - මේ අධිපතිකම, යම්කිසි දෙයක් තවදෙයකින් වෙන්කරල ඒක ඒ ආකාරයෙන්ම පවත්වා ගැනීමට නොවිසුරුනු සතියක් අවශ්‍යයි. වික්ෂිප්ත බව තියෙනවනම් වෙනදේවලටත් ඒක ඇදිල යනව. ඒ අවධානය, ඒ මනසිකාරය, ඇදිලයනව. අන්න ඒක නිසා තමයි මේකෙ අධිපතිකම කරන්නෙ සතියයි. මිථ්‍යාසතිය වෙන්න පුළුවන්. නමුත් මැණිකටයි දැන් සතිය යෙදිල තියෙන්නෙ. තීරණාත්මක කොටස ඔන්න ඊළඟටයි තියෙන්නෙ. 'පඤ්ඤුත්තරා' දැන් මේ මැණික පිළිබඳව කොයි කොයි ආකාරයෙන් හරි මිථ්‍යාවශයෙන් හෝ සතියක්,

සමාධියත් හැදුන. දැන් යම්කිසි විදියකින් ධර්මානුකූලව මේකෙන් එතෙර වෙන්න ඕන නම්, මේ මැණිකම කර්මස්ථානයක් කරගෙන නිවන් දකින්න ඕන නම්, කරගතයුතු දෙයයි ඊළඟට තියෙන්නෙ. 'පඤ්ඤුත්තරා සබ්බෙ ධම්මා' අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් මැණික විනිවිද දැකල, ආයිත් මේක කසලගොඩටම අයිති දෙයක් බව වටහාගැනීමයි කරන්න තියෙන්නෙ. 'පඤ්ඤුත්තරා' ඒ පිළිබඳ ප්‍රඥව - මේ මුළුමහත් ලෝක කසල ගොඩේම එක දෙයක් මැණික. ලෝක විනාශයේදී විනාශවන සාමාන්‍ය අඟුරු ගුලියක් වගේ දෙයක් කියල අන්න එහෙම ප්‍රඥව පහළ උනොත් අන්න එතකොට අර මැණිකෙන් එතෙර උනා. 'පඤ්ඤුත්තරා සබ්බෙ ධම්මා' - එතකොට මේවයෙ සාරය අර අනිකුත් බ්‍රාහ්මණයන් කියන්න වගේ ආත්මසාරයක් නොවෙයි මෙතන තියෙන්නෙ. විමුක්තියයි සාරය. මහා සාරෝපම ආදී සූත්‍රවලත් සාරය හැටියට දක්වන්නෙ මුළුමහත් ධර්මයෙම, මෙන්න මේ විමුක්තියයි. මේවායින් මිදීමමයි සාරය. සමහර කෙනෙක් හිතාගන්නව සංකල්ප ගොඩක් එකතුකරගෙන කරගහගැනීමයි කියල. නමුත් ඒක නොවෙයි, මේ සංකල්ප විනිවිද දැකල ඒවායින් එතර වීමයි. එතෙරවීමෙන් ලබන විමුත්තියමයි සාරය. 'විමුත්ති සාරා සබ්බෙ ධම්මා', මේ සංකල්පය, මැණික පිළිබඳ ඇතිකරගත්තු සංකල්පය, මේක ලෝකයෙන් වෙන්කරල. අමුතුදෙයක් වටිනාදෙයක්, කියල තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ඇතිකරගත්තු ඒ සංකල්ප රාශිය නැති වීමෙන් මැණික අහෝසි උනා. අන්න ඒක තමයි විමුක්තිය - එයින් මිදුන. මැණිකෙන් මිදුන. 'විමුත්තිසාරා සබ්බෙ ධම්මා' - ඔය විදියට මෙතන මේ ඉතාම වටිනා සූත්‍රයක් විදර්ශනා කර්මස්ථානයක් කරගත හැකි තරම් වටිනා සූත්‍රයක් මෙතන තියෙන්නෙ. මේ විදියට ප්‍රඥවෙන් දැකල එයින් මිදුනාම, අන්න ඒකම තමයි මනසට අරමුණු වන ධර්මයක ඇති හරය හැටියට ගතයුත්තෙ. සාරය හැටියට ගත යුත්තෙ. මේ විදියට කල්පනා කරල බලනකොට, ලෝකයේ ඇති හැමදෙයක්ම කර්මස්ථාන අරමුණු වෙනව. ඒ නිසාම තමයි අතීතයේ සිටි රහතන් වහන්සේලා, රහත් මෙහෙණින්වහන්සේලා පිළිබඳව අපට හිතාගන්න බැරිතරම් අමුතු අමුතු පුදුම කර්මස්ථාන තියෙන්නෙ. මේ ආකාරයට බලනකොට සමහරවිට විසභාග ආරම්මණ පවා කර්මස්ථාන වෙලා තියෙනව. සාමාන්‍යයෙන් කර්මස්ථානාචාර්යයන් වහන්සේල හේතු සහිතව ආදිකර්මිකයට සමහර කර්මස්ථාන තහනම් කරනව- විසභාග ආරම්මණ - පුරුෂයෙකුට නම් ස්ත්‍රීරූප. ස්ත්‍රියකට නම පුරුෂරූප - ඒක හේතුසහිතයි. මක්නිසාද? සමහර විට අමුසොහොනෙ තිබුනු කුණුවී ගිය මළසිරුර දැකලත් සමහර සංඝයාට රාගය උපන්න බව ථෙර ගාථාවල සඳහන් වෙනව. නමුත් ඒ ථෙරගාථාවලම තවත් වටිනා ථෙරගාථාවක් සඳහන් වෙනව, නාගසමාල ථෙරගාථා කියල. නාගසමාල ස්වාමීන්වහන්සේ විසභාග ආරම්මණයක් මුල්කරගෙනයි රහත් උනේ. ඒ

සවාමීන්වහන්සේගේ වචනයෙන් වගේ සඳහන් වෙනව 'මම එක දවසක්ද පිණ්ඩපාතෙ වැඩිය. මහාමාර්ගයට බැස්ස හැටියෙම මෙන්න තූර්යනාද මධ්‍යයේ එක්තරා නාටිකාංගනාවක් බොහොම ලස්සනට සැරසිල නටනව'. දැක්ක හැටියෙ මොකද උනෙ.

'තතො මෙ මනසිකාරො - යොනිසො උදපජ්ජථ
ආදීනවො පාතුරහු - නිබ්බිද සමතිට්ඨථ
තතො චිත්තං විමුච්චි මෙ - පස්ස ධම්මසුධම්මතං [12]

ඒ නාටිකාංගනාව දිහා බැලුව. මොකක්ද මේ සද්දේ කියල ඔලුව උස්සල බැලුව හැටියෙ මොකද උනේ - 'තතො මෙ මනසිකාරො යොනිසො උදපජ්ජථ' - ඒ අවස්ථාවෙ මට යොනිසොමනසිකාරය - 'අයොනිසො' නොවෙයි-යොනිසොමනසිකාරය හටගත්ත. 'ආදීනවො පාතුරහු' - මේකෙ ආදීනව පක්‍ෂය මට වැටහුනා. 'නිබ්බිද සමතිට්ඨථ' නිබ්බිදව නිර්වේදය, මට හොඳට පිහිටිය. 'තතො චිත්තං විමුච්චි මෙ' - ඒ මොහොතෙම මගේ සිත විමුක්ත වුනා. 'පස්ස ධම්ම සුධම්මතං' මේ ධර්මයෙ සුධර්මතාව බලව' ඔන්න ඔය 'ධර්ම සුධර්මතාව' හෙළිකර ගන්න නම් මේ සූත්‍රය තෝරන්න වෙන්නෙ අර කුසල් ධර්මවලට විතරක් සීමා කරල නොවෙයි. මිථ්‍යා සමාධියෙන් හෝ අර මැණික පිළිබඳව සිතිවිලි ධාරාවක් ගිහිල්ල, සතියක් සමාධියක්, මිථ්‍යාවශයෙන් හෝ ඇති උනානම්, යම්කිසි අවසථාවක යෝනිසොමනසිකාරය ආවාම ඒක පිළිබඳව, ඒක්‍ෂණයෙන්ම - අර සන්දිට්ඨික, අකාලික, එහිපස්සික කියන ධර්මනියාමතාව අනුව - ඒ ක්‍ෂණයෙන්ම විශාල වෙනසක් සිදුවෙනව. ඒක නිසාමයි අර අතීතයේ නොයෙකුත් බ්‍රාහ්මණයින් තමතමන්ගේ ධ්‍යාන භාවනා එහෙම කරල බුදුපියාණන්වහන්සේ ළඟට එනව. එක ගාථා පදයක් අහල කොහොමද රහත් වෙන්නෙ කියල සමහර කෙනෙක් කල්පනා කරනව. මේක බුදුපියාණන්වහන්සේගේ ප්‍රාතිහාර්යය නිසාය උනෙ එහෙම නැත්නම් ඒ කාලෙ හිටියෙ පින් ඇති අය කියල ඒ විදියට තෝරනව. නමුත් මෙතන තියෙන 'ධර්මප්‍රාතිහාර්යය ' ගැන කල්පනා කරන්නෙ නැහැ බොහොම අය. මේ ධර්ම ප්‍රාතිහාර්යය අනුව කල්පනා කරල බැලුවොත් අපට කියන්න පුළුවන්, සමහර කෙනෙක් දේදුන්නක් පායනකං අහස දිහා බලාගෙන ඉන්න පුළුවන්. මේක ඉතින් කොච්චර කාලයක් බලන් ඉන්න වෙනවද දන්නෙ නැහැ. නමුත් ඥානවන්තව - උදෑසන අර වැලක කොලයක එල්ලෙන පිණිබිඳක් ඔස්සේ ඉරපායනකොට හරියට ඉලක්කය අල්ලල බැලුවොත් සූර්යරශ්මියේ තියෙන සියළුම වර්ණ සංකලන ඒ පිණිබිංදුව තුළින් දකින්න පුළුවන් වෙනව. ඒකම කර්මස්ථානයක් කරගත්තොත්. අන්න ඒ විදියට මේ මුළුමහත් ධර්මයම, අර සත්තිස් බෝධිපාක්‍ෂික ධර්ම ආදී හැම එකක්ම, සමහරවිට විසභාග ආරම්මණයෙ පවා දකින්න පුළුවන්. යොනිසොමනසිකාර, අයොනිසොමනසිකාර කියන වචන දෙක දිහා

බැලුවාම, ශාස්ත්‍රීය වශයෙන් බැලුවාම, අහසට පොළොව වගේ පරතරය. සම්මාදිට්ඨි, මිච්ඡාදිට්ඨි කියන වචනදෙක බැලුවාම අහසට පොළොව වගේ පරතරය. ඇතයි. නමුත් ප්‍රත්‍යක්ෂවශයෙන් කල්පනාකරල බලනකොට, ඉතාම සුළු වෙනසයි තියෙන්නෙ. දැන් අර පිඹිබිද - ඒක කෙනෙකුට ඉතාමත්ම පහසුවෙන් ප්‍රත්‍යක්ෂකරගත හැකි දෙයක්. සමහරවිට අපිට ඉබේමත් පේනව ඉර පායාගෙන එනකොට. ඉතාමත්ම සුළු වෙනසක් කළ හැටියෙ අර පිඹිබිඳේ තියෙන වර්ණසංකලනය නොපෙනී යනව. ඒක පෙනෙන්නෙ එක්තරා ඉලක්කයකට බැලුවාම පමණයි. ඔන්න ඔය විදියෙ දෙයක් තියෙන්නෙ මේ ධර්මය පිළිබඳවත්. සන්දිට්ඨික, අකාලික, එහි පස්සික, ඔපනයික, පච්චත්තං වෙදිතබ්බ විඤ්ඤූහි ධර්මයේ ස්වභාවය ඕකයි.

එතකොට, මේ සූත්‍රය පිළිබඳව අපි දුන්න විග්‍රහය, - 'සබ්බෙ ධම්මා' කියන එක 'හැමදෙයක්ම' කියන අර්ථයෙන් අරගෙන කළ විග්‍රහය, තවදුරටත් සනාථවන වටිනා සූත්‍රයක් අපට හොයාගන්න පුළුවන් වෙනව අඞ්ගුත්තර නිකායෙ නවකනිපාතයෙ සමිද්ධිසූත්‍රය. ඒක ශාරීපුත්‍ර ස්වාමීන්වහන්සේ දේශනා කළ සූත්‍රයක්. ඒ සමිද්ධි සූත්‍රය බොහෝ දුරට අපි කලින් සඳහන් කළ සූත්‍රයට සමාන්තරවයි ගමන්කරන්නෙ. සුළුකාරණා කීපයක විතරක් වෙනසක් තියෙනව. ඒ සූත්‍රයේදී සමිද්ධි ස්වාමීන්වහන්සේ, හරියට අර ගුරුවරයෙක් ළඟ පාඩම් දෙන ගෝලයෙක් වගේ සැරියුත් ස්වාමීන්වහන්සේ අහන ප්‍රශ්නවලට පිළිතුරු දෙනව. මෙන්න මේවායි සැරියුත් ස්වාමීන්වහන්සේ අහන ප්‍රශ්න-

> **"කිමාරම්මණා සමිද්ධි පුරිසස්ස සංකප්පවිතක්කා උප්පජ්ජන්ති 'නාමරූපාරම්මණා භන්තෙ' 'තෙ පන සමිද්ධි ක්ව නානත්තං ගච්ඡන්ති' 'ධාතූසු භන්තෙ. තෙ පන සමිද්ධි කිං සමුදයාති' 'ඵස්ස සමුදයා භන්තෙ' 'තෙපන සමිද්ධි කිං සමොසරණාති? 'වෙදනා සමොසරණා භන්තෙ' 'තෙ පන සමිද්ධි කිං පමුඛාති?' 'සමාධිපමුඛා භන්තෙ' 'තෙ පන සමිද්ධි කිං ආධිපතෙය්‍යාති' 'සතාධිපතෙය්‍යා භන්තෙ' 'තෙ පන සමිද්ධි කිමුත්තරාති?' 'පඤ්ඤුත්තරා භන්තෙ' , 'තෙ පන සමිද්ධි කිං සාරාති' 'විමුත්තිසාරා භන්තෙ' 'තෙ පන සමිද්ධි කිං ඔගධාති' 'අමතොගධා භන්තෙ.' [13].**

ඔය විදියටයි තියෙන්නෙ. මෙතන අමුත්තකට තියෙන්නෙ මුල් ප්‍රශ්න දෙකත් අග ප්‍රශ්නයත් පමණයි. අනිත් හරිය අර බුඞදේශනාවෙ තියෙන කාරණා විදියමයි. නමුත් මෙතනින් ඉතාමත්ම පැහැදිලිව හෙළිවෙනව සැරියුත්ස්වාමීන්වහන්සේ අහන්නෙ සංකල්ප විතර්ක පිළිබඳවයි. ඒක පැහැදිලිවම තියෙනව. අතන අර 'සබ්බෙ ධම්මා' කියල කියනකොට සමහරවිට කෙනෙකුට සැක හිතෙන්න පුළුවන් මේ කුසල් ධර්මද, අකුසල් ධර්මද කියල ඔය විදියට. නමුත් මෙතන පැහැදිලිවම පෙනෙනව සැරියුත් ස්වාමීන් වහන්සේ අහන්නෙ සංකල්ප, විතර්ක ගැන. දැන් අපි පරිවර්තනය කරමු මේ ප්‍රකාශ කළ ටික.

'කිං ආරම්මණා සම්දධි පුරිසස්ස සංකප්ප විතක්කා උප්පජ්ජන්ති' - සම්දධි, කුමක් අරමුණු කරගෙන පුරුෂයෙකුට සංකල්ප විතර්කයෝ උපදිද්ද? පිළිතුර 'නාමරූපාරම්මණා භන්තෙ' - නාමරූපය අරමුණු කරගෙනයි කෙනෙකුට සංකල්ප විතර්ක ඇතිවෙන්නෙ. ඇතිවෙනතාක් සංකල්ප, විතර්ක නාමරූපය මුල්කරගෙනයි. ඊළඟට, 'තෙ පන සම්දධි ක්ව නානත්තං ගච්ඡන්ති' - ඒවා නානත්වයට යන්නෙ කොතැනද? එතන දෙන පිළිතුර - 'ධාතූසු භන්තෙ' අටලොස් ධාතූන් පිළිබඳවයි ඒවා නානත්වයට යන්නෙ. ඒ කියන දේවල් නානත්වය හැටියට සලකන්නෙ අර අටලොස් ධාතූන් අනුවයි. ඊළඟට අනිත් හරිය. අර කලින් කියාපු විදියටමයි දිගටම තියෙන්නෙ. 'තෙ පන' - කියල. කියන්නෙ අර සංකල්ප විතර්ක පිළිබඳව. කෙලින්ම අහන්නෙ මේ සංකල්ප විතර්ක කුමක් අරමුණු කරගෙනද හටගන්නෙ. නාම රූපය අරමුණු කරගෙන. සංකල්ප විතර්ක කොතැනද නානත්වයට යන්නෙ? අටලොස් ධාතූන් පිළිබඳවයි. මේ සංකල්ප විතර්කවල සමුදය කුමක්ද? ස්පර්ශයයි. සමොසරණය - එක්රැස්වීම කොතැනද? වේදනාවෙයි. ප්‍රමුඛ වන්නෙ? සමාධියයි. අධිපතිවන්නෙ? සතියයි. එතරවන තැන, මුදුන්ම තැන, ඉහලම තැන? ප්‍රඥවයි. සාරය? විමුක්තියයි. අවසාන ප්‍රශ්නය. ඒකත් නිවනටම අදල දෙයක් - කිං ඔගධා' - මේව ගිහිල්ල කොතැනටද ගලා බහින්නෙ. එහෙම නැත්නම් මේක බැසගන්නෙ කොතැනටද? 'අමතොගධා', අමෘතත්වයට. නිවන පිළිබඳවම විශේෂ වචනයක් එතන තියෙන්නෙ. අමෘතත්වයටයි ගලාබසින්නෙ හැමදෙයක්ම. කලින් කිව්ව වගේ, හැම දෙයකම තියෙනව අමෘතත්වය, නිවන ලබාදෙන ශක්තිය. හැබැයි යෝනිසෝමනසිකාරය යෙදුවොත් පමණයි. මෙතනිනුත් පැහැදිලිවම හෙළිවෙනව, මේ ප්‍රකාශ වෙන්නෙ සංකල්ප විතර්ක පිළිබඳවයි. මනසට අරමුණු වන දේවල් හැමදෙයක්ම සංකල්ප විතර්ක. ඔය කියාපු ධර්මතාවලට අනුවයි මනසට අරමුණුවන දේවල් අගය කළයුත්තෙ. එහෙම නැතිව අර ආත්මවාදීන් ප්‍රකාශකළා වගේ ආත්මසාරයක්, බ්‍රහ්මනිර්මිත දේවල් හැටියට නොවෙයි බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරන්නෙ. 'මනො පුබ්බංගමා ධම්මා' කියන ඒ ධර්ම නියාමතාව අනුව මෙයින් පෙනෙනව මේ නාමරූප අරමුණම-මේ නාමරූපය ගැනමයි අපි දිගටම කථා කළේ, හුඟක් දේශනාවල-දැන් මෙතනින් පැහැදිලි වෙනව බුදුපියාණන් වහන්සේ දක්වා වදළ මේ ප්‍රතිපදවෙන් කෙරෙන්නෙ කුමක්ද කියල. අර නාමරූපය අරමුණු කරගෙන පටන් ගන්න ප්‍රතිපදව අවසන් වෙන්නෙ නාමරූපය විනිවිද දැකීමෙන්. නාමරූපය අනිච්ච දුක්ඛ, අනත්ත, වශයෙන් විනිවිද දැකල එයින් එතරවීමෙන් තමයි අවසාන වන්නෙ. ඒ කාරණයයි මේ සූත්‍රවලිනුත් පැහැදිලි වෙන්නෙ. නාමරූපයෙන් මිදීමමයි සාරය හැටියට ගන්න ඕන. එතකොට මෙතනින් ප්‍රකාශකළෙත් නාමයත් රූපයත් අතර

සම්බන්ධතාව වගේම මේ නාමරූපය පිළිබඳව ඇති ශූන්‍යත්වය හරියාකාර තේරුම් ගත්ත නම් යම්කිසි අවස්ථාවක, ඒ නාමරූපය විනිවිද යාමට හැකියාවක් ඇතිවෙනව. ඒක ප්‍රඥාවෙන් කෙරෙන දෙයක්. ප්‍රඥාව නැතිතාක් මේ නාමරූපයෙ, විඤ්ඤාණය පටලැවෙන ස්වභාවයක් තියෙනව. හිත පටලැවෙන ස්වභාවයක් තියෙනව. ඒක තමයි අර ධම්මපද ගාථාවක සඳහන් වෙන්නෙ, රහතන් වහන්සේ පිළිබඳව.

'කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා'[14]

කියල රහතන්වහන්සේ පිළිබඳව සඳහන් කරනව. 'කොධං ජහෙ' - ක්‍රෝධය ඉවත් කරන්නේය. 'විප්පජහෙය්‍ය මානං' මානය සම්පූර්ණයෙන්ම ඉවත්කරන්නේය. 'සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය' - සියලුම සංයෝජන ඉක්මවාලන්නේය. 'තං නාමරූපස්මිං අසජ්ජමානං' - නාමරූපයෙහි නොරැ දෙන නොඇලෙන නොබැඳෙන, ඒ පුද්ගලයාව- 'අකිඤ්චනං' - ඒ අකිඤ්චන පුද්ගලයාව, කිසිවක් අයත් නැති ඒ පුද්ගලයාව - 'නානුපතන්ති දුක්ඛා' - දුක්ඛයෝ ඒ පුද්ගලයාව යටපත් නොකරත්. ඒ පුද්ගලයා මත කඩා නොවදිත්, කියන එක වගේ. ඔන්න ඔයිනුත් අපට පෙනෙනව එතකොට බුදුපියාණන් වහන්සේගේ ප්‍රතිපදාව අනුව මේ නාමරූපය ඉක්මවීමේ- නාමරූපයේ ඇති ශූන්‍යත්වය වටහාගෙන ඒක ඉක්මවීමේ-ක්‍රමයකුයි මෙයින් දක්වන්නෙ. ඉතාමත්ම වටිනා කාරණයක් අපට හෙළිවෙනව බ්‍රහ්මජාල සූත්‍රය ටිකක් විග්‍රහ කරල බැලුවොත්. දීඝනිකායෙ බ්‍රහ්මජාල සූත්‍රයෙ තිබෙන්නෙ බුදුපියාණන් වහන්සේගේ ඒ 'සබ්බතොපභ අනිදස්සන විඤ්ඤාණයෙ, ඒ කියන්නේ හැම පැත්තෙන්ම ආලෝකවත් වූ අනිදස්සන විඤ්ඤාණයෙ, ප්‍රඥා ප්‍රභාවෙන් අර දෙසැටක් මිථ්‍යාදෘෂ්ටි නිෂ්ප්‍රභා වන ආකාරය. යමක් නිෂ්ප්‍රභා වෙනව කියන එක අපි චිත්‍රපටි ගැන කථා කරනකොට අර චිත්‍රපටිය නිෂ්ප්‍රභා උනෙ දොරවල් ඇරීමෙන්. දොරවල් ඇරීම නිසා විශාල ආලෝකයක් ආවාම අර සිනමා තිරයට වැටිල තිබුන සුළු ආලෝකය එහෙම පිටින්ම නිෂ්ප්‍රභා උනා. අන්න ඒ වගේ බුදුපියාණන්වහන්සේගේ මේ ප්‍රඥා ප්‍රභාවෙන්-අනිදස්සන විඤ්ඤාණයේ ප්‍රඥාප්‍රභාවෙන්-දෙසැටක් මිථ්‍යාදෘෂ්ටි නිෂ්ප්‍රභාවෙන ආකාරය අපට බ්‍රහ්මජාල සූත්‍රයෙන් දකින්නට ලැබෙනව. අර පුළුල් ප්‍රඥා ප්‍රභාවයෙන් පටු මිථ්‍යාදෘෂ්ටි හැට දෙකක් නිෂ්ප්‍රභා උනේ කොහොමද? අනෙකුත් තීර්ථකයින්, ඒ මිථ්‍යාදෘෂ්ටිකයින් ඒ දෘෂ්ටි තනාගත්තෙ නාමරූපයම අල්ලාගැනීමෙන්. නාමරූපයේ රැඳීමෙන්. නාමරූපයේ බැඳිල ඒව පිළිබඳව තර්ක කරල නාමරූපයෙන්ම නිපදවා ගත්තු දෘෂ්ටි සමූහයක්. අන්න ඒක නිසයි. ඒ

කාරණය සුත්තනිපාතයේ මහා වියූහ සූත්‍රයෙත් සඳහන් වෙනව. අනෙකුත් දෘෂ්ටි වාදීන් නාමරූපයෙන් නොමිදුන බව මෙහෙම ප්‍රකාශකරනව.

'පස්සං නරො දක්ඛිති නාමරූපං
දිස්වාන වා ඤස්සති තානිමෙව
කාමං බහුං පස්සතු අප්පකංවා
නහි තෙන සුද්ධිං කුසලා වදන්ති' - [15]

ඒ කියන්නෙ, බ්‍රහ්මජාල සූත්‍රයෙමත් තියෙනව සමහර දෘෂ්ටි, අභිඥලාභීන් විසින් ඉදිරිපත් කරන ලද දෘෂ්ටි. ඔවුන් ලෞකික අභිඥ ලබාගෙන පෙර විසූ කඳ පිළිවෙල පිළිබඳව, සමහර විට ලක්ෂ කෝටි ගණන් ඈතට දැකල තමතමන්ගේ ජීවිත, සමහරවිට පරචිත්ත විජානනයෙන් තවත් දේවල් සොයාගෙන, ඒවා උඩ ගොඩනගාගත් දෘෂ්ටි සමූහයකුත් මේ බ්‍රහ්මජාල සූත්‍රයෙ තියෙනව. නමුත් ඒවත් ප්‍රතික්ෂේප වෙනව. නිෂ්ප්‍රභා වෙනව. මක්නිසාද? හේතුව මොකක්ද? අන්න ඒක කියැවෙනව මේ ගාථාවෙන් 'පස්සං නරො දක්ඛිති නාමරූපං' අර කියන අභිඥ වලින් දකින්නා වූ ඒ මනුෂ්‍යයා 'දක්ඛිති නාමරූපං' - දකින්නේ නාමරූපයමයි. 'දිස්වාන වා ඤස්සති තානි මෙව' - ඒ නාමරූපය දැකල ඒකම නිත්‍ය වශයෙන් අල්ලගන්නව. හරියට අර අඳුරු වීදුරු සහිත අඳුරු කාමරයක - අඳුරු වීදුරුවක් සහිත ජනේලයක් ඇති කාමරයක - ඉන්න කෙනෙකුට, ඒ වීදුරුවෙ වැටෙන දේ මිසක්, පිළිබිඹු වන දේ මිසක්, ඉන් ඈතට නොපෙනෙනව වගේ, අර නාමරූපයේ ගිහිල්ල රැඳෙන බැඳෙන ස්වභාවයක් නිසා අර දෘෂ්ටිවාදීන් ඒ තමන් දැක්ක අතීත ජාති අනුව යම් යම් දෘෂ්ටි තිපදවා ගත්ත. අන්න ඒකයි මෙතන කියන්නෙ. 'දිස්වාන වා ඤස්සති තානිමෙව' - ඒ නාමරූපයමයි සත්‍ය වශයෙන් ගන්නෙ. 'කාමං බහුං පස්සතු අප්පකංවා' - ඕන නම් බොහෝකොට හෝ දකීවා සුළුකොට හෝ දකීවා. ඒ කියන්නෙ, බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනව, ඒ ගොල්ල හුඟක් දැක්කත් ටිකක් දැක්කත් ඒකෙන් ඇති වැඩක් නැහැ. 'න හි තෙන සුද්ධිං කුසලා වදන්ති' - 'බුද්ධාදී කුසලයෝ, නියම දක්ෂයෝ, එයින් ශුද්ධියක් ඇතිවේයයි නොකියත්'. දැන් මෙතන පැහැදිලිව පෙනෙනව අර පටු මිථ්‍යාදෘෂ්ටි පිළිබඳව, ඒවා නාමරූපය දැඩිව අරගෙන, ඒ මත ගොඩනගා ගත් දෘෂ්ටි. බුදුපියාණන් වහන්සේගේ දර්ශනය නාමරූපය ඉක්මවා යන සමතික්‍රමණය කරන - ලෝකෝත්තර දර්ශනයක්. ඒක ඉතාමත්ම පැහැදිලි වෙනව, දැන් මේ බ්‍රහ්මජාල සූත්‍රයට බ්‍රහ්මජාල කියන නම දීල තියෙන්නෙ මොකද? මේක බඹදැලක් හැටියට උපමාව දීල තියෙනව. බුදුපියාණන්වහන්සේම ප්‍රකාශ කරනව සූත්‍රය අවසානයේදී මේක බ්‍රහ්මජාලයක්. උපමාව දක්වන්නෙ හරියට අර මස්මරන්නෙක්, ඉතාම සියුම් දැලකින් යම්කිසි ජලාශයක ඉන්න සියලුම මත්ස්‍යයින් අල්ලගන්නව වගේ,

ඔවුන්ට කෙසේවත් බේරෙන්න බැරි විදියට ඉතාමත් සියුම් දැලක් වියල දැම්මොත් ඒකට ඔක්කොම අහුවෙනව වගේ, මේ බ්‍රහ්මජාලයට, ලෝකයේ ඇතිතාක් සියලුම දෘෂ්ටි අහුවෙනව කියල. එතකොට දැලක, දැල්ඇස කුමක්ද කියලත් අපි ටිකක් කල්පනාකරල බලන්න ඕන. මේ බ්‍රහ්මජාල සූත්‍රය දැලක් හැටියට ගත්තොත් ඒ දැලේ තිබෙන සියුම් දැල් ඇස කුමක්ද? සිදුර කුමක්ද? ඒක ඉතාමත්ම පැහැදිලිව පෙනෙන සූත්‍රය පුරාම යෙදෙන එක්තරා වචනයක් තියෙනව. ඒ එක් එක් දෘෂ්ටි නිෂ්ප්‍රභා කරනකොට බුදුපියාණන්වහන්සේ යොදන වචනය, මොකක්ද? 'සබ්බං තං ඵස්ස පච්චයා. සබ්බං තං ඵස්ස පච්චයා, තදපි ඵස්ස පච්චයා. තදපි ඵස්ස පච්චයා' - 'ඒ සියල්ලම ස්පර්ශය ප්‍රත්‍යයකරගෙන, ඒ සියල්ලම ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන. ඒකත් ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන, 'ඔය විදියට එතකොට අපට පේනව මේ ස්පර්ශය - මේ ස්පර්ශය තමයි අර දැල් ඇස. මේ ස්පර්ශය මුල් කරගෙන සළායතනය මගින් ගොඩනගා ගත් දෘෂ්ටි සමූහයක්, අනිකුත් මිථ්‍යාදෘෂ්ටිකයින් අතර තියෙන්නෙ. බුදුපියාණන්වහන්සේගේ දර්ශනය **සළායතන නිරෝධයෙන්** - සළායතන නිරෝධය කියල කියන ඒ නිර්වාණය දර්ශනයෙන් - ලැබුනු එක්තරා අංගසම්පූර්ණ ප්‍රඥප්‍රභාවක් එතනින් පේන්නෙ. මේ කාරණය තවදුරටත් පැහැදිලි වෙනව ඒ සූත්‍රයෙ නාමරූපය අනුව ගිහිල්ල ඒ මිථ්‍යාදෘෂ්ටිකයින් නිපදවාගත්තු දෘෂ්ටි නිසා, ඇත්තවශයෙන්ම ඔවුන් සංසාරයේම කරකැවෙන බව බුදුපියාණන්වහන්සේ ඒ සූත්‍රයෙ ප්‍රකාශකරනව. එතන සඳහන් වෙන්නෙ.

> **සබ්බෙ තෙ ඡහි ඵස්සායතනෙහි ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති 'තෙසං ඵස්ස පච්චයා වෙදනා. වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති, යතො ඛො භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයංච අත්ථගමංච අස්සාදංච, ආදීනවංච නිස්සරණංච යථාභූතං පජානාති. අයං ඉමෙහි සබ්බෙහෙව උත්තරීතරං පජානාති** [16]

ඒ කියන්නෙ ඔන්න වෙනස පෙන්නුව හොඳටම, ඒ දෘෂ්ටිවාදීනුත් මේ බෞද්ධ දර්ශනයත් අතර ඇති වෙනස. ඒ දෘෂ්ටිවාදීන් අර විදියට, අර ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන - ඉන්ද්‍රියස්පර්ශය - සමහර විට අභිඥාද ලැබුවත්, ඒත් අර සාමාන්‍ය ඉන්ද්‍රිය වලින්මයි. සළායතනය මුල්කරගෙන ඇතිකරගත්තු ඒ ස්පර්ශ නිසා ඔවුන්ට වේදනා ඇතිවෙනව. වේදනාව නිසා තණ්හාව, උපාදාන ආදී වශයෙන් සංසාරයේම කරකැවෙනව. නමුත් සම්‍යක් ප්‍රතිපදවෙ යන විමුක්ත භික්ෂුව පිළිබඳව කියැවෙන්නෙ අර සළායතනයන්ගේම, සළායතනයන් පිළිබඳවම, එක්තරා අංග සම්පූර්ණ - අංගපහකින් සම්පූර්ණ - අවබෝධයක් ලබනව, ඒක තමයි අර ප්‍රඥ ආලෝකය කියල කියන්නෙ. සළායතනය පිළිබඳව - 'සමුදයංච අත්ථගමංච

අස්සාදංච ආදීනවංච නිස්සරණංච කියන පැති පහම ප්‍රකට වෙනව, ඒ ප්‍රඥ ප්‍රභාවට. සළායතනයන්ගේ හටගැන්ම, සළායතනයන්ගේ අස්තගමනය - අස්තයට යාම - ඒවායේ ආස්වාද පක්ෂය. ඒවායේ ආදීනව පක්ෂය, ඒවායේ නිස්සරණය ඒවායින් නික්මීම - කියන මේ අංග පහම ප්‍රකට වෙන නිසා තමයි ඒක උත්තරීතර ඥනයක් හැටියට ගතහැක්කෙ. මෙතන පටිච්චසමුප්පාදය ගැන සඳහන්වීමත් ඉතාමත්ම වැදගත් කාරණයක්. මක්නිසාද? මෙයින් පෙනෙනව පටිච්චසමුප්පාදය අතීතයට දල තේරුම් කළහැකි දෙයක් නොවන බව. මේක මේ වර්තමානයටම අදල දෙයක්. මේ නාමරූපය පිළිබිඹු වෙන්නෙ විඤ්ඤණයේ. මේ විඤ්ඤණය පිළිබඳව සංයුත්තනිකායෙ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය ගැන විශේෂයෙන් සඳහන් වෙන නිදාන සංයුක්තයේම ඒ පටිච්චසමුප්පාදය විස්තර කරන අවස්ථාවෙ, විඤ්ඤණය තෝරන්නෙ මේ විඤ්ඤණ හයම අහුවෙන හැටියට [17] - 'චක්ඛු විඤ්ඤණං, සොත විඤ්ඤණං ඝාණ විඤ්ඤණං, ආදිවශයෙන් විඤ්ඤණ හයම අහුවෙන හැටියටයි. එයින් අපට පෙනෙනව මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයෙ විඤ්ඤණය පටිසන්ධි විඤ්ඤණයක් වැනි එකක් නොවන බව. එකක් නොවෙයි මෙතන කියන්නෙ. මේ විඤ්ඤණ හයෙහිම පිළිබිඹුවන නාමරූප ආශ්‍රයෙන් තමයි සළායතනයක් ගොඩනැගෙන්නෙ. ආයතන හයක්. අජ්ඣත්ත බහිද්ධා වශයෙන් භේදයක් ඇතිකර ගන්නෙ අර නාමරූපය විනිවිද යාමට නොහැකිවීම නිසා. එතන පෙනෙනව දෙකක්. 'මේ මම' 'මේ නාමරූපය': 'මේ බලන මම', 'මේ අරමුණ වන නාමරූපය' කියල ඔය දෙක අතරේ ඊළඟට හඳගන්නව අජ්ඣත්ත - බහිද්ධා භේදයක්. ඒක උඩ තමයි සළායතනයක් ගොඩනැගෙන්නෙ. ඒක උඩ තමයි ඊළඟට වේදනා ආදී ධර්ම ගොඩනැගෙන්නෙ. ඒකෙන් තමයි තණ්හා උපාදන වශයෙන් ඔය විදියට පටිච්ච සමුප්පාදයටම අහුවෙලා ඔවුන් සංසාරයෙම කරකැවෙන බව බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කළේ. එතකොට බ්‍රහ්මජාල සූත්‍රයෙන් අපට පැහැදිලි වෙනව. මේ විඤ්ඤණයේ පිළිබිඹුවන නාමරූපයේ ඒ පිළිබිඹුව දැඩිව ගැනීම නිසා - ඒ පිළිබිඹුව ආත්ම වශයෙන් සැළකීම නිසා - කොටින් කියනවනම් සක්කාය දිට්ඨිය නිසා - මේ විදියේ මිථ්‍යාදෘෂ්ටි රාශියක් ලෝකයේ පවතින බව. මේකට අපි පොඩි උපමාවක් ගනිමු. මෙතෙක් ප්‍රකාශ කළ මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ දර්ශනයත්, සම්‍යක් දෘෂ්ටියත් අතර වෙනස තේරුම් ගැනීමට හොඳ උපමාවක් අපට සොයාගන්න පුළුවනි උම්මග්ග ජාතකයෙන්.

උම්මග්ගජාතකයෙ තියෙනව මණි ප්‍රශ්නයක් [18] එක්තරා මැණිකක් පිළිබඳ ප්‍රශ්නයක්. මැණික් පිළිබඳ ප්‍රශ්න කීපයක් තියෙනව. එකක් අපි උපමාවට ගන්නෙ. මියුළුනුවර වාසල දෙරටුවට ටිකක් ඈතින් පොකුණක මැණිකක් තියෙනව කියල නගරවාසීන් ඇවිල්ල වේදේහ රජ්ජුරුවන්ට

දැන්වුව. වෛදේහ රජ්ජුරුවො තමන්ගෙ සේනක පණ්ඩිතයට පැවරුව ඒ මැණික ලබාගැනීම. සේනක පණ්ඩිතය ගිහිල්ල මිනිසුන්ට කියල පොකුණෙ දිය ඉස්සවල බැලුව. නැහැ මැණික. ඊළඟට මඩත් හාරල බැලුව ඒත් නැහැ සොයාගන්න. පස්සෙ බිමත් හාරල බැලුව. ඒත් මැණික සොයාගන්න බැරුව ඇවිල්ල වෛදේහ රජ්ජුරුවන්ට දැන්වුව. ඉතින් රජ්ජුරුවො බෝසත් මහෝසධ පඬිතුමාට කිව්ව. මහෝසධ පණ්ඩිතයා ගිහිල්ල බැලුව විතරයි තේරුම් ගත්ත. මේ මැණික තියෙන්නෙ පොකුණු ඉවුරෙ තියෙන තල්ගහක කවුඩු කැදැල්ලක කියල. පොකුණෙ තියෙන්නෙ ඡායාව විතරයි, පිළිබිඹුව විතරයි, කියල රජ්ජුරුවන්ට පෙන්නුව, මිනිසකුට කියල දියතලියක් දල, ඔන්න බලන්නෙයි දියතලියෙත් මැණික පේනව කියල. එහෙම රජ්ජුරුවන්ට කාරණය පැහැදිලි කරල, අන්න තල්ගහෙයි මැණික තියෙන්නෙ මිනිහෙක් ඇරල ගන්න කියල ප්‍රකාශ කළා. දැන් මේ උපමාවෙන් අපට හිතාගන්න පුළුවනි, අර මිථ්‍යාදෘෂ්ටිකයින්ගෙ දර්ශනය වගේ තමයි සේනකගෙ දර්ශනය. බුදුපියාණන්වහන්සේ ඉදිරිපත් කළ මේ නාමරූපය පිළිබඳව 'මේක පිළිබිඹුවක්' කියන අවබෝධය තමයි මේ මහෝසධ පණ්ඩිතය, බෝධිසත්වයන්වහන්සේ, ඉදිරිපත්කළ පිළිබිඹුව පිළිබඳ විසඳුම.

එතකොට සක්කාය දෘෂ්ටියෙන් කෙරෙන්නෙ මොකක්ද? තව ටිකක් කල්පනා කරල බැලුවොත්. අන්ත දෙකක් මැදිනුයි බුදුපියාණන්වහන්සේ ධර්මය දේශනා කළා කියන්නෙ. අන්තදෙක කුමක්ද? ශාස්වත දෘෂ්ටියත්, උච්ඡේද දෘෂ්ටියත්. මේ ශාස්වත දෘෂ්ටිය හරියට අර පිළිබිඹුවෙහි ඇලීම වගෙයි. යම්කිසි ඡායාවක් දැක්කහම සමහර කෙනෙක් වතුරක එහෙම තමන්ගෙ රූපය දැකල ඒකට ඇල්මක් උපදවා ගන්නව, මේ වෙන කෙනෙක් කියල. අර ඒ දණ්ඩ උඩ බල්ල ගැන අපි ප්‍රකාශ කළේ කලින් දේශනයකදී, ඒ වගේ. තවත් සමහර විට ඒ පිළිබඳ ද්වේෂයක් ඇතිවෙනව. ඔන්න ඔය විදියට ආත්ම ස්නේහයයි, ආත්ම ද්වේෂයයි, කියන ආකල්ප දෙකට නැඹුරුව අර සක්කාය දෘෂ්ටිය නිසාම ඇතිඋන අන්ත දෙකක් තමයි අර සස්සත දිට්ඨි, උච්ඡෙද දිට්ඨි කියන දෙක. හරියට අර සේනක පොකුණෙ දිය ඉවත් කරල, හාරල බැලුව වගේ වැඩක් මෙතන තියෙන්නෙ. ඔය දෙකට මැද එකක් තමයි බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරන්නෙ. තේරුම් ගන්නව මේ නාමරූපය. අර පොකුණේ යමක් පිළිබිඹු වන සවභාවය නිසාම පොකුණෙහි දැක්වෙන පිළිබිඹුවක්. මේකෙ හරයක් නැහැ, මෙතන තියෙන නාමරූපයේ නාමය - අපි කලින්ම දේශනයක සඳහන් කළා වගේ - 'නාම මාත්‍රයක්' 'නාමසවරූපයක්' පමණයි. මෙතන තියෙන රූපය, 'නාමරූපයක්', 'නාමමාත්‍ර රූපයක්' පමණයි. මේක නියම නාමයකුත් නොවෙයි, නියම රූපයකුත් නොවෙයි, නාම සවරූපයකුත්, නාමමාත්‍ර රූපයකුත් පමණයි, කියල එහෙම තේරුම් අරගෙන ප්‍රතීත්‍ය

සමුත්පාද ධර්මයට අනුව ඒ නාමරූපය විනිවිද දැකීමේ ශක්තිය අභ්‍යන්තරයෙන් ගොඩනගා ගැනීමෙන් තමයි, ඒ ප්‍රඥාව උදකරගැනීමෙන් තමයි, මේ නාමරූපයෙන් කෙනෙකුට විමුක්ත වන්න පුළුවන් වන්නෙ. මෙතෙක් මේ දේශනයෙන් අපි නාමරූපය ගැනයි විශේෂයෙන් ප්‍රකාශකළේ. නාමරූපයත් විඤ්ඤාණයත් අතර සම්බන්ධතාව විශේෂයෙන්ම මේ 'අනිදස්සන සබ්බතොපභ'- 'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතොපභං' කියල කියන අපි මුලින්ම සඳහන් කළ ගාථාධර්මයේ මුල් පදයෙ ඇති වටිනාකමයි මේ හැම එකකින්ම අපට හෙළිවෙන්නෙ.

බුදුපියාණන්වහන්සේගේ මේ දර්ශනයට අනුව මේ අනිදස්සන විඤ්ඤාණයෙ, අර නාමරූපය පිළිබිඹුවක් බව සම්පූර්ණයෙන් අවබෝධවීම නිසාම, ඒක විනිවිද දැකීමේ ශක්තියක් ඇතිවෙනව. අනෙකුත් අයට මේක පිළිබිඹුව බව නොතේරීම නිසා ආත්ම ස්නේහය ආත්ම ද්වේශය ඇතිකරගන්නව. ඒක හරියට එක්කෙනෙක් හෙවනැල්ලට ඡායාවට ඇල්ම උපදවා ගන්නව. තවකෙනෙක් හෙවනැල්ලට බයේ දුවනවා. ඔන්න ඔය විදියේ අන්ත දෙකක් ලෝකයේ තියෙන්නෙ.

'ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයන්ති
එකෙ අතිධාවන්ති එකෙ චක්ඛුමන්තොව පස්සන්ති' - [19]

කියල ඉතිවුත්තකයෙ සඳහන් වෙන්නෙ, ඒ කාරණයයි. ඒ කියන්නෙ දෙවිමිනිසුන් දෘෂ්ටිදෙකකින් මඩනා ලදුව ඇතැම් කෙනෙක් පසුබසිනව ඇතැම් කෙනෙක් ඉක්මවා දුවනව. 'චක්ඛුමන්තොව පස්සන්ති' - ඇස් ඇත්තෝමැ දකිත්.

# අධෝලිපි

1. ම. නි. I 136 පිට (බු.ජ.10)
2. සං. නි. IV 336 පිට (බු.ජ. 16)
3. සං. නි. III266 පිට (බු.ජ 15)
4. අං. නි. V 370 පිට (බු.ජ. 22)
5. ඛු. නි I 38 පිට (බු.ජ. 24)
6. සු.නි. 144 පිට (බු.ජ. 25)
7. ම.නි. I 598 පිට චූලතණ්හාසංඛය සු.
8. අං.නි. V 344 පිට (බු.ජ 22)
9. සං.නි. V (2) 30 පිට (බු.ජ. 17-2)
10. අං.නි. II 280 පිට (බු.ජ. 19)
11. බුද්ධ වග්ග. ධ.ප.
12. ථෙර. 98 පිට (බු.ජ. 28)
13. අං.නි. V 422 පිට (බු.ජ. 22)
14. කොධ වග්ග ධ.ප.
15. සු.නි. 286 පිට (බු.ජ. 25)
16. දී.නි. I 78 පිට (බු.ජ. 7)
17. සං.නි. II 6 පිට (බු.ජ. 14)
18. ජා.අ. VII 311 පිට. (හේ.මු.)
19. ඉති. ඛු.නි. I 374 පිට (බු.ජ. 24)

# වෙනත් කෘති

1. Concept and Reality in Early Buddhist Thought - (1971)*
2. Samyutta Nikaya - An Anthology, Part II - Wheel No. 183/185 - (1972)*
3. Ideal Solitude - Wheel No, 188 - (1973)*
4. The Magic of the Mind - (1974)*
5. උත්තරීතර හුදෙකලාව - 'දම්සක්' අංක 172/173 - (1990)*
   -එම- (නව මුද්‍රණය), ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය (2001)
6. Towards Calm and Insight - (1991)
7. විදසුන් උපදෙස් - (1996)
8. නිවනේ නිවීම - (1997 - .........)
   -ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය, මහා භාරකාර දෙපාර්තමේන්තුව
   (වෙළුම් 9 ක් මේ දක්වා නිකුත්වී ඇත. සම්පූර්ණ පොත වෙළුම් 11 කි.)
9. From Topsy - turvydom to Wisdom - Volume 1 - (1998)
   (Essays written for 'Beyond the Net, - A website on the Internet
   -Website address http://www.beyondthenet.net
10. පහන් කණුව ධර්ම දේශනා - 1 - වෙළුම - (1999)
11. Seeing Through - (1999)
12. හිතක මහිම - 1 - (1999)
13. නිවනේ නිවීම - ප්‍රථමභාගය - (1-6 වෙළුම්) - පුස්තකාල මුද්‍රණය (2000)
14. හිත තැනීම - (2000)
15. පහන් කණුව ධර්ම දේශනා - 2 වෙළුම - (2000)
16. Towards A Better World - Translation of 'Lo-wada-Sangarava' - (2000)
17. පැවැත්ම හා නැවැත්ම - (2000)
18. ඇති හැටි දැක්ම - (2001)
19. පහන් කණුව ධර්ම දේශනා - 3 වෙළුම - (2001)
20. දිවි කතරේ සැඳෑ අඳුර - (2001)
21. කය අනුව ගිය සිහිය - (2001)

* Buddhist Publication Society, P. O. Box 61, Kandy.
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ. පෙ. 61, මහනුවර